
# රණවිරුවා

2025 ජනවාරි • 272 කලාපය

වැතිර සයනයෙ නිදන නිහඬව එදා විකුමන් පෑව අවි දැරූ
සතර කොන මව්බිමේ රැකඳුන් රටට ණය නැති පුතුනි රණවිරු
උතුර ජයගෙන ඉහළ එසවූ සිංහ ධජයේ සෙවණ ඇතිතුරු
අතැර නොම යන මිතුරු කැල වෙති නුඹට සුව සැප පතන නිරතුරු

- ලුතිනන් කර්නල් [illegible] චමින්ද [illegible]


ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

# යුද්ධ හමුදාධිපති අග්‍රාමාත්‍යතුමිය හමුවෙයි



නව ධුරයේ රාජකාරි භාරගත් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී 2025 ජනවාරි මස 16 වන දින කොළඹ පිහිටි අග්‍රාමාත්‍ය කාර්යාලයේ දී අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය හමුවිය.

මෙම සුහද හමුවේදී යුද්ධ හමුදාධිපතිගේ නව පත්වීම වෙනුවෙන් අග්‍රාමාත්‍ය තුමිය සිය සුබ පැතුම් එක්කළාය. එහිදී, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සහ මව්බිමේ අභිවෘද්ධිය උදෙසා යුද්ධ හමුදාවේ සහයෝගය ලබාදීමට කැපවී කටයුතු කරන බව යුද්ධ හමුදාධිපති විසින් ද දන්වා සිටින ලදී. මෙම හමුව සමාප්තියේ දී, යුද්ධ හමුදාධිපති විසින් අග්‍රාමාත්‍ය තුමිය වෙත සමරු තිළිණයක් ද ප්‍රදානය කළේය.

# යුද්ධ හමුදාධිපති ආරක්ෂක ප්‍රධානීන් හමුවෙති

නව ධුරයේ රාජකාරි භාරගත් යුද්ධ හමුදාධිපති 2025 ජනවාරි මස 02 දින නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය කාර්යාලයේ දී නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය මේජර් ජෙනරාල් කේපීජී ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

මෙම හමුවේ දී ජාතික ආරක්ෂාව, ආරක්ෂක සහයෝගීතාව සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අනාගත අභිවෘද්ධිය කෙරෙහි අවධානය යොමුකරමින් අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන කරුණු පිළිබඳ සාකච්ඡා කරනු ලැබූහ. එසේම, නැගී එන ආරක්ෂක අභියෝගවලට ඵලදායී ලෙස මුහුණ දීම සඳහා අන්තර් ආයතන සමග පවතින සහයෝගීතාවය ශක්තිමත් කිරීමේ සහ ක්‍රියාන්විත සඳහා පවතින සූදානම තවදුරටත් වැඩිදියුණු කිරීමේ වැදගත්කම පිළිබඳව ද එහිදී අවධාරණය කෙරිණි.



යුද්ධ හමුදාධිපතිතුමන් ඉකුත් ජනවාරි මස 08 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ දී ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩියූ (චීනය), පීඑස්සී ද හමුවිය.

අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් කරුණු රැසක් පිළිබඳව එහිදීද අදහස් හුවමාරු කරගත් අතර, එම සුහද හමුව අවසානයේ දී දෙදෙනා අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුවිය.






# නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය තුමන් යුද්ධ හමුදා රෝහලේ සංචාරයක

නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය මේජර් ජෙනරාල් කේපීජ් ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඵස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ජනවාරි මස 16 වන දින කොළඹ යුද්ධ හමුදා රෝහලේ සංචාරයක නිරත විය. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්ඵස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී සහ රෝහල් බලධාරීන්ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය තුමන් එම රෝහලේ වාට්ටු කිහිපයක් සහ අනෙකුත් පහසුකම් පිළිබඳ නිරීක්ෂණය කළ අතර, එහිදී රෝහල් අධ්‍යක්ෂ විසින් සිදුකළ දැනුවත් කිරීමේ හමුවකට ද සහභාගී විය.

සිය සංචාරයේ දී යුද්ධ හමුදා රෝහල තුළින් ඉටුවන විශිෂ්ට සේවාව ඇගයූ නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමන් දූෂණයෙන් තොර දේශපාලන සංස්කෘතියක අවශ්‍යතාවය පිළිබඳ සිහිපත් කළේය. එමෙන්ම, සියලු පුරවැසියන්ගේ දෛනික ජීවිත වලට අහිතකර බලපෑම් ඇතිවීමට හේතු වී තිබෙන මෙම සමාජීය හා ආර්ථික අර්බුදයෙන් රට ගොඩගැනීමට නම් නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද එතුමන් අවධාරණය කළ අතර, එකී අරමුණු මුදුන් පමුණුවාගැනීම සඳහා රජය වෙතින් "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන හඳුන්වා දී තිබෙන බවද වැඩිදුරටත් සඳහන් කළේය. පසුව, නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමන් යුද්ධ හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්, රෝහල් කාර්ය මණ්ඩලය සහ රෝහල වෙත පැමිණ සිටි පිරිස් සමග සුහද පිළිසඳරක ද නිරත වූහ.












# සුභ මොහොතින් නව වසරේ වැඩ ඇරඹේ



2025

2025 වර්ෂයේ පළමු රාජකාරී දිනය නිමිත්තෙන් වූ සාම්ප්‍රදායානුකූල උත්සවය ඉකුත් ජනවාරි මස 01 වන දින උදෑසන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියු පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේ දී පැවැත්විණ. එහිදී, යුද්ධ හමුදාධිපති සමගින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු ජාතික ධජය සහ යුද්ධ හමුදා ධජය ඔසවනු ලැබූ අතර, සියලු නිලයන් විසින් ජාතික ගීය සහ යුද්ධ හමුදා ගීය ගායන කරනු ලැබූහ. තවද, දිවිපිදූ වීරෝදාර රණවිරුවන් සිහිපත් කිරීම ද විධායක ජෙනරාල් විසින් රාජ්‍ය ප්‍රතිඥාව කියවීම ද සිදුකරන ලදී.

අනතුරුව, යුද්ධ හමුදාධිපති හමුවේ හටපිරිස් ආමන්ත්‍රණය කරමින් රණවිරුවන්ගේ කැපකිරීම්, යුද්ධ හමුදාවේ විනය නිරන්තරව පවත්වා ගැනීම සහ නවීකරණයේ වැදගත්කම පිළිබඳව සිහිපත් කළේය. එසේම, අඛණ්ඩ ජාතික සංවර්ධනයේ වටිනාකම ද පෙන්වා දෙමින් සමාජ ආකල්ප, විනය සහ ඵලදායිතාවයේ ධනාත්මක වෙනසක් සඳහා වූ ජාතික සැලැස්මක් වන *'Clean Sri Lanka'* වැඩසටහන ආරම්භ කිරීමට පූර්ණ සහයෝගය දැක්වීමේ අවශ්‍යතාවය ද මෙහිදී වැඩිදුරටත් අවධාරණය කළේය. උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපතිතුමන් සියලු නිල තේ පැන් සංග්‍රහයකට සහභාගී වෙමින් ඔවුන් සමගින් සුහද පිළිසඳරක ද නිරතවූහ. අනතුරුව, නව වසරේ රාජකාරී ආරම්භ කිරීමට ප්‍රථම ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති ආචාර්ය කිරින්දේ අස්සජි නාහිමිපාණන්ගේ මූලිකත්වයෙන් ආගමික වතාවත් පැවැත්වීමේ අවස්ථාවට ද යුද්ධ හමුදාධිපති සහභාගී වූ අතර, ඊට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්දිනී දිසානායක මහත්මිය ද එක්වූහ.

# "මිහිඳු සෙත් මැඳුර" සුවතා නිකේතනයේ සංචාරයක



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මිය 2025 ජනවාරි මස 07 වන දින අත්තිඩියේ පිහිටි මිහිඳු සෙත් මැඳුර සුවතා නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීමේ සංචාරයක නිරත වූහ.

එහිදී, එම දෙපල රණක්ෂිතයට පත්ව ප්‍රතිකාර ලබන රණවිරුවන් සමඟ මෙන්ම එම කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයන් සමඟ සුහද කතාබහක නිරත වෙමින් ඔවුන් හා තේපැන් සංග්‍රහයකට ද එක් වූහ. විජයබාහු පාබල රෙජිමේන්තුවේ සැරයන් ගලගෙදර එච්එම්ඩබ්ලිව්බී ආර්එස්පී විසින් නිර්මාණය කරනු ලැබූ විශේෂ කලා කෘතියක් ද එහිදී යුද්ධ හමුදාධිපති වෙත පිළිගැන්වීමට කටයුතු කෙරිණ.







# ශ්‍රී දළඳා සමිඳුන්ගේ ආශීර්වාද ලැබ



අභිනව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයු පීඑස්සී අයිජී සිය ධූරයේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජනවාරි මස 04 වන දින ප්‍රථම වරට ශ්‍රී දළදා මාලිගාව වැඳපුදාගනු ලැබීය. එහිදී, දියවඩන නිලමේ නිලංග දැල බණ්ඩාර මහතා විසින් යුද්ධ හමුදාධිපති වෙත සමන්පිච්ච මල් වට්ටියක් පිළිගන්වමින් දළදා මාලිගා පරිශ්‍රයේ දී එතුමන් පිළිගනු ලැබීය. අනතුරුව, ශ්‍රී දළදා මාලිගාවේ නිලධාරීන් සමඟින් යුද්ධ හමුදාධිපති දන්ත ධාතූන් වහන්සේ වැඳපුදා ගන්නට ද එක්වූහ. සිය සංචාරයේ දී එතුමන් මල්වතු පාර්ශ්වයේ මහනායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල මහනාහිමියන් බැහැදැක ආශිර්වාද ලබාගන්නට ද අමතක නොකළේය.

එසේම, අස්ගිරි මහා විහාරයේ දී සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඥානරතන නාහිමිපාණන් ද බැහැදුටු යුද්ධ හමුදාධිපති සහ සේවා වනිතා සභාපතිනිය ආශිර්වාද ලබාගත්හ.





# පමුණුගම ශාන්ත ජෝශප් දේවස්ථානයේදී යුද්ධ හමුදාධිපතිට උපහාර



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී වෙත උපහාර දැක්වීමේ උත්සවයක් 2025 ජනවාරි මස 12 වන දින පමුණුගම ශාන්ත ජෝශප් දේවස්ථානයේ දී පැවැත්විණි. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මිය ද සහභාගී වූවාය.



එහිදී, ශුද්ධ වූ දිව්‍ය පූජා යාගයකින් එම උපහාර වැඩසටහන ඇරඹි අතර, ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ ලේකම් සහයක රදගුරු පේඩි ඇන්තනි රදගුරුතුමන් ඇතුළු අනිකුත් පූජකවරුන් විසින් ප්‍රධාන අමුත්තාව උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. පසුව, දේවගැති ගරු අමිල් ගෝමස් පියතුමාගේ පිළිගැනීමේ කථාව සහ සාම්ප්‍රදායික පොල් තෙල් පහන දැල්වීමේ කටයුතු ද සිදුකෙරිණ. අනතුරුව, යුද්ධ හමුදාධිපතිට ආශිර්වාද එක්කරමින්, එතුමන්ගේ සහෝදරයා වන ගරු රෝහිත රොඩ්‍රිගෝ පියතුමා ඇතුළු අනෙකුත් පූජකවරු විසින් ශුද්ධ වූ දිව්‍ය පූජාව පවත්වනු ලැබූහ.



එම කටයුතුවලින් අනතුරුව, යුද්ධ හමුදාධිපතිතුමන් සියලුදෙනා අමතමින්, තම උපන් ප්‍රදේශයේ ජනතාව විසින් පිරිනමන ලද ගෞරවය වෙනුවෙන් ඔවුනට සිය කෘතඥතාව පුද කළේය. තවද, එතුමන් සිය ළමා කාලය සිහිපත් කරමින් සිය පවුලේ සාමාජිකයන්, පමුණුගම ගොන්සාල්වේස් විද්‍යාලය සහ පල්ලිය එතුමන්ගේ යහපැවැත්ම සහ ජයග්‍රහණ සඳහා හැඩගැස්වීමට ඉටු කළ සේවය ද ඉස්මතු කළේය.



මෙම අවස්ථාව සඳහා පූජක පක්ෂය, ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයන්, පමුණුගම ගොන්සාල්වේස් විද්‍යාලයේ විදුහල්පතිනි සමිතා ද සිල්වා මහත්මිය, එම විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් සහ ප්‍රදේශවාසීහු ඇතුළු විශාල පිරිසක් ද සහභාගී වූහ.





# තෛපොංගල් සැමරුමට යුද්ධ හමුදාධිපති ද එක්වේ





ඉකුත් ජනවාරි මස 14 වන දිනට යෙදුණු තෛපොංගල් දිනයට සමගාමීව කොළඹ 06, මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මාන් කෝවිලේ පැවති විශේෂ තෛපොංගල් පූජාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනි දිසානායක මහත්මිය සහභාගී වූහ.

එම කෝවිලේ ප්‍රධාන කුරුක්කල් සිවශ්‍රී රාගවන්ගේ නායකත්වයෙන් යුත් හින්දු පූජකවරුන් පිරිසක් විසින් එහිදී පූජාව පැවැත්වූ අතර, පසුව යුද්ධ හමුදාධිපති එම පරිශ්‍රයේ පැවති සාම්ප්‍රදායික පොංගල් බත සෑදීමේ උත්සවයට ද සහභාගී විය. මෙම විශේෂ දිනය සැමරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදා හින්දු සංගමයේ සභාපති ගේ උපදෙස් මත එම සංගමය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

# යුද්ධ හමුදාධිපති ගංගාරාම විහාරස්ථානයේ ආශිර්වාද ලැබ



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සමගින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මිය සිය ධූරයන්හි රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජනවාරි මස 19 වන දින ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති අති පූජ්‍ය ආචාර්ය කිරින්දේ අස්සජි නායක හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබාගත්හ.

# කාදිනල් හිමිපාණන්ගේ ආශිර්වාද ලැබ

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ඉකුත් ජනවාරි මස 11 වන දින කොළඹ අගරදගුරු මැදුරේදී අගරදගුරු අති උතුම් ආචාර්ය මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබාගත්තේය. මෙම අවස්ථාවට යුද්ධ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනි දිසානායක මහත්මිය ද එක්වූවාය.



# දිවිපිදූ සිංහ විරුවන් සැමරේ



මව්බිම වෙනුවෙන් දිවිපිදූ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කිරීම වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන රණවිරු අනුස්මරණ උත්සවය ඉකුත් දෙසැම්බර් මස 28 සහ 29 යන දෙදින තුළ එම දිවංගත රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ.

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයේදී දිවිපිදූ එම රණවිරුවන් අනුස්මරණය කරමින් රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියස දී පුෂ්පෝපහාර පුදකරනු ලැබීය. මීට සමගාමීව, වරකාපොළ ප්‍රදේශයේ පිහිටි කතෝලික, හින්දු සහ ඉස්ලාමීය ආගමික ස්ථානයන් හිදී සර්ව ආගමික වතාවත් ද කඳවුරු පරිශ්‍රයේ දී සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් ද පවත්වා මව්බිම වෙනුවෙන් දිවිපිදූ එම වීරෝදාර රණවිරුවන්ට පිං අනුමෝදන් කර දානමය පිංකමක් ද සිදුකෙරිණ.





# නව නිල ලැබූවන්ට යුද්ධ හමුදාධිපතිගෙන් සුබපැතුම්



මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීහු පිරිසක් පසුගිය ජනවාරි මස 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී හමුවූහ. මේජර් ජෙනරාල් ඒඑම්සීපී විජයරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්පීඑස් පීඑස්සී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එම්පීඩබ්ලිව්ඩබ්ලිව්බීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් ඒඑච්ජ්ඩී ආරියසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී පීටීඑස්සී, මේජර් ජෙනරාල් පීඑස් සුභාත් සංජීව ආර්එස්පී එන්පීඑස් පීඑස්සී, මේජර් ජෙනරාල් එම්ජේආර්එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී, මේජර් ජෙනරාල් එම්එන් ප්‍රනාන්දු ආර්එස්පී, මේජර් ජෙනරාල් එච්ඩීඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, මේජර් ජෙනරාල් එච්පීඅයි පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ජ්ආර්සී විජේසූරිය ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, මේජර් ජෙනරාල් එල්සීකේ පතිරණ ආර්එස්පී එච්ඩීඑම්සී අයිජී, මේජර් ජෙනරාල් කේඑම්එන් කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, මේජර් ජෙනරාල් එම්කේඑල්ජ් ද සිල්වා ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී, මේජර් ජෙනරාල් ටීඑන් මජීඩ් ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිඑස්සී, මේජර් ජෙනරාල් ටීසීඑම්ජීඑස්ටී කුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජ්යූඑස් වනසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්එන් විජේකෝන් එන්ඩීසී ඒජ්ටීඕ සහ මේජර් ජෙනරාල් සී කළුතරආරච්චි එසේ යුද්ධ හමුදාධිපති හමුවූ නිලධාරීහු වෙති. යුද්ධ හමුදාධිපතිතුමන් එහිදී උසස්වීම් ලද එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත මේජර් ජෙනරාල් නිලයට හිමි අසිපත පිරිනමමින් ඔවුන් වෙත සිය සුබපැතුම් පිරිනැමීය.

## යුද්ධ හමුදාධිපතිතුමන්ගේ ඡායාරූපයක් නිරාවරණය කෙරේ

උසස් ආරක්ෂක අධ්‍යයන අංශයේ ප්‍රමුඛතම ස්ථානයක් හිමි සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ "පවුරේ කීර්තිය" (Wall of Fame) වෙත ඇතුළත් කරන කීර්තිමත් පුද්ගලයින්ගේ ඡායාරූප ගොන්නට එක්කළ වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී ගේ ඡායාරූපයක් ද එතුමන්ගේ සුරතින් පසුගියදා නිරාවරණය කෙරිණ.



ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ගෞරවනීය ඇරයුමෙන් එහි සපැමිණි යුද්ධ හමුදාධිපති එම කටයුත්තෙන් අනතුරුව එම විද්‍යාලයේ පවත්වනු ලබන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාඨමාලා අංක - 19 සඳහා සහභාගී වූ නිලධාරීන් ආමන්ත්‍රණය කිරීමට ද කටයුතු කළේය. එම අවස්ථාව සඳහා දේශීය හමුදා නිලධාරීන් 125 දෙනෙක් සහ විදේශීය හමුදා නිලධාරීන් 26 දෙනෙක් සහභාගි වූහ. එහිදී, යුද්ධ හමුදාධිපති සිය අත්දැකීම් එම නිලධාරීන් සමඟ බෙදාගත් අතර, ඔවුන් දිරිමත් කරමින් වෘත්තීය හමුදා අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළේය. ඉන් අනතුරුව පැවති සුහද තේ පැන් සංග්‍රහයකට ද සහභාගි වූ හෙතෙම එම විද්‍යාලයේ පාඨමාලා සඳහා සහභාගිවූවන් සමගින් සුහද පිළිසඳරක ද නිරතවූහ.





# සංචාරයක සටහන්

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඑම්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී 2025 ජනවාරි මස 03 වන දින 55 වන පාබල සේනාංකයේ සිය ප්‍රථම නිල සංචාරය සිදුකරනු ලැබීය. සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම මධ්‍යයේ සපැමිණි ආඥාපති එහි භටපිරිස් අමතන්නට ද කටයුතු කළේය. තවද, කිලිනොච්චි රණවිරු ස්මාරකය හා සිමික් උද්‍යානය ඇතුළු 551 වන පාබල බලසේනා බලප්‍රදේශය ද ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය. මෙම සංචාරය අතරතුර දී ආරක්ෂක සේනා මූලස්ථානය මගින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන නිවාස ව්‍යාපෘතියේ කොටසක් වන පුනරීන් සහ පල්ලිකුඩා ප්‍රදේශයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් නිවාසලාභී පවුලේ සාමාජිකයින් වෙත පිරිනැමීම ද සිදුවිය. 552 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ අධීක්ෂණය මත 22 විජයබාහු පාබල රෙජිමේන්තු භටපිරිස් මෙම නිවස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය සැපයූහ.



## මනස නිවන්නට සංගීත වැඩසටහනක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ, "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනට සමගාමීව 2025 ජනවාරි මස 21 වන දින "Rendezvous" ක්‍රීඩා පිටියේ දී මනෝචිකිත්සමය සංගීත වැඩසටහනක් පවත්වන ලදී.





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සියලු නිලයන් වෙනුවෙන් සංවිධානය කරන ලද මෙම විශේෂ වැඩසටහන මගින් ඔවුන්ට පුද්ගලික සහ සාමූහික කටයුතු සාර්ථකව සිදුකිරීමට මෙන්ම තම සිතීමේ හැකියාවන් නව මගකට යොමු කිරීමට ද අවස්ථාවක් ලැබුණි. කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ කථිකාචාර්යවරයකු වන බෞද්ධ මනෝචිකිත්සාව පිළිබඳ විශේෂඥ ආචාර්ය වසන්ත ප්‍රියදර්ශන විසින් මෙම වැඩසටහන මෙහෙයවනු ලැබීය.





# ස්වේච්ඡා බලසේනාවේ නිලධාරීන් වෙනුවෙන් මූල්‍ය ප්‍රදානයන්







මාණ්ඩලික නිලධාරි පාඨමාලාවන් හදාරනු ලබන ස්වේච්ඡා බලසේනා නිලධාරීන් වෙත මූල්‍යාධාර පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 10 වන දින එම බලසේනා මූලස්ථානයේදී පැවැත්විණ. බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී එම අවස්ථාවට ප්‍රධානත්වය දැරුවේය.

එහිදී, නිලධාරීන් 11 දෙනකු වෙත සංකේතාත්මකව රු. 50,000.00 බැගින් වූ මූල්‍ය ප්‍රදානයන් පිරිනමනු ලැබීය. 2025 අධ්‍යයන වර්ෂය සඳහා අණ හා මාණ්ඩලික නිලධාරි පාඨමාලාව සහ හටකාර්ය සම්පාදක මාණ්ඩලික නිලධාරි පාඨමාලාව යන පාඨමාලාවන් හැදෑරීමට සුදුසුකම් ලත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නිලධාරීන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය.

# විරු දිරියෙන් නව සෙවණක්






52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මඟපෙන්වීම හා අධීක්ෂණය මත 4 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ නව නිවසක් ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුලක් වෙත භාරදීම ඉකුත් ජනවාරි මස 06 වන දින සිදුකෙරිණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ සුරතින් මෙම නිවස නිවාස ලාභියා හට ප්‍රදානය කෙරුණු අතර, මේජර් ජෙනරාල් රවි රත්නසිංහම් (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණය මත Wanni Aid Canada සංවිධානය හරහා ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙසෙන ජුනේෂ් සහ සාමි සින්නයියා යන මහත්වරු මෙම නිවස ඉදිකිරීම සඳහා මූල්‍ය දායකත්වය ලබාදුන්හ.

# දිරිය දූ පුතුන්ට ඉගෙනුමට අත්වැලක්





59 වන පාබල සේනාංකය, ශ්‍රී ලංකා නිපෝන් අධ්‍යාපනික හා සංස්කෘතික මධ්‍යස්ථානය සමග එක්ව මුලතිව් දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී සිසු සිසුවියන්ගේ අධ්‍යාපනයට සහයවීම අරමුණු කරගනිමින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ සහ අත්‍යවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් 6 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු මූලස්ථානයේ දී ඉකුත් ජනවාරි මස 12 වන දින පවත්වන ලදී.

වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මහලේකම් පූජ්‍ය මීගහතැන්නේ චන්ද්‍රසිරි හිමියන් ද එක්වූහ. 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මඟපෙන්වීම යටතේ 593 වන පාබල බලසේනාවේ බලසේනාධිපති සහ 6 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් කේඑන්සී ද සිල්වා මෙම වැඩසටහන අධීක්‍ෂණය කරනු ලැබූහ. එහිදී, මුලතිව් ප්‍රදේශයේ සුවිශේෂී අධ්‍යාපන කුසලතාවයන් දැක්වූවන් අගය කරමින් සිසු සිසුවියන් 40 දෙනකු සඳහා මාසිකව ශිෂ්‍යත්ව ද ප්‍රදානය කරන ලද අතර, ඉදිරි වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් පොත්පත් සහ පාසල් සපත්තු සඳහා වවුචර්පත් ද ඔවුනට පිරිනැමීය. මෙම වැඩසටහනේ අරමුණ වූයේ සිසු සිසුවියන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම සහ ඔවුන්ගේ පවුල් මුහුණදෙන මූල්‍යමය අපහසුතාවයන් අවම කිරීම සඳහා සහයෝගයක් ලබාදීමය.

# ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක ධූරය භාරදෙයි



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී සිය ධූරයේ රාජකාරී භාරගැනීමත් සමගම ඉකුත් ජනවාරි මස 02 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී වෙත ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක ධූරයේ රාජකාරී කටයුතු නිල වශයෙන් භාරදෙනු ලැබීය. එම සුවිශේෂී අවස්ථාව සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපති විසින් නව කර්නල් සේනාවිධායක වෙත සංකේතාත්මකව යෂ්ටිය භාරදුන් අවස්ථාව.

# කොළඹ යුද්ධ හමුදා රෝහලේ තතු සොයාබලමින්

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්එස්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී, 2025 ජනවාරි මස 10 වන දින කොළඹ, යුද්ධ හමුදා රෝහලේ සංචාරයක නිරත විය.





යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්යූඩී විජේරත්න, යුද්ධ හමුදා රෝහලේ කළමනාකරණ නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්එම්ජේබී රත්නායක ආර්එස්පී සහ කොළඹ යුද්ධ හමුදා රෝහලේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්එම්එම් මොණරාගල යූඑස්පී ඇතුළු අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් එහිදී එතුමන්ව උණුසුම් ලෙස පිළිගනු ලැබූහ.

මෙම සංචාරයේ දී, යුද්ධ හමුදාධිපති තුමන් රෝහලේ කටයුතු සහ අනාගත සංවර්ධන සැලසුම් පිළිබඳව සාකච්ඡා කරමින් සේවයේ නියුතු සහ විශ්‍රාමික රණවිරුවන්ට මෙන්ම ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට ඉහළම මට්ටමේ  ප්‍රතිකාර සැපයීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළේය. ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් සැපයීමේදී එක්ව කටයුතු කිරීම සහ කාර්යක්ෂමතාවයේ වැදගත්කම ද පෙන්වා දෙමින් හෙතෙම රෝහල් කාර්ය මණ්ඩලයේ කැපවීම සහ වෘත්තීයභාවය පිළිබඳව සිය කෘතවේදීත්වය පලකළේය.

එහිදී, එතුමන් අංක 05, 09, 14, 15, 17 වාට්ටු සංකීර්ණ, බාහිර රෝගී අංශය, ඖෂධ නිකුත් කිරීමේ ස්ථානය, රෝහල් සලාක ගබඩාව, ආපනශාලාව, රජකහල, දේශීය මිලදී ගැනීමේ අංශය ඇතුළු රෝහලේ එක් එක් පරිශ්‍ර නිරීක්ෂණය කළ අතර, ප්‍රතිකාර කටයුතු සහ ජෛව වෛද්‍ය වැඩසටහන් සඳහා පහසුකම් පුළුල් කිරීම වෙනුවෙන් ඉදිකරමින් පවතින මහල් 15 කින් යුත් ගොඩනැගිල්ල ද නිරීක්ෂණය කළේය. පසුව, යුද්ධ හමුදාධිපති තේ පැන් සංග්‍රහයකට ද සහභාගී වූ අතර, එහිදී එතුමන් රෝහලේ සියලු නිලයන් සමගින් සුහදව අදහස් හුවමාරු කර ගැනීමට ද අමතක නොකළේය.





# පොතපත සපයා ඉගෙනුමට අතහිත








නැගෙනහිර ආරක්‍ෂක සේනා බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරු දැරියන් අධ්‍යාපන ලබන මෙත් මහින්ද ප්‍රාථමික විද්‍යාලය සහ පල්ලේගම ප්‍රාථමික විද්‍යාලයන් හි ඉගෙනුම ලබන කුඩා දරු දැරියන් 349 දෙනකු සඳහා පාසල් උපකරණ කට්ටල් බෙදාදීමේ මහගු සමාජ සත්කාරයක් ඉකුත් ජනවාරි මස 05 වන දින සිරිපුර මෙත් මහින්ද ප්‍රාථමික විද්‍යාලයේදී පැවැත්විණි. මෙ සඳහා වන මූල්‍ය දායකත්වය කොළඹ සරණ පදනම සහ දම්රිච් පදනමේ දානපතීහු විසින් සිදු කරනු ලැබූහ. මෙම කටයුත්තෙහි සම්පත් දායකයින් සම්බන්ධීකරණය ආරක්‍ෂක සේනා මූලස්ථානය නැගෙනහිර ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ කාර්යාලය විසින් සිදු කරන ලද අතර. පාසල් උපකරණ බෙදාදීමට සමගාමීව එම පාසල් දරු දැරියන් විසින් ඔවුන්ගේ දක්ෂතා එළිදක්වමින් ඉදිරිපත් කළ නර්තන හා සංගීතමය අංගවලින් වැඩසටහන වඩා විචිත්‍රවත් විය. ඊට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) මේජර් ජෙනරාල් කේවීඑන්පි ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පිඑස්සී සහභාගී විය.

එම මූලස්ථාන ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරි කර්නල් එම්ජ්ජ්ඩබ්ලිව්ආර් ගමගේ මෙම වැඩසටහනේ සියලුම සංවිධාන කටයුතු සිදුකළ අතර 3(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිලධාරි හා 3(සේවා) ශ්‍රී ලංකා කාන්තා බලකායේ අණදෙන නිලධාරිණියගේ අධීක්ෂණය යටතේ එම ඒකක භට පිරිස්වල පොදු දායකත්වයද ඊට හිමිවූහ.

# නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේදී පූජා පිංකමක්



ඉකුත් ජනවාරි මස යෙදුනු දුරුතු පොහොය දිනයට සමගාමීව නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ දී ආගමික වැඩසටහනක් පැවැත්විණ. එහි ආඥාපති ඇතුළු සියලුම නිලයින් සහ සිවිල් සේවක මහතුන් එක්ව පූජ්‍ය නුවන්දෙනියේ ඤාණාලංකාර හිමි කඳවුරු පරිශ්‍රයට වැඩමවා බෝධිපූජාවක් ද සිදුකරනු ලැබූහ.

මියගිය රණවිරුවන් හට පිං අනුමෝදනා කිරීම, රණක්ෂිතයට පත් රණවිරුවන් හට නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීම මෙන්ම ආරක්ෂක සේනා මූලස්ථානයේ රාජකාරීන්හි නියුතු සියලු අයවළුන් සහ ඔවුන්ගේ පවුල්වල සැමට සෙත් පැතීම ද එහි අරමුණ විය.







# මහනුවර, යුද්ධ හමුදා මූලික රෝහලේ සංචාරයක





යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී, ඉකුත් ජනවාරි මස 14 වන දින මහනුවර, යුද්ධ හමුදා මූලික රෝහලේ සංචාරයක නිරත විය. රෝහල් පරිශ්‍රයට සපැමිණි යුද්ධ හමුදාධිපති එම රෝහලේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්එම්පීඩබ්ලිව්ඩබ්ලිව්බීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. එහිදී, නව රෝහල් සංකීර්ණයේ නිරීක්ෂණ කටයුතු සිදුකරමින් මෙහෙයුම් අංශ පරීක්ෂා කර එහි නඩත්තු කටයුතු සිදුකිරීම පිළිබඳව සොයාබැලූ යුද්ධ හමුදාධිපති එහි කාර්ය මණ්ඩලය හා ප්‍රතිකාර ගැනීමට පැමිණි පිරිස් සමඟ සුහද කතාබහක නියැලෙන්නට ද අමතක නොකළේය.

මහනුවර ඉදිකළ මෙම නව යුද්ධ හමුදා රෝහල මඟින් බාහිර රෝගී සත්කාර පහසුකම්, ආබාධිත පුද්ගලයින් සඳහා කෘත්‍රිම හා විකලාංග සේවා, විවිධ රෝග සඳහා සායනික සේවා, දන්ත සත්කාර සේවා, නවීන වෛද්‍ය උපකරණ සහිත අංග සම්පූර්ණ ශල්‍යාගාර සේවා සහ ඖෂධ පහසුකම් ඇතුළු සේවාවන් රැසක් සපයයි. මෙම සේවාවන් යුද්ධ හමුදා සාමාජිකයන්ට, සේවා මුක්ත සාමාජිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට නොමිලේ ලබාගැනීමේ හැකියාව පවතී. මෙම සංචාරය සඳහා 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.



# කිලිනොච්චියේ නත්තල් කැරොල් ගී ප්‍රසංගය






යාපනය ආරක්ෂ සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඑම්ආර් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ උපදෙස් මත 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ගේ අධීක්ෂණයෙන් සංවිධානය කෙරුණු නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් 2024 දෙසැම්බර් මස 26 වන දින කිලිනොච්චි නෙළුම් පියස රඟහලේ දී පැවැත්විණ. යාපනය රදගුරු ආචාර්ය ජස්ටින් බර්නාඩ් ඥානප්‍රගාසම් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට උතුරු පළාත් ආණ්ඩුකාර නාගලිංගම් වේදනාගම් මහතා ද එක්විය. ජාතීන් අතර සමගිය වර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වුණු මෙම උත්සවයේ දී ප්‍රාදේශීය සභා කණ්ඩායම් විසින් කැරොල් ගීත, විචිත්‍රවත් නැටුම් ආදිය ඉදිරිපත් කළහ.

මෙම උත්සවය අතරතුර කුඩා ළමුන් හට තෑගි, රසකැවිලි සහ සෙල්ලම් බඩු ලබා දී ඔවුන් සතුටු කිරීමට ද කටයුතු කෙරිණ. පූජ්‍ය පක්ෂය, යුද, ගුවන් සහ පොලිස් සාමාජිකයින්, අනෙකුත් සිවිල් රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රදේශවාසීහු විශාල පිරිසක් ද ඊට එක්වූහ.

# සෙසුනිලයින් හට නව භට නිවාසයක්





කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපනය කර වසර 13 ක් සපිරීම නිමිත්තෙන් එහි කාර්ය මණ්ඩල සෙසුනිලයින් වෙනුවෙන් එම අධ්‍යක්ෂ මණ්ඩල පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකරන ලද භට නිවාසයක් ඉකුත් ජනවාරි මස 01 වන දින අධ්‍යක්ෂ කෘෂිකර්ම හා පශු සම්පත් බ්‍රිගේඩියර් බීඑන් මදනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණ.

## සහකාර ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක, ලුතිනන් කර්නල් මන්දීප් සිං නේගි, ඉකුත් ජනවාරි මස 16 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවිය. මෙම සුහද හමුවේදී ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සඳහා හමුදාමය සහ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ඉදිරියට ගෙන යාමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කෙරිණ.

## ශ්‍රී ලංකාවේ නවදිල්ලි මියන්මාර තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක හා යුද්ධ හමුදාධිපති අතර හමුවක්





ශ්‍රී ලංකාවේ නවදිල්ලි මියන්මාර තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක බ්‍රිගේඩියර් ජෙනරල් සෑව් මෝල්වින් ඉකුත් ජනවාරි මස 28 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවිය. මෙම හමුවේදී, ජාතියේ අභිවෘද්ධිය උදෙසා යුද්ධ හමුදාව වෙතින් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වෙනුවෙන් ආරක්ෂක උපදේශකතුමන් සිය කෘතඥතාව පුදකළේය. එහිදී, අනාගතයේදී දෙරට අතර පවතින සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කරගැනීමේ වැදගත්කම පිළිබඳ යුද්ධ හමුදාධිපතිතුමන් ද අවධාරණය කරමින් දෙරටෙහි දීර්ඝකාලීන සම්බන්ධතාවයන් පිළිබඳව සිහිපත් කළේය.

## රුසියානු හමුදා දූත පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙති



රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ජාත්‍යන්තර හමුදා සහයෝගීතාව සඳහා වූ ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන මේජර් ජෙනරාල් ඇලෙක්සැන්ඩර් ඉවානොවිච් සින්චෙන්කෝ ඇතුළු දූත පිරිසක් 2025 ජනවාරි මස 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවූහ.

එහිදී, ඔවුනු දෙරට අතර පවත්නා දිගුකාලීන හමුදා සහයෝගිතාවය සහ අවබෝධය පිළිබඳ සුහද සාකච්ඡාවක නිරත වූහ. මෙම හමුව අවසානයේ දී සුහදතාවයේ සංකේතයක් ලෙස සමරු තිළිණ හුවමාරුවක් ද සිදුවිය.

# 75 වසරක අභිමානය සමරන ඉංජිනේරු සේවා බලකාය





ඉංජිනේරු සේවා බලකායේ අභිමානවත් 75 වන සංවත්සරය ඉකුත් ජනවාරි මස 10 වන දින පනාගොඩ ස්ථාපිත එම රෙජිමේන්තු මූලස්ථානයේදී එහි කර්නල් සේනාවිධායක හා 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, ඉංජිනේරු සේවා මූලස්ථානය වෙත සපැමිණි කර්නල් සේනාවිධායක එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එන්ඩබ්ලිව්පීඑස්එම් පෙරේරා විසින් උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව එහි හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල පුදකළ ගෞරවාචාර පිළිගනු ලැබීය. අනතුරුව එතුමන් මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ එම රෙජිමේන්තුවේ වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කරමින් පුෂ්පෝපහාර පුදකිරීමට ද අමතක නොකළේය. ඉන් අනතුරුව සියලු නිල සුහද තේ පැන් සංග්‍රහයන් සඳහාද සහභාගි වූ හෙතෙම උත්සවයේ සුවිශේෂී අවස්ථාවක් වශයෙන් එම රෙජිමේන්තුවේ ප්‍රෞඪ ඉතිහාසය සනිටුහන් කරමින් කේක් කැපීම ද සිදුකරනු ලැබීය.

එහිදී, හටපිරිස් ඇමතූ කර්නල් සේනාවිධායක ඔවුන්ගේ කැප වූ සේවය වෙනුවෙන් සිය කෘතඥතාවය පුදකළේය. ජාතික ආරක්‍ෂාව සඳහා ඉංජිනේරු විශේෂඥතාවයේ අඛණ්ඩ වැදගත්කම පිළිබඳව පෙන්වාදුන් එතුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රියාන්විතයන් සඳහා සහය දැක්වීමේදී එම රෙජිමේන්තුව ඉටුකළ වැදගත් කාර්යභාරය පිළිබඳව ද පෙන්වා දුන්නේය. එසේම, සියලු නිල දිවා භෝජන සංග්‍රයක්ද සංවත්සර වැඩසටහනට එක්ව තිබිණ. මෙම අවස්ථාව සඳහා රෙජිමේන්තුවේ හිටපු කර්නල් සේනාවිධායකවරු, මධ්‍යස්ථාන සේනාවිධායකවරු, ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් වයිකේඑස් රංගික පීඑස්සී පීටීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

## ඡායාරූපකරණ වැඩමුළුවක්





61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ උපදෙස් මත ඉකුත් ජනවාරි මස 21 වන දින සිට 23 වන දින දක්වා එම සේනාංක මූලස්ථානයේ දී ජංගම දුරකථන ඡායාරූපකරණය පිළිබඳ තෙදින වැඩමුළුවක් පැවැත්විය. මෙහි අරමුණ වූයේ හමුදා සාමාජිකයින්ගේ කැපීපෙනෙන ක්‍රියාකාරකම් එළිදැක්වීම සඳහා මාධ්‍යයක් ලෙස ඡායාරූපකරණය කිරීම සහ ඊට සහභාගී වූවන්ගේ නිර්මාණශීලීත්වය, ස්වයං ප්‍රකාශනය සහ කුසලතා සංවර්ධනය වැඩිදියුණු කිරීමයි.

"රූප විරක" සංසදයේ කීර්තිමත් ඡායාරූප ශිල්පීන් වන ප්‍රියන්ත අබේසුන්දර බීඑෆ්ඒ එන්පීඑස් එෆ්එන්පීඑස් සහ සුරේෂ් එස් වීරසිංහ යන මහත්වරු විසින් මෙහෙයවන ලද මෙම වැඩසටහන සඳහා සෙසුනිලයන් 70 දෙනකු සහභාගී වූහ. වැඩමුළුව අතරතුර, ඡායාරූපකරණයේ මූලික කරුණු, උසස් ශිල්පීය ක්‍රම, ප්‍රායෝගික භාවිතය, ආලෝකකරණය හා වර්ණ සැකසීමේ ක්‍රම පිළිබඳව හඳුන්වාදුන් අතර, ප්‍රායෝගික සැසි මඟින් එම පුහුණුකරුවන්ගේ දැනුම යටතේ සහභාගීවූවන්ට සිය හැකියාවන් ප්‍රායෝගිකව අත්හදා බලන්නට ද අවස්ථාව සැලසිණ. වැඩමුළුව අතරතුර ලබාගත් හොඳම ඡායාරූප පහ සඳහා විශේෂ සහතිකපත් ද අනෙකුත් සියලුම සහභාගීවූවන් සඳහා සහභාගීත්ව සහතිකපත් ද ප්‍රදානය කරන ලදී.

# එතෙර මෙහෙයට යන මෙතෙර විරුවන්ගෙන් යුද්ධ හමුදාධිපතිට ගෞරවාචාර





දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය විසින් පවත්වාගෙන යනු ලබන දෙවන මට්ටමේ රෝහලෙහි සාමසාධක රාජකාරි සඳහා පිටත්ව යාමට නියමිත 11 වන වෛද්‍ය කණ්ඩායමට සුබ පැතුම් පිරිණැමීමේ උත්සවයක් වේරහැර ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා රෙජිමේන්තු මූලස්ථානයේදී 2025 ජනවාරි මස 31 වන දින පැවැත්විණ. මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ.දොලගේ යූඑස්පී එන්ඩීසී ගේ ගෞරවනීය පිළිගැනුම් මධ්‍යයේ මෙම අවස්ථාවට ප්‍රධානත්වය දැරූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී වෙත දිවයිනෙන් පිටත්ව යාමට නියමිත එම හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනමනු ලැබූහ.

මෙහිදී, යුද්ධ හමුදාධිපති විසින් සංකේතාත්මකව ජාතික කොඩිය, එක්සත් ජාතීන්ගේ ධජය, යුද්ධ හමුදා ධජය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ ධජය දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා පිටත්ව යන 11 වන වෛද්‍ය කණ්ඩායමේ අණදෙන නිලධාරි වෙත පිරිනමන ලදී. එමගින් ඔවුන් එම මෙහෙයුම සඳහා සූදානම් බවත් එම වගකීම් භාරගැනීමට සූදානම් බවත් පිළිබිඹු කරයි. මෙම කණ්ඩායමට අණදෙන නිලධාරි ලෙස ලුතිනන් කර්නල් ආර්එම්ඩීබී රාජපක්ෂ යූඑස්පී, දෙවන අණදෙන නිලධාරි ලෙස ලුතිනන් කර්නල් කේඩීපී ද ඒ විජේසිංහ සමගින්, යුද්ධ හමුදා නිලධාරීන් 18 දෙනෙක්, නාවික නිලධාරීන් 02 දෙනෙක් සහ සෙසු නිලයින් 46 දෙනෙක් ඇතුළුව යුද්ධ හමුදා සාමාජිකයින් 64 දෙනෙක් ඇතුළත්ය. මෙම අවස්ථාවට නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයන් රැසක් ද සහභාගි වූහ.



# රණවිරු එකමුතුවෙන් නව නිවසක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන සේනාවිධායක සහ බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරගම, වල්ගම ප්‍රදේශයේ පදිංචි එම්. නිලූෂා කුමාරි මෙනෙවිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් වෙනුවෙන් නවතමයෙන් ඉදිකරනු ලැබූ නිවසක් 2025 ජනවාරි මස 22 දින නිල වශයෙන් භාරදීම සිදුකරනු ලැබීය.

14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ සහ 612 පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ භටපිරිස් මෙම නව නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රම දායකත්වය සැපයූහ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය සහ දේශීය පරිත්‍යාගශීලීන් ඊට මූල්‍යමය හා ද්‍රව්‍යමය දායකත්වය සැපයූහ. මෙම උත්සව අවස්ථාවට 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජේඑන්එම්පීකේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් (සහකාර රජයේ නියෝජිත) සහ 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන්, පරිත්‍යාගශීලීන් සහ ප්‍රදේශවාසීහු පිරිසක් ද සහභාගි වූහ.

---



**ජාතික කෘෂි ආර්ථිකයට පණදෙන රණවිරු කැළකගේ එකතුවෙන් සෑදුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය අද වනවිට රට ගොඩනගන හරිත නිෂ්පාදන ක්‍රියාවලියේ පෙරගමන්කරුවන් බවට පත්ව ඇත්තේ යුද්ධ හමුදාව තුළ මෙන්ම රටට ද අත්‍යවශ්‍යම භූමිකාවක් ඉටුකරමිනි.**

# සිව් වසක අභිමානය සැමරූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ 4 වන සංවත්සරය ඉකුත් ජනවාරි මස 04 වන දින අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී අභිමානවත්ව පැවැත්විණ. ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් සැමරූ එම සංවත්සරයේ දී සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් පවත්වා සියලු නිලයන්ට සෙත්පතා පසුදින මහා සංඝරත්නය වෙත හීල් දානය පිළිගැන්වීමේ කටයුතු ද සිදුවිය.

සංවත්සර දින සැමරුම් උළලෙහි සමාරම්භය සනිටුහන් කරමින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී බලකාධිපති වෙත අභිමානවත් සම්මාන පෙළපාලියකින් උත්තමාචාරය ද පුදකරනු ලැබීය. තවද, ගෙවුණු වසර 04 ක කාලසීමාව තුළ ප්‍රථම වතාවට පවත්වනු ලැබූ අන්තර් බළඇණි සරඹ තරගාවලියේ දක්ෂතා දැක්වූ සරඹ කණ්ඩායම් වෙත කුසලාන ප්‍රදානය කිරීමද එහිදී සිදුවිය. එසේම, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් සහ සියලු නිලයින් හට විනෝදාස්වාදයක් ලබාදීම සඳහා පැවැත්වූ සංගීත සැඳෑවක් ද සංවත්සර කටයුතු අතරට එකතුව තිබිණ.



# මව් රෙජිමේන්තුවෙන් බුහුමන්



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවෙන් බිහිවූ සිව්වන යුද්ධ හමුදාධිපති වශයෙන් අභිනවයෙන් ධූරයේ රාජකාරි භාරගත් ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී-එන්ඩීයූ පීඑස්සී අයිජී ඉකුත් ජනවාරි මස 17 වන දින සිය මව් රෙජිමේන්තුවෙන් උපහාර පිරිනැමිණ.

එහිදී, 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ රෙජිමේන්තුව වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියස දී දිවංගත රණවිරුවන් වෙත පුෂ්පෝපහාර පුදකළේය.



ඉන් අනතුරුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ හටපිරිස් විසින් 6 කාරක රෙජිමේන්තු සරඹ භූමියේ දී එතුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල රෙජිමේන්තු පෙළපාලියේ ගෞරවාචාරය පුදකරනු ලැබූහ. 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජ්යූ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී අයිජී ඊට අණදෙනු ලැබීය. පසුව, පැවති සියලු නිල තේ පැන් සංග්‍රහයකට සහභාගී වූ යුද්ධ හමුදාධිපති එම රෙජිමේන්තු හටපිරිස් සමඟ සුහද පිළිසඳරක ද නිරතවූහ. එහිදී විධායක ජෙනරාල් සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී විසින් යුද්ධ හමුදාධිපති වෙත සමරු සිහිවටනයක්ද පිළිගන්වනු ලැබීය.



මෙම අවස්ථාව සඳහා හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් සීඑස් වීරසූරිය (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ අයිජී, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම ඔවුන්ගේ භාර්යාවන් ඇතුලු නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

# ගුවන් සංක්‍රමික පුහුණු පාසලේ සංචාරයක




ගුවන් සංක්‍රමික බලසේනාවේ බලසේනාධිපති ලෙස රාජකාරී භාරගත් බ්‍රිගේඩියර් වයිඑම්එස්සීබී ජයතිලක ආර්එස්පී යූඑස්පී ඉකුත් දෙසැම්බර් මස 26 වන දින එම පුහුණු පාසලේ නිල සංචාරයක නිරත විය. එහි වැඩබලන සේනාවිධායක මේජර් එච්එම්ටීඑච් ලක්මාල් ගේ උණුසුම් පිළිගැනුම මධ්‍යයේ සපැමිණි නව බලසේනාධිපති වෙත කඳවුරු ආරක්ෂක මුරයක් ද පිරිනැමිණි. අනතුරුව එම පුහුණු පාසලේ ක්‍රියාන්විත ප්‍රදර්ශනයකට ද එක් වූ හෙතෙම එහි කාර්ය මණ්ඩලය හා පාඨමාලා සාමාජිකයින් ඇමතීමටද කටයුතු කළේය.

# වැඩිහියන් වෙත රණවිරු සත්කාරයක්




උත්තලපුර සරණ වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් 14 ක් වෙනුවෙන් දිවා ආහාරය ලබාදී ඔවුන්ට අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 01 වන දින සිදුකෙරිණ. තවද, ඊට සමගාමීව මුරුතගස්පිටිය විහාරස්ථානයේ සංඝයා වහන්සේලා 10 දෙනකු උදෙසා දහවල් දානය පූජාකිරීම ද සිදුවිය. 2025 නව වසර උදාවීම සමගාමීව 3(සෙව) බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ඩීජ්එන්සී රූපසිංහ ආර්එස්පී ගේ අදහසකට අනුව සිදුකළ මෙම මාහැඟි කටයුත්තට සඳුන්පුර යුද්ධ හමුදා කඳවුරේ නිලධාරීහු සහ සෙසුනිලයෝ ශ්‍රම දායකත්වය දැක්වූහ.

# තතු සොයා නිරීක්ෂණ සංචාරයක




61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඇතුළු නිලධාරීහු ඉකුත් ජනවාරි මස 06 වන දින 573 වන පාබල බලසේනාවේ නිරීක්ෂණ චාරිකාවක නිරතවූහ. එහිදී, බලසේනාධිපති කර්නල් එස්ඩබ්ලිව්පීඑම්එච්ආර් සේනාධීර ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී විසින් සේනාංකාධිපති උණුසුම් ලෙස පිළිගනු ලැබීය. 2024 ජූලි මස 25 වන දින එම පාබල බලසේනාව පිහිටුවීමෙන් පසු අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ බලසේනාධිපති විසින් සේනාංකාධිපති වෙත පැහැදිලි කළ අතර, බලසේනාවේ නවතමයෙන් ඉදිකරන ලැබූ ප්‍රවේශ දොරටුව, සෙසුනිලයින්ගේ සහ නිලධාරීන්ගේ සනීපාරක්ෂක පද්ධති මෙන්ම නිලධාරී නිවස්න පහසුකම් ද එහිදී සේනාංකාධිපතිගේ නිරීක්ෂණයට බඳුන් විය.

# බන්ධනාගාර ක්‍රියා පිළිවෙත් පිළිබඳ දේශණයක්





වන්නි ආරක්ෂක සේනා ආඥාපතිගේ මඟපෙන්වීම යටතේ එම මූලස්ථාන බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් කේඑම්වී කොඩිතුවක්කු එන්ඩියූ ගේ අධීක්ෂණයෙන් බන්ධනාගාර ක්‍රියාපිළිවෙත් පිළිබඳ වූ දේශණයක් ඉකුත් දෙසැම්බර් මස 24 වන දින එම මූල ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. අනුරාධපුර බන්ධනාගාර අධිකාරී මොහාන් කරුණාරත්න මහතා විසින් මෙහෙය වූ මෙම දේශනයට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, සිරකරුවන් වර්ගීකරණය, ලබාදුන් දඬුවම් ලැබූ සිරකරුවන්ගේ දින චර්යාව, ඔවුන්ගේ අයිතිවාසිකම් මෙන්ම සිර දඬුවම් ලිහිල් කිරීම සහ බලපත්‍ර මත මුදාහැරීම ඇතුළු විවිධ මාතෘකා යටතේ කරුණු ඇතුළත් විය. මෙම දේශනය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) සහ 56 වන පාබල සේනාංකයේ නිලධාරීන්, නිලධාරිනියන් 26 දෙනෙක් සහ සෙසුනිලයෝ 380 ක් පමණ සහභාගි වූ අතර, Zoom තාක්‍ෂණය ඔස්සේ එම බලප්‍රදේශයේ අනෙකුත් භටපිරිස් ද ඊට සම්බන්ධ වූහ.

# දිරිමත් කතුන්ට හරවත් දේශනයක්



වන්නි ආරක්ෂක සේනා ආඥාපති ගේ මඟපෙන්වීමෙන් සංවිධානය කෙරුණු කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දේශනයක් ඉකුත් ජනවාරි මස 15 වන දින එම මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. ඉරට්ටපෙරියකුලම් පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශ භාර නිලධාරිනී සැරයන් ශ්‍රියානි චන්ද්‍රලතා විසින් මෙම දේශනය පවත්වනු ලැබූ අතර, එහිදී කාන්තාවන්ට සේවා ස්ථානයන් හිදී සිදුවන හිංසනයන් වැළැක්වීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා අපයෝජනය තුරන් කිරීම වැනි කරුණු ඔස්සේ දේශනය පෙළගැස්විණි. මෙම අවස්ථාව සඳහා වන්නි ආරක්ෂක සේනා මූලස්ථාන බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන් 15 දෙනෙක් සහ සෙසුනිලයින් 200 ක් පමණ සහභාගී වූහ.

# විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාවක ආරම්භය





1 බලකාය මගින් පවත්වනු ලබන විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලා අංක - 77 ඉකුත් ජනවාරි මස 13 වන දින ආරම්භ විය. මේ සඳහා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 1 ගැමුණු හේවා බළඇණිය, 8 සහ 22 ගජබා රෙජිමේන්තුවට අයත් නිලධාරීන් 04 දෙනෙක් සහ සෙසුනිලයෝ 32 දෙනෙක් සහභාගී වූහ. පාඨමාලාවේ ආරම්භක අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 1 බලකායේ කර්නල් ප්‍රධාන මාණ්ඩලික කර්නල් ආර්ආර්කේ රාජපක්ෂ උඩගේ සහභාගී විය.

## එතෙර දිනූ දිරිය දියණියට විරියක් දී



9 වන ගැමුණු හේවා බලඇණිය යටතේ ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී 1998 සැප්තැම්බර් මස 28 වන දින ත්‍රස්ත ප්‍රහාරයකට ලක්ව රට වෙනුවෙන් දිවිපිදූ සෙ/408397 ලාන්ස් කෝප්‍රල් පෙරේරා එච්ජීඑස් වීරෝදාර රණවිරුවාගේ ආදරණීය දියණිය එච්.කේ. තාරකා සඳරේණු පෙරේරා තම ආදරණීය පියාණන්ගේ අභිමානය ලොවට විදහා පාමින් 2024 නොවැම්බර් මස 30 වන දින ජාත්‍යන්තර පදක්කමකට හිමිකම් කිව්වාය. එහිදී, ඇය තායිලන්තයේ බැංකොක් නුවර පැවති දෙස් විදෙස් වෘත්තීය මට්ටමේ කායවර්ධන ක්‍රීඩිකාවන් සහභාගී වූ ප්‍රෝලීන් තරගාවලියේ සෙන්ටිමීටර් 168 ට වඩා උස කාණ්ඩයේ කාන්තා අංශයේ රිදී පදක්කම හිමිකර ගත්තාය.

ඇයගේ ජයග්‍රහණය වෙනුවෙන් ගැමුණු හේවා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ආචාර්ය දිල්රුක්ෂි විමලරත්න මහත්මිය විසින් ඉකුත් ජනවාරි 05 වන දින එම දියණිය රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත කැඳවා ඇයගේ දස්කම් අගයා ඇයට සමරු තිළිණ ප්‍රදානයක් සිදුකරනු ලැබූහ.

## රණවිරු අභිනන්දන පූජා - 2025



54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්පීආර්ආර්පී රාජපක්ෂ ආර්එස්පී ගේ අදහසකට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයන් හා සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල දූ දරුවන් 500 දෙනකු වෙනුවෙන් රණවිරු අභිනන්දන පූජා 2025 - පාසල් උපකරණ කට්ටල බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 10 වන දින එම සේනාංක මූලස්ථාන පරිශ්‍රයේ දී පැවැත්විණ. මෙම මහඟු කර්තව්‍යය සඳහා කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය මිතුරු කැල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය ආදි ශිෂ්‍ය මිතුරු කැල, අතහිත 2025 ව්‍යාපෘතියෙහි සභාපති ප්‍රසාද් ලොකුබාලසූරිය, සමන් ගුණරත්න සහ සමන්තා විජයවර්ධන යන මහත්ම මහත්මීහු මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදුන්හ. යුද්ධ හමුදා නිලධාරීන්, සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ඇතුළු විශාල පිරිසක් මේ සඳහා සහභාගී වූහ.

## තෛපොංගල් සැමරුමට රණවිරුවන් ද එක්වී





5(සෙව්) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව සහ 10(සෙව්) ගැමුණු හේවා බලඇණියට අයත් භටපිරිස් සමඟින් ප්‍රදේශවාසීන් එකතුව ඉකුත් ජනවාරි මස 14 වන දින යෙදුනු තෛපොංගල් දිනයේදී වෙල්ලන්කුලම් පිල්ලෙයාර් කෝවිලේදී සහ නාගතාලු මුරුගන් කෝවිලේදී දේව දානයක් පිරිනැමූහ. 541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ගේ මඟපෙන්වීම මත සංවිධානය කෙරුණු මෙම වැඩසටහන මඟින් යුද්ධ හමුදාව සහ සිවිල් වැසියන් අතර සුහදත්වය වර්ධනය කිරීම අරමුණ විය.

# නව සභාපතිනිය රාජකාරි අරඹමින්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 17 වන සභාපතිනිය ලෙස ස්වේන්දිනී දිසානායක මහත්මිය 2025 ජනවාරි මස 07 වන දින සුබ මොහොතින් සිය ධුරයේ වැඩභාර ගත්තාය. යුද්ධ හමුදාධිපතිගේ ද සුබපැතුම් මධ්‍යයේ නව සභාපතිනිය රාජකාරි ඇරඹූ එම අවස්ථාවට ඒ ඒ රෙජිමේන්තුවලට අයත් සේවා වනිතා ශාඛා ප්‍රධානීහු රැසක් ද එක්වූහ. එහිදී, පැමිණි පිරිස සමඟ තේපැන් සංග්‍රහයකට ද එක්වූ සභාපතිනිය ඔවුන් හා සුහද කතාබහක ද නිරත වූවාය.

# විරු ගතට වාරුවක්



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට අයත් මේජර් බීඑම්පීසීපී නවරත්න අනපේක්ෂිත රිය අනතුරක් හේතුවෙන් තුවාල ලැබ තුනටියෙන් පහළ ප්‍රදේශය අප්‍රාණිකව පූර්ණ කාලීනව ආබාධිත තත්වයට පත්ව රාගම රණවිරු සෙවණෙහි නේවාසිකව ප්‍රතිකාර ලබයි. ඔහුගේ දෛනික කටයුතු පහසුකර ගැනීම සඳහා විද්‍යුත් රෝද පුටුවක් පිරිනැමීම ඉකුත් ජනවාරි මස 22 වන දින රාගම රණවිරු සෙවණහිදී සිදුකෙරිණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්දිනී දිසානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකළ මෙම කටයුත්තට රාගම රණවිරු සෙවණෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම් කුමාරසිංහ ආර්එස්පී මෙන්ම යුද්ධ හමුදා සේවා වනිතා ඒකක නිලධාරීන් හා නිලධාරිනියන් පිරිසක් ද සහභාගී වූහ.

# සේවා වනිතා සේවාවන්ට අතහිත දෙමින්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සුබසාධන කටයුතු සඳහා දායක වෙමින් ජන අවන්හල් වෙත පිරිනැමීම සඳහා ප්ලාස්ටික් පුටු 100 ක් සහ මේස 10 ක් ද විරු කැකුළු පෙර පාසල්වල අධ්‍යාපනය හදාරන දූ දරුවන් සඳහා පොත් 1500 ක ප්‍රමාණයක් ද ඉකුත් ජනවාරි මස 22 වන දින පිරිනැමිණ. ෆොන්ටෙරා ආයතනය වෙතින් අදාළ පරිත්‍යාග යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනිය වෙත ඇයගේ කාර්යාලයේ දී භාරදෙනු ලැබීය. ෆොන්ටෙරා ආයතනයේ සහකාර අධ්‍යක්ෂ සහ එම ආයතනයේ අනෙකුත් නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.





# විරු කැකුළු දරුවන්ගේ කුසලතා ඇගයේ

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් රණවිරු සුහසාධනය අරමුණු කොටගෙන ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල පෙරපාසල් රැසක් පවත්වාගෙන යනු ලබයි. ඒ අතරින් මැනිංටවුන් පෙරපාසලෙහි වාර්ෂික විවිධ ප්‍රසංගය යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්දිනී දිසානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවති අතර ඊට සමගාමීව අනෙකුත් පෙරපාසල් වන පල්ලේකැලේ, පනාගොඩ, දියතලාව, ඉපලෝගම, මින්නේරිය, අනුරාධපුර සහ ගාල්ල යන විරු කැකුළු පෙරපාසල්හි විවිධ ප්‍රසංග ද පැවැත්විණ. එම පාසල්වල ඉගෙනුම ලබන දරු දැරියන්ගේ ක්‍රියාකාරකම් ඔප්නැංවීමේ අරමුණින් වාර්ෂික මෙම විවිධ ප්‍රසංගය සංවිධානය කරනු ලබයි.







# මනෝවිද්‍යාත්මක උපදේශන වැඩමුළුවක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ අධීක්ෂණය යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි පවත්වාගෙන යනු ලබන විරු කැකුළු පෙර පාසල්වල රාජකාරී නියුතු නිලධාරිනීන් හා පෙර පාසල් ගුරුවරියන් සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන වැඩමුළුවක් පසුගිය ජනවාරි මස 28 වන දින පෙරවරුවේ කොළඹ යුද හමුදා රෝහලේ දී පැවැත්විණ.

එම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්දිනී දිසානායක මහත්මිය, මැනිංටවුන් විරු කැකුළු පෙර පාසල අධීක්ෂණභාර ජ්‍යෙෂ්ඨ සාමාජිකා සුරංගි අමරපාල මහත්මිය ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

මනෝවිද්‍යා උපදේශිකා වෛද්‍ය ඩී.ඩබලිව්. තුල්සරා දිසානායක මහත්මිය විසින් මෙහෙයවන ලද එම හරවත් දේශනය මගින් අනාගත ලෝකය ජය ගන්නට වෙරදරන පුංචි මල් කැකුළුවන් දරුවන් තුළ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම වෙනුවෙන් ගුරුවරියන් හැඩගැස්වීම අරමුණ විය. එසේම, ඔවුන් අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කිරීම, දැනුම යාවත්කාලීන කිරීම හා නව දැනුම බෙදාදීම ද තවත් අරමුණක් විය.

# නිරීක්ෂණ චාරිකාවක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්දිනී දිසානායක මහත්මිය වැඩ භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජනවාරි මස 10 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය යටතේ පාලනය වන ව්‍යාපෘති කිහිපයක නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය.

එහිදී, Seva Vanitha Budget Center වෙළඳසැල් සංකීර්ණය, බේකරිය, ආපනශාලාව, පිරිමි කරණවෑමිහල, කාන්තා රූපලාවණ්‍යාගාරය, Mini Banquet Hall උත්සව ශාලාව, අකුරේගොඩ මැහුම්හල, ආපනශාලාව, සුහසාධක වෙළඳසැල, සන්ෆ්ලවර් විලේජ්-සුහසාධක ආහාර ව්‍යාපෘතිය, කින්නදෙණිය සේවා වනිතා ආපනශාලාව, සුහසාධන වෙළඳසැල ඇය විසින් නිරීක්ෂණය කළාය. එම ස්ථානයන්හි ගොඩනැගිලි නිසි පරිදි නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම, සනීපාරක්ෂාව, කාර්ය මණ්ඩලයේ පිරිසිදුතාවය, ආහාර නිෂ්පාදනය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යයන්හි ප්‍රමිතිය සහ මිල දර්ශන නඩත්තු කිරීම සබැඳිව සොයා බැලූ සභාපතිනිය එහි සේවාවන්හි ගුණාත්මකභාවය සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය වැඩිදියුණු කිරීම පිළිබඳ අදාළ නිලධාරීන් හට උපදෙස් ලබාදෙනු ලැබූවාය.

# නව වසරේදී යුද්ධ හමුදා සේවා වනිතාවෙන් සත්කාර රැසක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 2025 වර්ෂයේ ජනවාරි මස මාසික සභා රැස්වීම ඒකක සභාපතිතුමියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි මස 31 වන දින පස්වරුවේ යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්දිනි දිසානායක මහත්මිය ප්‍රධානත්වය දැරූ මෙම මාසික සභා රැස්වීම සඳහා සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් සේවා වනිතා ශාඛා සභාපතිනියන් හා සේවා වනිතා ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ සහභාගී වූහ. එහිදී, විධායක කමිටුවේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නවක සාමාජිකාවන් පත්කර ගැනීම ද සිදුකෙරිණ.

එම අවස්ථාවේදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිතුමිය සභාව ආමන්ත්‍රණය කරමින් එම ඒකකයේ ඉදිරි සැලසුම් සහ යෝජිත ව්‍යාපෘතීන් පිළිබඳව දැනුම්වත් කරන ලද අතර, ජනාධිපතිතුමාගේ හා වත්මන් රජයේ "Clean Sri Lanka" සංකල්පයට අනුකූලව සියලුදෙනාම කටයුතු කළයුතු බව වැඩිදුරටත් අවධාරණය කළාය. තවද, අනවශ්‍ය වියදම් කපාහැර එම වියදම් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුබසාධන කටයුතු සඳහා පමණක් වැයකරන ලෙස රෙජිමේන්තු සේවා වනිතා ශාඛා ප්‍රධානීන් වෙත උපදෙස් ලබාදුන් ඇය නව සුබසාධන වැඩසටහන් හා වාර්ෂිකව සිදුකරගෙන යනු ලබන ව්‍යාපෘතීන් කාර්යක්‍ෂමව හා ඵලදායී ලෙස පවත්වාගෙන යෑමේ වැදගත්කම ද පෙන්වා දුන්නාය.

අනතුරුව රණවිරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුබසාධනය උදෙසා පරිත්‍යාග කිහිපයක් ද පිරිනමන ලද අතර, ඒ අනුව ශ්‍රී ලංකා සංඥා බලකායේ රාජකාරී නියුතු සෙ/283525 කෝප්‍රල් රාජපක්‍ෂ ආර්පීජේ යන කොනොනිගේ රෝගී තත්වයෙන් පෙළෙන දරුවා හට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා රුපියල් ලක්‍ෂයක (රු:100,000/-) වෛද්‍යාධාරයක් ද, 2 වන ස්වේච්ඡා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ රාජකාරී නියුතු සෙ/ඕ100118 ලාන්ස් කෝප්‍රල් ද සිල්වා යන කොනොනි හට නව නිවසක් ඉදිකර ගැනීම සඳහා මෙතෙක් ගෙවන ලද රුපියල් ලක්‍ෂ හයක (රු:600,000/-) ක මුදලේ දෙවන අදියර වූ රුපියල් ලක්‍ෂ දෙකක (රු:200,000/-) ක මුදල ද පිරිනැමිණ. තවද, රෙජිමේන්තු සේවා වනිතා ශාඛා 24 වෙතින් යුද හමුදා සේවා වනිතා ඒකකය වෙත පරිත්‍යාග කරන ලද රෝද පුටු 24 ක් රණක්ෂිතයට පත් වීරෝදාර රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදීම පිණිස රණසේවා හා පුනරුත්ථාපන අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජීඑස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත භාරදීම ද එහිදී සිදුවිය.



# රණවිරුවන්ට සෙත්පතා පිංකමක්





සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවට අයත් මියගිය හා ආබාධිත රණවිරුවන් හට සෙත්පතා සංවිධානය කළ දහවල් දානමය පිංකමක් ඉකුත් දෙසැම්බර් මස 28 වන දින අම්බලන්ගොඩ පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසයේ දී පැවැත්විණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හංසිකා මහලේකම් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට එහි සාමාජිකාවක වන හේමන්ති යාපා මහත්මිය අනුග්‍රාහකත්වය දැක්වූවාය. මෙම අවස්ථාව සඳහා සේවා වනිතා සාමාජිකාවෝ, නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# ඉගෙනුමට අත්වැලක්





ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශණී යහම්පත් මහත්මියගේ මගපෙන්වීම හා එම ශාඛා සාමාජිකාවන්ගේ සාමූහික එකමුතුවෙන් පාබල හමුදාවේ රාජකාරි නියුතු රණවිරුවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් 50 දෙනකු සඳහා පාසල් උපකරණ කට්ටල පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 28 වන දින එම රෙජිමේන්තු පරිශ්‍රයේ දී පැවැත්විණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති හා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් වයිඒඑම්බී යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහනට ක්‍රස්ට් කන්ටේනර් ලයින් සහ යසෝධා ඉලෙක්ට්‍රිකල් (පුද්ගලික) ආයතන විසින් මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබීය.

# හිත ගත තුටින් පිනවූ පොඩිත්තෝ





යුද්ධ හමුදා පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එච්ජී ස්වර්ණලතා මහත්මියගේ මගපෙන්වීම යටතේ ඉකුත් දෙසැම්බර් මස 24 වන දින වැල්ලවත්තේ පිහිටි ශ්‍රී ජිනානන්ද ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙහි රැකවරණය ලබන දූවා දරුවන් වෙනුවෙන් දිවා ආහාරය හා අත්‍යවශ්‍ය භාණ්ඩ පිරිනැමීමේ වැඩසටහනක් සිදුකෙරිණ. තවද, එහිදී ස්වාමීන් වහන්සේලා දෙනමක් වඩම්මවා එම දරුවන්ට සුමදුර ධර්ම දේශනයක් ශ්‍රවණය කිරීමේ අවස්ථාව ද පුරෝගාමී බලකා කැලිප්සෝ කණ්ඩායම සමඟ දරුවන් හට විනෝදවීමේ අවස්ථාවක් ද සැලසූ අතර, ඊට එම බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් ද එක්වූහ.

# පොත පතෙන් අත හිත





ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනුපමා රත්නායක මහත්මියගේ මගපෙන්වීම යටතේ එම සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 15 වන දින පනාගොඩ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එහිදී 2025 වර්ෂයේ 01 ශ්‍රේණියට ඇතුළත් වන දරුවන් මූලික කරගනිමින් ඔවුනට අවශ්‍ය පාසල් උපකරණ පාර්සල් 384 ක් බෙදාදෙන ලදී.

# දූ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක්





ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව අධ්‍යක්ෂණ ජෙනරාල් පාබල සහ ගැමුණු හේවා රෙජිමේන්තු අධිපතිගේ අධීක්ෂණයෙන් යුතුව එම බලකායේ රාජකාරී නියුතු රණවිරුවන් සහ සිවිල් සේවක මහතුන්ගේ පාසල් අධ්‍යාපනය හදාරනු ලබන දූ දරුවන් 2350 ක් සඳහා ලක්ෂ හතලිහක් වටිනා පාසල් උපකරණ සහ පොත් කට්ටල ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 19 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. එහිදී, සංකේතාත්මකව පාසල් ළමුන් 74 දෙනකු සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කළ අතර, ඉතිරි පොත් කට්ටල 2276 ක ප්‍රමාණය දූ දරුවන් වෙත ලබාදීම සඳහා ඒකක වෙත භාරදීම ද සිදුවිය. තවද, උත්සව අවස්ථාව සඳහා සහභාගි වූ සියලුම අයවලුන් වෙනුවෙන් උදෑසන ආහාරය, තේ පානය සහ දහවල් ආහාරය ලබාදීම ද සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තන් ලෙස ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දිල්රුක්ෂි විමලරත්න මහත්මිය සහ අධ්‍යක්ෂණ ජෙනරාල් පාබල සහ ගැමුණු හේවා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී වූහ.

# දූ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක්




5 වන ශ්‍රී ලංකා පොලිස් හේවා බලකාය, එම බලකා සේවා වනිතා ශාඛාව සමඟ එක්ව සංවිධානය කළ පරිත්‍යාග වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 04 වන දින මහරගම අපේක්ෂා රෝහල් පරිශ්‍රයේ දී පැවැත්විණ. එහිදී, පිළිකා රෝගීන් වෙනුවෙන් ලිඳගල ආනන්ද හිමිපාණන්ගේ අනුග්‍රාහකත්වය මත රුපියල් 490,000.00 ක් පමණ වටිනාකමකින් යුත් වෛද්‍ය ආධාර සහ රුපියල් 300,000.00 ක මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකරනු ලැබිය. තවද, මෙම වැඩසටහන යටතේ පොලිස් හේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරී නියුතු ගර්භණී සෙබළියන් වෙත පෝෂ්‍යදායී දිවා ආහාර වේලක්, පෝෂණ ද්‍රව්‍ය සහ මාතෘ අවශ්‍යතා බෙදාදීමේ වැඩසටහනක් ද පැවැත්විණ. එහිදී, පිළිකා රෝගයෙන් පෙළෙන දරුවන් සිටින ජොෂ්ය කොමිෂන් නොලත් නිලධාරීන් වෙනුවෙන් රුපියල් 100,000.00 බැගින් මූල්‍ය පරිත්‍යාග පිරිනැමීම ද සිදුවිය. මෙම අවස්ථාවට පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනීෂා කොතලාවල මහත්මිය ඇතුළු එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

# සුබ මොහොතින් රාජකාරී අරඹයි



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස සුමංගලී පතිරවිතාන මහත්මිය ඉකුත් ජනවාරි මස 20 වන දින සුබ මොහොතින් රාජකාරී අරඹනු ලැබුවාය. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

# තෑගි බෙදාදීමේ වැඩසටහනක් සහ නත්තල් කැරොල් ගී උත්සවයක්





ස්වාධීන සැපයුම් ගබඩාව, ස්වාධීන ප්‍රවාහන බළගණය සහ යුද්ධ හමුදා සේවා බළකා පාසල එක්ව සංවිධානය කළ තෑගි බෙදාදීමක් සහ නත්තල් කැරොල් ගී වැඩසටහනක් 2024 දෙසැම්බර් මස 22 වන දින මොරටුව සුරස විශේෂ අධ්‍යාපන පාසලේ දී සහ එම බාලිකා නිවාසයේ දී පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මිය ඊට ප්‍රධානත්වය දැරුවාය. සේවා බලකා පාසලේ සේනාවිධායක කර්නල් ජීටීසී මදුරාවල යූඑස්පී කියුඑල්සීඕ සහ ශෂිලා මදුරාවල මහත්මිය, ස්වාධීන ප්‍රවාහන බළගණයේ සේනාවිධායක කර්නල් ඩීකේඑස් නෝල්ටන් සහ දිල්රුක්ෂි ජයසූරිය මහත්මිය, ස්වාධීන සැපයීම් ගබඩාවේ සේනාවිධායක ලුතිනන් කර්නල් එච්එම්ඩබ්ලිව්ආර් හේරත් යන අයගේ සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන පැවැත්විණ.

# රණවිරු සවියෙන් සෙවණක්





යුද්ධ හමුදා 75 වන සංවත්සරයට සමගාමීව සෙ/602775 ලා/කෝ ප්‍රනාන්දු කේඩී යන කොනොනිට අයත් අර්ධ වශයෙන් නිමකර තිබූ නිවසක් සම්පූර්ණයෙන්ම ඉදිකර භාරදීම ඉකුත් දෙසැම්බර් මස 18 වන දින සිදුකෙරිණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා ප්‍රනාන්දු මහත්මියගේ මගපෙන්වීම මත ආඥාපති හකාස අණසක කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එඩ්ඩීඑම්සී එල්එස්සී ඒටීඕ ගේ ප්‍රධාන්තවයෙන් පැවැත්වූ මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ, නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# මාසික සභා රැස්වීමේදී හරවත් දේශනයක්





ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවෙහි 2025 වසරෙහි පළමු මාසික සභා රැස්වීම ඉකුත් ජනවාරි මස 30 වන දින එහි සභාපතිනි අප්සරා පීරිස් මහත්මියගේ ප්‍රධානත්වයෙන් කටුබැද්දෙහි පිහිටි එම රෙජිමේන්තු මූලික වැඩපලේ දී පැවැත්විණ. එහිදී, රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය උදෙසා එම සේවා වනිතා ශාඛාව වෙතින් 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළයුතු සුභසාධන වැඩසටහන් පිළිබඳව මෙන්ම එම ශාඛාව වෙත අරමුදල් උපයා ගැනීම උදෙසා ව්‍යාපෘති සිදුකළ යුතු ආකාරය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණ. එම සභාවාරයට සමගාමීව රණවිරු බිරින්දෑවරු දිරිමත් කිරීමේ දේශනයක් ද සංවිධානය කොට තිබූ අතර, එය යුද හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් ඊජ්ජ් සුජිත් චමින්ද විසින් මෙහෙයවන ලදී. යුදමය කාලසීමාවේදී විරු බිරින්දෑවරුන්ගේ මෙහෙවර පිළිබඳ ආවර්ජණය කරමින් ඔවුන් තුළ අභිමානයත් ඇතිකිරීමත් නව පරපුරේ බිරින්දෑවරු ඒ පිළිබඳව දනුම්වත් කිරීමත් උදෙසා පැවැත්වූ එම දේශනයට නිලධාරීන් හා සෙසුනිලයින්ගේ බිරින්දෑවරු 200කට ආසන්න පිරිසක්ද එම රෙජිමේන්තු බලකාධිපති ද සහභාගී වූහ.

# සුබ මංගලම්



පසුගියදා සුබ මොහොතින් යුගදිවි ඇරඹූ
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී නියුතු
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්පීඑච්එම්
හා
ඉශිනි අයෝද්‍යා ජයසිංහ



පසුගියදා සුබ මොහොතින් යුගදිවි ඇරඹූ
හමුදාධිපති ලේකම් කාර්යාලයේ
රාජකාරී නියුතු
සෙ/286325 ලා/කෝ විමලසේන කේආර්පීඑම්එස්
හා
ශ්‍යාමලී අතාවුද

## සැබෑ වූ සිහිනයේ සුන්දර මතකය...

යුද්ධ හමුදා නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ විවාහ මංගල ඡායාරූප රණවිරුවා හි පළකිරීමට ඉඩකඩ වෙන්කෙරේ. ඔබේ ජීවිතයේ සුන්දරතම දිනයේ මතකය රණවිරුවා පිටු අතරේ චිත්‍රවත් ලෙස පළකරවා ගන්නට මෙය මහඟු අවස්ථාවකි. එබැවින් ඔබගේ මංගල දිනයේදී ලබාගත් වර්ණ සේයාරුවක් විස්තර සමඟින් අපවෙත යොමු කරන්න.

# සුබ උපන් දිනයක්



පස්වන වියට පා තබන
චන්තුල සිතුම් පුතණුවන්ට
සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/368590 බකි I සිඑම්එච් බණ්ඩාර යුඑස්පී)

## සෙනේබර පැතුමක්...

ඔබගේ ආදරණීය සිඟිත්තාගේ උපන් දිනය වෙනුවෙන් වර්ණ සේයාරුවක් රණවිරුවා පිටු අතරේ පළකර ගන්නට මහඟු අවස්ථාවක්. ඔබ කළ යුත්තේ සිඟිති දියණියගේ හෝ පුතණුවන්ගේ සේයාරුවක් යුද්ධ හමුදාවේ සිටින පියාගේ හෝ මවගේ විස්තර ද සහිතව අප වෙත එවීම පමණයි.



තෙවන වියට පා තබන
සිතුනි අවිශා දියණියට
සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/ආර්/101252 ලා/කෝ ශ්‍යාමලා ටී)



හයවන වියට පා තබන
දහම්සා නදිනි දියණියට
සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/372651 සැරයන් සාලිය කුමාර ජේඑම්)



දහවන වියට පා තබන
සතාරා සදෙව්මි දියණියට
සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/318471 කෝප්‍රල් කළුආරච්චි ටීඩීඑස්)



## කාලයේ වැලිතලාවෙන් වැසීගිය

# හෙළයින්ගේ වීරත්වය



▪ රාධිකා සීවල්
*Ambassodor of Education (Spelizes in Translation) Sworn Translator, language Facilitator, Justice of Peare (WI)*

අපට යමකු පිළිබඳ තොරතුරු දැනගැනීමට අවැසි වේනම්, බොහෝවිට ඔහුගේ අසල්වැසියාගෙන් හෝ මිතුරෙකුගෙන් ඔහු පිළිබඳව වඩාත් හොඳින් දැනගත හැකිය. එමෙන්ම ලංකාව නමැති කුටුම්භිකයින්ගේ බොහෝ ඓතිහාසික තොරතුරු අනාදිමත් කලක පටන් බොහෝවිට ආක්‍රමණිකයින් ලෙසත් විටෙක රාජකීය අවාහ විවාහ සබඳතා ඇති ඥාතීන් ලෙසත් ලංකාව හා නිරතුරුව සබඳකම් පැවැත්වූ අසල්වැසියා වූ දක්ෂිණ භාරතීයයන්ගෙන් මනාව දැනගත හැකිය.

දක්ෂිණ භාරතය යනු, නැගෙනහිර බටහිර දකුණ යන තුන්පසෙකින් මුහුදෙන් වටවූ ද, වින්ද්‍යා (Vindhya Range) කඳුවැටියෙන් උතුරින් සීමාවූ භූමි ප්‍රදේශය යි. (ආචාර්ය නටරාජන්. 2023) දක්ෂිණ භාරත භූමිය බලවත් රාජධානි සහ ප්‍රධාන වශයෙන් චෝල, පාණ්ඩ්‍ය සහ චේර යන රාජවංශ තුනක් විසින් ආධිපත්‍යය දරණ ලද අතර, ඒ සෑම වංශයක්ම උක්ත කලාපයේ දේශපාලන ව්‍යුහය සහ සංස්කෘතික අනන්‍යතාවය හැඩගැස්වීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. පසම්තුරන් වූ මෙම වංශිකයින් තිදෙන අතර පැවැති සබඳතා සංකීර්ණ සහ බහුවිධ වූ අතර එය එදිරිවාදිකම් සහයෝගීතාවය සහ සංස්කෘතික හුවමාරු මිශ්‍රණයක් යැයි හැඳින්වීම යෝග්‍ය වේ. මෙම වංශිකයින් දක්ෂිණ භාරත භූමිය බෙදා වෙන්කරගනිමින් පාලනයේ යෙදුනෝය. කලින් කලට එක් එක් රාජ්‍යයන්හි බලවත්වන රාජ වංශිකයින් විසින් තම රාජ්‍ය සීමාවන් පුළුල් කිරීමෙන් මුළු මහත් භූමියේම ආධිපත්‍යය අපේක්ෂා කළ හෙයින් ඔවුහු එකිනෙකාට බොහෝවිට එදිරි වූහ. එක් වංශයක් විසින් දක්ෂිණ භාරතීය භෞමික අඛණ්ඩතාව තහවුරු කරන්නට උත්සහවත් වන බොහෝ අවස්ථාවන්හි අනෙක් වංශිකයින් දෙදෙන එක්ව එම පාලන තන්ත්‍රය බිඳ හෙලීම පිණිස කුමන්ත්‍රණ කිරීම දකුණු ඉන්දිය ඉතිහාසය පුරාවට දැකිය හැකි සුලභ කරුණකි.

මෙම රාජවංශිකයින් තම ස්වෛරියත්වය තවදුරටත් ස්ථාවර කරනු පිණිසත්, තම බලය විදහා පෑම පිණිසත්, තම රාජ්‍යය ආර්ථිකමය වශයෙන් ස්ථාවර කිරීමට අවැසි සම්පත් උදෙසාත්, වරින් වර අසල්වැසි හෙළ දේශය ආක්‍රමණය කිරීමට පෙළඹ සිටියෝය. මෙම ආක්‍රමණ ක්‍රියාවලින්හිදී චේරයින්, පාණ්ඩ්‍යයන් හා සසඳන කළ චෝලයින්ගේ බලපෑම අතිමහත්ය. එබැවින් ලක් කිරීටයට විසල් අභියෝග යක් එල්ල කළවුන් ලෙස චෝලයෝ හැඳින්වීම වරදක් නොවනු ඇත. චෝලයින්ගේ ධජයේ ලෙළදෙන ව්‍යාඝ්‍රයා කොටි සංවිධානයේ ධජයට යොදාගැනීමට මෙයද එක් හේතුවක් විය. (Sabarathnam.T,2003)

චෝළ ආධිපත්‍යය ලංකාවේ ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව හැදෑරීමට ඇති දේශීය මූලාශ්‍ර දකුණු ඉන්දියාව හා සසඳන කළ අල්ප වේ. මහා වංශයේ 55 හා 56 පරිච්ඡේදවල චෝළ ආක්‍රමණ පිළිබඳව සඳහන් වෙතත් එය එතරම් ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. නමුත්, ලංකාවේ හා ඉන්දියාවේ දක්නට ලැබෙන පළමුවන රාජරාජ හා රාජේන්ද්‍ර චෝලගේ සෙල්ලිපි හා තිරුවාලංකාඩු තඹ පත්තිරු මඟින් ලංකාවේ චෝළ ආධිපත්‍යය පිළිබඳ සැළකිය යුතු තොරතුරු ප්‍රමාණයක් අවබෝධකර ගත හැකිය. බොහෝවිට අප දේශයේ ආක්‍රමණිකයන් ලෙසම හඳුන්වනු ලැබූ ඒ චෝළයාගේ ඓතිහාසික මූලාශ්‍ර අධ්‍යයනය කිරීම තුළින් චෝලයා තරම ම සිංහලයන් වර්ණනා කළ අන් යමකු වේදැයි යන්න සැකසහිත.

ක්‍රි ව 10 සිට 12 කාල වකවානුව යනු දක්ෂිණ භාරතයේ චෝලයෝ බලවත්ව සිටි කාලයයි. මේ චෝළයින් තම ආධිපත්‍ය ලොව පුරා පතුරුවාලීම පිණිස දිව රෑ වෙහෙසුණහ. දකුණ ඉන්දීය සමුද්‍රයේ ඒකාධිපතිත්වය උසුලමින් එතෙක් උතුරෙන් වින්ද්‍යා කඳුවැටියට හා දකුණින් කුමරි සමුද්‍රයට පමණක් සීමා වූ දකුණු ඉන්දිය දේශ සීමාවන්, උතුරින් ගංගා නම් නදිය තෙක් ද බටහිරින් අරාබි මුහුදෙන් හා නැගෙනහිරින් මලයාසියාව දක්වාත් පුළුල් කෙරුණි.

සමකාලීන ලක්දිවෙහි අනුරාධපුර රාජධානියේ අවසාන භාගය වනවිට දක්ෂිණ භාරතීය දේශපාලන ක්ෂේත්‍රයේ සමතුලිතතාවයක් ඇතිකරනු පිණිස පාණ්ඩ්‍යයනුත්, සිංහලයනුත් නැගී එමින් පැවති චෝළ බලයට විරුද්ධව සන්ධානගත වූහ. පාණ්ඩ්‍යයන් විසින් චෝළ රජුන්ට විරුද්ධව කරන ලද සටන් වලදී සිංහල රජු පාණ්ඩ්‍යයන්ට සහය වීමට ආධාර හමුදාද යවන ලදී. මේ සටන් වලින් ඇතැම් අවස්ථාවල පරාජය වූ පාණ්ඩ්‍යය රජු ලංකාවට පැමිණ ආරක්ෂාව ද ලබා ගන්නා ලදී.

එබඳු සිදුවීම්වල අවසාන ප්‍රතිඵලයක් වූයේ සිංහල දේශයත්, පාණ්ඩ්‍ය දේශයත් දුර්වලව පැවති අවස්ථාවක උතුරු ලංකාව ආක්‍රමණය කර එහි චෝලයින් තම ආධිපත්‍යය පැතිරවීමයි.

ක්‍රි. ව. 993දී පමණ රජරට ආක්‍රමණය කළ පළමුවන රාජරාජ එම වසරේ සිට සැහෙන බලපෑමක් ලංකාවට ඇති කළේය. විවිධ අවස්ථාවන් හී දිවයිනට එල්ල වූ චෝළ ආක්‍රමණ තුළින් කූටප්‍රාප්ත වූයේ පළමුවන රාජේන්ද්‍ර අධිරාජ්‍යයා විසින් ක්‍රි. ව. 1017දී රජරට යටත්කර ගැනීමයි. අඛණ්ඩ දමිළ අධිරාජයක් ගොඩනැංවීමෙහි ලා අරුල්මොලි වර්මන් නම් රාජ රාජ චෝළ දුටු ස්වප්නය සඵල කරගැනීමට 5 මිහිඳු රජුන් ඔහුට විසල් අභියෝගයක් නොවීය. ඔවුන් විසින් ලක්දිව යටත් කරගත් ප්‍රදේශ චෝළ අධිරාජ්‍යයේ ප්‍රාන්තයක් බවට පත් වූ අතර එය "මුම්මුඩිචෝළ මණ්ඩලම්" යනුවෙන් නම් කෙරිණ. "මුම්මුඩිචෝළ" යනු රාජරාජ අධිරාජ්‍යයා දැරූ විරුද නාමයකි.

ලක්දිව වසර එක්දහස් පන්සියක අඛණ්ඩ රාජධානියක ශ්‍රී විභූතිය මෙලෙස පහසුවෙන්ම චෝලයින් විසින් අත්පත් කරගන්නා ලදී. ඔවුහු විසින් ලක්දිවෙහි රාජ තන්ත්‍රය සියතට ගනු ලැබුව ද එය මුලු ලක්දිව දක්වා ව්‍යාප්ත වූ වග එකහෙළාම කිව නොහැක.

චෝලයින් විසින් මිහිඳු රජු ජීවග්‍රහයෙන් අල්ලා ගත්තද, தெண்டிரை ஈழமண்டல முழுவதும் මුහුදෙන් වට ඊළමණ්ඩලය සම්පූර්ණව රාජේන්ද්‍රයන් විසින් යටත් කළ බැව් කීව ද, වික්‍රමබාහු නම් කස්සප කිත්ති මහාලන කිත්ති යනාදී අයවළුන්ගේ පාලනයට රුහුණ නිරතුරුව නතුවී තිබුණ බැවින් චෝලයින් ලක්දිව පුරාම ස්වාධිපත්‍ය පැතිරූ වග සිතීම තාර්කික නොවන්නේ.

"Rajaraja, taking advantage of the confusion in the island kingdom which arose from a military revolt against Mahinda, had bought it under his power with the exception of its remoter parts which were still held by Sinhalese"

(Nilakanta Sastri.1955)

මෙසා බලසම්පන්න චෝලයින්ට හෝ 1815 වන තෙක් වෙන කිසිදු ආක්‍රමණිකයකු හට මුළුමහත් ආධිපත්‍යයම ලක්දිව පිහිටුවාලීම කළ නොහැක්කක්ම විය. නැගෙනහිරින් මලයාසියාව තෙක් තම බලය පතුරාලු මෙම චෝලයින්ට තමන්ට ආසන්නයේම පිහිටි හෙළ දිවයින මුළුමනින්ම ආක්‍රමාණය කොට තම පාලනයේ පවත්වාගැනීමට නොහැකිවීමට හේතුව කුමක් විය හැකිද?

ඉංග්‍රීසීන් විසින් කන්ද උඩරට ආක්‍රමණය කිරීමේදී ඔවුන්ට විශාල අභියෝගයක් වූ භූ විෂමතාවය චෝලයාට අභියෝගයක් විනිද? නැත. ඉංග්‍රීසීන් මුහුණදුන් ලෙඩරෝග මෙන් වසංගත තත්වයන් හට චෝලයා මුහුණදුන් බවක් ඉතිහාසයේ කියවෙන්නේ නැත. එසේනම්, මුළුමහත් ලක්දිවම යටත් කිරීමට චෝලයාට නොහැකි වූයේ කිමද? චෝලයා මේ පිළිබඳව සෘජුව නොකී නමුත් ඔහු තම ප්‍රශස්ති ලිපින්මහි වක්‍රව මේ පිළිබඳව යම් යම් කරුණු ඉදිරිපත් කොට තිබීම පිළිබඳව අප චෝලයාට තුති පිරිනැමිය යුතුය

- මුරට්ටෙළිල් සිංගලවර් முரட்டு + எழில் = முரட்டெழில் சிங்களர் මුරට්ටු + එළිල් - මුරට්ටෙළිල් Rough + Beauty :

முரட்டு, Rough : In a manner that lacks gentleness; harshly or violently. (Oxford Dictioiry)

எழில், Beauty: comeliness, gracefulness (University of Madras Lexicon)

ඒ අනුව රළු ලස්සන සිංහලයින් ලෙස මෙය නිර්වචනය කළ හැකිය. එනමුත්, මහාචාර්ය පීටර් ෂෝක් මහතා තම Buddhism among Tamil in Pre – colonial Tamilgam and Ilam යන ග්‍රන්ථයේදී මෙය Cingalavar of rough strength යැයි සඳහන් කොට තිබීම මෙහිදී මතක් කිරීමට කැමැත්තෙමි.

- මුරට්ටොළිල් සිංගලවර් ඊළමණ්ඩලම් - රළු ශක්තිවන්ත සිංහලයන්ගේ ඊළ මණ්ඩලය යනුවෙන් සඳහන් වේ. (සුන්දරේස වාණ්ඩෙයර්. 1945)
- பொருகளவீழத் தரைசர்தமுடியும், - The crown of the King of Ilam rough like the sea ඊල රජුගේ ඔටුන්න මුහුද මෙන් රළුය.



முரட்டொழில் சிங்களவர் - Warlike sinhalar

රණකාමී සිංහලයින්

(Peter schalk.2002)

ලක් රාජාවලියේ විසල් බණ්ඩණයක් ඇති කරමින් දමිළ රට ලෙස හැඳින්වෙන දක්ෂිණ දඹදිව සිට පැමිණි සේනා සම්මත අශ්ව නාවිකයකුගේ සේන ගුත්තික යන පුත්‍රයන්ගේ ඇරඹි මේ සංග්‍රාම ඉන්පසු සෘජු ගතියැති එළාර විසින් වසර 44 ක්ද, ඉන්පසු පුලහස්ථ, බාහිය, පණයමාර, පිළයමාර ආධීක වැනි දමිලයින් වශයෙන් ද අවසන පස්වන මිහිඳු රජුන් ජීවග්‍රහයෙන් අල්ලාගන්නා තුරු අනුරාධපුර රාජධානි සමය පුරාවටම දැකගත හැකිය. චෝලයන් විසින් "ඊලමණ්ඩල මුලුවදුම්" යැයි මුළු හෙළ දේශයම තම පාලනය යටතට ගත් බව දැක්වූවද, එය චක්‍රවර්තී රාජරාජ චෝලට මෙන්ම ඔහුගේ පුත් රජේන්ද්‍ර හට ද හුදෙක් සිහිනයක් වීමට හේතු වූ එකම කරුණ නම් හෙළයාගේ අත්‍යන්ත වීරත්වයම වේ. කාලයේ වැලිතලාවෙන් වැසීගිය ඒ අභීත සිංහලයාගේ වීරත්වය පිළිබිඹු කරණා සිදුවීමකි මෙලෙස ලියවෙන්නේ.

මතු සම්බන්ධයි


මූලාශ්‍ර

- සුන්දරේස වාණ්ඩෙයර්. (1945). කල්වෙට්ටු (Review of කල්වෙට්ටු). පොදිගෙ පදිප්පගම්. (Original work published 1955)
- නටරාජන්, ආචාර්ය. (2023) තමිලග වරලාරු (සංග කාලය පටන් 1363 දක්වා) සුබුමනියම් සුන්දරයාර් විශ්වවිද්‍යාලය.
- ජයවර්ධන සරත්, මේජර්. (2023). ලක්දිව සංග්‍රාම ඉතිහාසය. කෙහෙළි ප්‍රකාශකයෝ.
- මහාවංශය
- Nilakanta Sastri, K.A. (1955). The Colas, University of Madras, Madras (Reprinted 1984).
- Sabarathnam.T, Pirabaharan (Vol. 1), Chap.9 TNT murders into the LTTE September 2003.
- Schalk, P., & A. Veluppillai. (2002). Buddhism Among Tamils in Pre-colonial Tamiḷakam and Īḻam: The period of the imperial Cōḻar: Tamiḷakam and Īḻam.

# මස්ටර් චෙක්



නිලධාරියකු මෙන්ම සෙසුනිලයකු කවදා හෝ තම ජීවිතයේ එක වතාවක් හෝ අසා ඇති මෙම වදන, සිය පුහුණු කාලසීමාවේ සිට රාජකාරී ආරම්භ කළ මොහොත දක්වා අසන්නට අකමැතිම දෙබස් වනු නොඅනුමානය. මන්දයත්, ඒ තුළ ගැබ්ව ඇති බැරෑරුම්භාවය තේරුම් යන්නේ, එකී අතපසුවීම තවකෙකුට නිරීක්ෂණය වීමෙන් පසුවය. ඒ අනුව රට දැය රකින රණවිරුවකුගේ "නිල ඇඳුම හා එය අඳින පළඳින ආකාරය" යාවත්කාලීනව කියවිය යුතුම මාතෘකාවකි.

අභිමානවත් රණවිරුවකු එක එල්ලේම සමාජය විසින් හඳුනාගන්නේ ඔහුගේ හෝ ඇයගේ නිල ඇඳුම හරහාය. විනයවත් හා විධිමත් පුහුණුවකින් නිර්මාණය වන රණවිරු පෞරුෂය ඉස්මතු කරන ප්‍රධාන සාධකයක් ලෙස "යුද හමුදා නිල ඇඳුම හා එය භාවිතය" හුවා දැක්විය හැකිය. සෙබළකු සිය පුහුණුව තුළ හදාරනු ලබන වැදගත් ක්ෂේත්‍රයක් වන, සිය අඳින පළඳින දෑ සහ ඒවායේ ප්‍රායෝගික භාවිතය මෙන්ම නඩත්තුව වෙනත් කිසිදු වෘත්තියක දක්නට නොමැත. එය සුවිශේෂී කාරණාවක් වන නිසාම ඒ පිළිබඳ නැවත මතක් කරදීමක් නව වසර ආරම්භයේම ලබාදීම කලෝචිතය.

ශ්‍රී ලංකා යුද හමුදාවේ පහළ සිට ඉහළට නිර්මාණය වන නිලයන්ගේ ගෞරවනීයභාවය හා හඳුනාගැනීම උදෙසා භාවිතා වන ඇඳුම් ආයිත්තම් ආදිය තුළ ගැබ්ව ඇති අභිමානය නිසි ආකාරව දකින්නාට නිරූපනය වන්නේ අපගේ පිරිසිදු හා නිවැරදි නඩත්තුව මත අඳින පළඳින ආකාරය අනුවය.

"ඉතිං, අපි පිරිසිදුව, හැඩට, ප්‍රියමනාප නිල ඇඳුම් ඇඟලා ගනිමු"

රණවිරුවකුගේ හිසේ සිට පාදය දක්වා අඳින පළඳින දේ නිසියාකාරව යාවත්කාලීන කරන ආකාරය අමුතුවෙන් කියා දියයුතු නොවේ. ඒ පිළිබඳ ඔබ අප හොඳින් දැනුවත්ය. කවර තරාතිරමක නිලයකු වුවද සැබෑ රණවිරු පෞරුෂය අනෙකාට පෙනෙන්නට අඳින්න පළඳින්න අප සැලකිලිමත් විය යුතුය.



උපපනි
ඒබීඅයි
ලක්ෂිත

සරලම උදාහරණයක් ලෙස පළඳින බූට් යුගලය නැත්නම් සපත්තු යුගලය, සිවිල් සමාජයේ රැකියාවක නිරත වන පුද්ගලයකුට වඩා ක්‍රමානුකූලව නඩත්තු කරමින් පිරිසිදු කරමින් නියමිත ප්‍රමිතියට ගෙන ඒමට අප සිදුකරන දේ, හමුදාව තුළින්ම පුහුණු වූ අපටම අනන්‍ය වූ ක්‍රියාදාමයක්ය. භාවිතා කරන සපත්තු, පොලිෂ්, පුළුන්, ඉටිපන්දම් ආදිය ඒ පැහැය දිස්නය ලබාගැනීමට දරන වෙහෙස, සපත්තු යුගල පැළඳ රැකියාවට පැමිණි පසු ලැබෙන අවධානය තුළින් අපට අභිමානවත් සතුටක් ගෙන එනු ඇත. හොඳින් සිතා බලන්න. ඔබ ඉදිරියට දකින පුද්ගලයාගේ පළමුව අපගේ අවධානය යොමුවන්නේ, ඔහුගේ හෝ ඇයගේ පාද හා සම්බන්ධ පැළඳුම් මත නොවේද?

එමෙන්ම, අපගේ නිල ඇඳුම නිසියාකාරයට කෙටි වේලාවක් තුළදී ඇඳ පැළඳ ගැනීමට අප ලබන පුහුණුව තුළින් රාජකාරී බහුල දිනයක වුවද, නියමිත ආකාරයට නිල ඇඳුම ඇඟලා ගැනීමට හැකිවීම ද අප සතු සුවිශේෂී හැකියාවක්ය. ඒ ආකාරයට හුරුපුරුදු වන සෙබළෙකු සිවිල් සමාජයේ ඇඳ පළඳින ආකාරය ද, ඉතා ආකර්ශණීය වන අතර, ඔහු හෝ ඇය අඳින කවර හෝ ඇඳුමක් වේවා එහි නියමිත පෙනුම ගැන වැඩි අවධානයක් යොමු වීම නිතැතින්ම සිදුවන්නකි. නිලධාරියකු මෙන්ම සෙසුනිලයකු පවා සිය පෞද්ගලික පිරිසිදුතාව කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කිරීම ද, සුවිශේෂී තවත් කාරණාවක්ය. නියපොතු, අත් පා ආදී ශරීරාංග පිරිසිදුව පවත්වා ගැනීමට ද රණවිරුවකු වැඩි ප්‍රමුඛතාවයන් ලබාදෙනු ඇත.

අප හට ලබාදෙන නිල ඇඳුම පිරිසිදුව තබාගනිමින්, වෙහෙසකාරී රාජකාරිවල නිරත වුවද, පසුදිනට නැවත පිරිසිදු කොට ඇඳ පැළඳීම සොල්දාදුවකුගේ ප්‍රධානතම අරමුණක් විය යුතුමය. එම පිරිසිදුභාවය තවත් අතකින් තම පුද්ගලික සනීපාරක්ෂාව සඳහා ද බලපානු ඇත.

සෙබළකු තම කොණ්ඩය, රැවුල නිසි ආකාරයට පවත්වා ගැනීම ද, කාන්තා සෙබළියකුට ද තම කොණ්ඩය රාජකාරී අවස්ථාවල දී නිසි ආකාරව පවත්වා ගැනීම තුළ තව තවත් අපගේ ප්‍රතිරූපය වර්ධනයට ද හේතු වනු ඇත.

# එළදෙනක් පිළිබඳව ආර්ථික විග්‍රහයක්



* **සමාජවාදය**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී.ඉන් එක් දෙනක් ඔබ ඔබේ අසල්වැසියාට දෙයි.

* **කොමියුනිස්ට්වාදය**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. දෙදෙනාම රජයට ගෙන ඔබට කිරි ස්වල්පයක් දෙයි.

* **ෆැසිස්ට්වාදය**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. රජය දෙනුන් දෙදෙනාම ගෙන ඔබට කිරි ස්වල්පයක් විකුණයි.

* **නාසිවාදය**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. රජය උන් දෙදෙනාම ගෙන ඔබට වෙඩි තබයි.

* **නිලධාරීවාදය**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. දෙනුන් දෙදෙනාම රජයට ගෙන, එකෙකුට වෙඩි තබා අනෙකාගේ කිරි දොවා අනතුරුව කිරි ටික විසිකරයි.

* **සාම්ප්‍රදායික ධනපතිවාදය**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. ඔබ ඉන් එකෙකු විකුණා ගොනෙක් මිලට ගනී. ගොන් රැළ විශාල වී ආර්ථිකය වර්ධනය වේ. ඔබ ගොන් රැළව විකුණා ඉන් ලැබෙන ආදායමෙන් විශ්‍රාම සුවයෙන් පසුවේ.

* **ඇමරිකානු සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. ඔබ ඉන් එකකු විකුණා දෙනුන් හතර දෙනකුගේ කිරි නිපදවන ලෙස අනෙක් දෙනට බල කරයි. පසුව එළදෙන මියගියේ මන්දැයි විග්‍රහ කිරීම සඳහා උපදේශකයකුගේ සේවය ලබාගනී.

* **ප්‍රංශ සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. එහෙත් ඔබට එළදෙනුන් තිදෙනෙක් අවශ්‍ය නිසා වැඩ වර්ජනය කර කැරැල්ලක් සංවිධානය කර පාරවල් අවහිර කරයි.

* **ජපන් සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. සාමාන්‍ය එළදෙනෙකුගේ දහයෙන් එකක් වන සේ දෙනුන් නැවත සැළසුම් කර කිරි නිෂ්පාදනය විසි ගුණයකින් වැඩි කරයි. අනතුරුව කව් නිමෝන් නම් වඩාත් කාර්‍යක්ෂම එළදෙනෙකුගේ කාටූන් පිළිරුවක් නිර්මාණය කර ලොව පුරා අලෙවි කරයි.

* **ජර්මාන් සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. ඔවුන් වසර සියයක් ජීවත්වීම සඳහාත්, මසකට වරක් ආහාර ගැනීම සඳහාත්, ඔවුන් විසින්ම කිරි දෙවීම සඳහාත්, ඔබ ඔවුන්ව ප්‍රතිනිර්මාණය කරයි.

* **රුසියානු සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. ඔබ දෙනුන් ගණන් කර පස් දෙනෙක් සිටින බව දැනගනී. ඔබ නැවත වරක් ගණන් කර හතළිස් දෙනෙකු සිටින බව දැනගනී. ඔබ නැවත වරක් ගණන් කර ඔබට ඇත්තේ දෙනුන් දෙදෙනකු බව දැනගනී. ඔබ දෙනුන් ගණන් කිරීම නතර කර තවත් වොඩ්කා බෝතලයක් හිස් කිරීමට සැරසේ.

* **ඉතාලි සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටියත්, ඔවුන් සිටින්නේ කොහේදැයි ඔබ නොදනී. ඔබ දිවා ආහාරය ගැනීමට තීරණය කරයි.

* **ස්විට්සර්ලන්ත සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. ඉන් එකෙකුවත් ඔබට අයිති නැත. ඔවුන් ගාල්කර තබාගැනීම ගැන ඔවුන් අයිතිකරුවන්ට එරෙහිව නඩු පවරයි.

* **චීන සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. ඔවුන් කිරි දෙවීම සඳහා 300 දෙනෙක් යොදවා ඇත. රැකියා ප්‍රශ්නය විසදා ඇති බවත්, උසස් කිරි නිෂ්පාදනයක් ඇති බවත්, ඔබ උදම් අනයි. එහෙත් ඇත්ත තත්ත්වය වාර්තා කළ මාධ්‍යවේදීන් අල්ලා සිරගත කරයි.

* **ඉන්දියානු සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. ඔබ එම දෙනුන් දෙදෙනාටම වැඳ නමස්කාර කරයි.

* **බ්‍රිතාන්‍ය සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. උන් දෙදෙනාටම පිස්සුය.

* **ඉරාක සංස්ථාවක්**

එළදෙනුන් විශාල සංඛ්‍යාවක් සිටී යැයි සැමදෙනාම සිතති. එහෙත්, ඔබට එකෙක්වත් නැති බව ඔබ පවසයි. කිසිවෙක් ඔබ විශ්වාස නොකරයි. එබැවින් ඔවුන් බෝම්බ හෙලා ඔබේ රට ආක්‍රමණය කරයි. තවමත් ඔබට එළදෙනුන් නැත. එහෙත්, ඔබ දැන් ප්‍රජාතන්ත්‍රවාදයේ කොටසක් බවට පත්වී තිබේ.

* **ඕස්ට්‍රේලියානු සංස්ථාවක්**

ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. වෙළෙඳාම් කටයුතු හොඳින් කෙරේ. ඔබ කාර්යාලය වසා එය සැමරීම සඳහා බියර් බෝතල් කිහිපයක් හිස් කරයි.

* **නවසීලන්ත සංස්ථාවක්**


ඔබට එළදෙනුන් දෙදෙනකු සිටී. වම් පැත්තෙන් සිටින්නා බෙහෙවින් දැකුම්කළුය.


*පොතපත ඇසුරින්..*

*ලුතිනන් කෝලිත කුලසේකර (9 ගජබා රෙජිමේන්තුව)*
*වෙඩිතලතිව් සිට එවකට රණවිරුවාට සැපයූ ලිපියක් ඇසුරෙනි.*



# ගිනිදලු මැදින් දැරියකගේ දිවි බේරූ රත්නායක




■ ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ


**යුද හමුදාවේ ගමන් මඟ වූ කලී ඉවසීම, දරාගැනීම, අසීමාන්තික කැපකිරීම හමුවේම පසුකළ එකකි. එසේම එහි විශේෂම කාරණය වනුයේ එසේ පසුකළ මඟ ඔස්සේ දේශය වෙනුවෙන් දහස් ගණනකගේ ජීවිත ද පූජාකොට ඇති හෙයිනි. ඒ අසමසම කැපකිරීම හමුදාවකට, නොඑසේ නම් රණවිරුවන්ට හැර අන් අයකුට සිදුකළ නොහැක. එවන් අභිමානයක් ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විරුවකු පිළිබඳ "යුද සමයේ සැඟවුණු කතාවක්" තුළින් මෙවර ලිපිය පෙළගස්වන්නේ නිහතමානී ආඩම්බරයක් ද සමඟිනි.**

යුද්ධයේ අවසන් සමය වනවිට උතුරේ එතෙක් පැවති ත්‍රස්තවාදය ක්‍රමිකව මුලතිව් දෙසට තල්ලු වෙමින් තිබිණ. එනිසාම ආරක්ෂක හමුදා සියලු බර ඒ වෙත යොදා තිබූ අතර, යාපනය ප්‍රදේශයේ පැවතියේ බරපතල සිදුවීම් වාර්තා නොවන පසුබිමක්ය. විශේෂයෙන්ම සිවිල් ජන ජීවිත සම්පූර්ණයෙන්ම වෙනසකට භාජනය වී නොතිබුණ ද ක්‍රියාන්විත පරිසරය අතරේ වුව ඒ සඳහා ඔවුන් තුළ යම් පෙලඹවීමක් ඇතිවෙමින් තිබිණ. යුද ජයග්‍රහණය ලබන අතරේ එම ප්‍රදේශවල සිවිල් ජන මතය දිනාගැනීම වෙනුවෙන් ද හමුදාව යහපත් මානසික සංග්‍රාමයක් අරඹා තිබූ අතර, බොහෝ විට එම කටයුතු සිදුවූයේ අප්‍රකටවය. රණවිරුවන් ගිනි

අවි අත දැරුව ද ඒවා හැඬවූයේ සමස්ත ජනතාව හා රටේ යහපත පිණිස මිස අනවශ්‍ය ලෙස කිසිවකුට හානිකිරීමේ අදහසකින් නොවේ. එසේම, ආයුධ නොමැතිව ද එම ක්‍රියාන්විත භූමියේ සිට එහි ජනතාව වෙනුවෙන් ඉටුකළ නිහඬ මෙහෙවරක් ද තිබිණ. මේ අප්‍රකට කතාව ද එවැනි එකකි.

2007 මාර්තු 12 වන දින පෙ.ව. 10.20 වනවිට කෝප්‍රල් ප්‍රසන්න රත්නායක ඇතුළු භට පිරිස සුපුරුදු ලෙස පාමුර සංචාරයක නිරතව සිටියහ. ඔවුහු යාපනය නගරයේ මනෝරාජ් හන්දිය අසලට පැමිණෙත්ම යාබදින් ඇසුණේ කිසියම් අයකුගේ මරලතෝනියකි. කෝප්‍රල් ප්‍රසන්න රත්නායක යුහුසුළුව එදෙස විපරම් කර බැලූ විට දුටුවේ බුරබුරා නැගෙන ගිනිදැල්වලින් වටකරගත් නිවසකි. එතුළින් ඇසෙන කුඩා දැරියකගේ විලාප හඬත් සමඟ සිදුවන්නට යන විපත ඔහුට අමුතුවෙන් දැනගැනීමට අවශ්‍ය නොවීය. මොහොතකුදු පමාව ජීවිතයක ඉරණම විසඳෙන බැව් අවබෝධ කරගත් හෙතෙම වහා ක්‍රියාත්මක විය.

ඒ වනවිට එහි රැස්ව සිටි අයවළුන් ගින්න නිවාදැමීමට උත්සහ ගනිමින් තිබිණ. එහෙත් බුර බුරා නැගෙන ගිනිදැල් හමුවේ කිසිවකුත් නිවස තුළට වැද දැරිය බේරාගැනීමට ඉදිරිපත් නොවූයේ එයින් තම ජීවිතය ද අනතුරට ලක්වන්නට ඉඩ තිබූ හෙයිනි. දැරියගේ දෙමාපියන් මිදුලට වී කෑ මොර දෙමින් තම දියණිය බේරාදෙන ලෙස ඉල්ලා දෙවියන් යදින්නට වූයේ අන් කළහැකි කිසිවක් නොවූ නිසාය. එහෙත්, ඒ වනවිටත් දේශයේ මුරදේවතාවක් බඳු රණවිරුවකු ඒ සඳහා සූදානම් වන බව ඔවුන් නොදත්තේය. තමන් සමඟ ගිය සෙසු සගයින් ගින්න නිවා දැමීමේ කටයුත්තට යොමු කළ රත්නායක වහ වහා නිවසට ඇතුලුවන්නට උත්සුක විය. නමුත්, නිවසෙහි දොරගුලු ලා තිබීමත් තදබල ලෙස ගින්න පැතිරියාමත් හේතුවෙන් ඔහුගේ උත්සාහය පමා කළේය. එහෙත්, නිවස තුලින් ඇසෙන දැරියගේ විලාපය හමුවේ කුමන බාධාවක් වුව බිඳලිය හැකි මහා ජවයකින් රත්නායක ගේ ගතසිත ශක්තිමත් වූයේය. හෙතෙම තම ජීවිතයට සිදුවිය හැක උපද්‍රවය තුට්ටුවකට මායිම් නොකර දොරගුලු කඩා දමමින් ගෙතුළට පැන්නේය. ගින්නට හසුවීමට ආසන්නව ජීවිතයත් මරණයත් අතර සිටි එහි වූ දැරිය සැනින් සිය දෑතට ගත් රත්නායක ඉහලට නැගෙන ගිනි ජාලා දුම් රොටු අතරේ සැබෑ යුධ විරුවකුගේ විලාශය කියාපාමින් නිවසින් එලියට ආවේය. ඒ වනවිට එම නිවස සහ එහි වූ බඩු මුට්ටු සියල්ල අඟුරු ගොඩක් බවට පත්ව විනාශ වෙමින් තිබුණ ද ඒ සියල්ල පරයා සොල්දාදුවකුගේ වීරත්වයද සැබෑ මනුෂ්‍යත්වය ද ඉස්මතු වී තිබිණ.

පිටතට පැමිණි කෝප්‍රල් රත්නායක අවට විපරම් කරද්දී දුටුවේ ඒ වනවිටත් විශාල පිරිසක් නිවස වටා රැස්ව සිටින බවකි. එහිදී, ඔහු අත්විඳි පුදුමය නම් ප්‍රදේශයේ ද්‍රවිඩ තරුණයින් රැසක් ද ඒ අවට සිටින බවකි. ඒ සෑම අයෙක්ම ගින්න නිවීමට උත්සාහ ගෙන තිබුණා මිසක් කිසිවකුත් නිවස තුළට පැන අදාළ දැරිය පිටතට ගැනීමට ඉදිරිපත්ව නොතිබිණ. යම් හෙයකින් ඒ මොහොතේ තමා ඇතුළු හමුදා භටපිරිස් එහි නොපැමිණියේනම් එම දැරිය නිසැකවම ගින්නට හසුවනවා නොවේදැයි ඔහුට සිතිණ. ඒ සමගම



කෝප්‍රල් ප්‍රසන්න රත්නායක ක්‍රියාන්විත රාජකාරීන්හි නියුතු වෙමින්

බේරාගත් දැරිය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීමට ද ඔවුහු යුහුසුළු වූහ. රත්නායක එම දැරිය තුරුළු කරගනිමින් පැමිණි නිසාම ඇයව තවදුරටත් ගින්නට නිරාවරණය වීමට තිබූ අවස්ථා මගහැරගැනීමට ද ඔහුට හැකිවිය. එනිසාම එම දැරියට බරපතල පිළිස්සුම් තුවාල සිදුනොවීම කෝප්‍රල් රත්නායක ගේ ඉමහත් අස්වැසිල්ලට හේතු වී තිබිණ. කෙසේ නමුත් කෝප්‍රල් රත්නායක ගේ හිසකෙස් සේම සිරුරේ රෝම සියල්ල දැවී තිබූ අතර, කමිසයේ හා කලිසමේ ස්ථාන කිහිපයක්ම පිච්චී තිබුණේ සිරුරට දැනෙන තරමේ හානි ගෙන දෙමිණි. සිය කර හරහා එල්ලා ගෙන තිබූ ගිනි අවිය ද ගින්නට හසුවීම

බුර බුරා නැගෙන ගිනිදැල් හමුවේ කිසිවකුත් නිවස තුළට වැද දැරිය බේරාගැනීමට ඉදිරිපත් නොවූයේ එයින් තම ජීවිතය ද අනතුරට ලක්වන්නට ඉඩ තිබූ හෙයිනි. දැරියගේ දෙමාපියන් මිදුලට වී කෑ මොර දෙමින් තම දියණිය බේරාදෙන ලෙස ඉල්ලා දෙවියන් යදින්නට වූයේ අන් කළහැකි කිසිවක් නොවූ නිසාය. එහෙත්, ඒ වනවිටත් දේශයේ මුරදේවතාවක් බඳු රණවිරුවකු ඒ සඳහා සූදානම් වන බව ඔවුන් නොදත්තේය.

නිසාම ගිනියම්ව තිබුණේ සිය ක්ෂණික මෙහෙයුමේ තරම කියාපාමිනි.

විරුවන් බිහිවන්නේ යුද බිමේ දී පමණක් නොව සැබෑ වීරත්වයට තැනක් නොතැනක් නොමැත. කුමන තැනක කුමන මොහොතක හෝ කිසියම් අයකු විපතට පත්ව ඇත්නම් නොවළහා පෙරට විත් ඔහුට උපකාර කිරීම සැබෑ මිනිස් ගතියකි. එසේම,

> වීරුවන් බිහිවන්නේ යුද බිමේ දී පමණක් නොව සැබෑ වීරත්වයට තැනක් නොතැනක් නොමැත. කුමන තැනක කුමන මොහොතක හෝ කිසියම් අයකු විපතට පත්ව ඇත්නම් නොවළහා පෙරට විත් ඔහුට උපකාර කිරීම සැබෑ මිනිස් ගතියකි. එසේම, තම ජීවිත අවදානම ද නොතකා අතිශය බිහිසුණු අවස්ථාවන්ට මුහුණ දෙමින් තවත් අයකුගේ දිවි රැකගැනීමට ඉදිරිපත් වීම මිනිස්කම ඉක්මවා ගිය වීරෝදාර කටයුත්තකි. සෙබළා යනු එසේ මිනිස්කමත් වීරත්වයත් සංකලනයෙන් බිහිවූ අයෙකි. අවැසිකළ ඔබටත් සදාකල්හිම රටටත් ඔහුගේ සෙවණ සැලසෙනු නියතය. කෝප්‍රල් ප්‍රසන්න රත්නායක යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉහත ගුණාංගවලින් පිරිපුන් අයෙකි

තම ජීවිත අවදානම ද නොතකා අතිශය බිහිසුණු අවස්ථාවන්ට මුහුණ දෙමින් තවත් අයකුගේ දිවි රැකගැනීමට ඉදිරිපත් වීම මිනිස්කම ඉක්මවා ගිය වීරෝදාර කටයුත්තකි. සෙබළා යනු එසේ මිනිස්කමත් වීරත්වයත් සංකලනයෙන් බිහිවූ අයෙකි. අවැසිකල ඔබටත් සදාකල්හිම රටටත් ඔහුගේ සෙවණ සැලසෙනු නියතය. කෝප්‍රල් ප්‍රසන්න රත්නායක යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉහත ගුණාංගවලින් පිරිපුන් අයෙකි.

1970 මාර්තු 12 වන දින ජේ රත්නායක සහ ඩබ්ලිව්.පී. ප්‍රේමාවතී යුවලට දාව උපන් රත්නායක, ගාල්ල පිලාන විද්‍යාලයෙන් අපොස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය හැදෑරීය. 1990 ඔක්තෝබර් 07 වන දින යුද හමුදාවට එක්ව 6 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවට අනුයුක්තව රාජකාරී අරඹා ඇති ඔහු පසුව අන්තර් ඒකක මාරුවීම් ලැබ 20 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවට ඇතුළත්ව ඇත. පස්දරු පියකු වන රත්නායකගේ දයාබර බිරිඳ යූආර් කුසුමාවතීය. යමුනා සුරංගි, සචිනි, සංජීවනී, ප්‍රසංග සන්දීප, තක්ෂිලා සෙව්වන්දි හා දිනිඳු මෙත්සර ඔහුගේ ආදරණීය දූ දරුවෝ වෙති. එම සිදුවීමෙන් දශක දෙකකට ආසන්නව වර්තමානයේ බලලත් නිලධාරීවරයකු ලෙස විශ්‍රාමිකව හිඳිමින් පවා ඔහු එම අතීත මතකය සිහිකොට අත්විඳිනුයේ මහත් වූ අස්වැසිල්ලකි.

රණවිරුවන්ගේ මෙහෙවර කිසි ලෙසකින්

ප්‍රදේශයකට හෝ ජන කොටසකට සීමා වී නොමැත. තිස් වසරක් පුරා පැවති ත්‍රස්තවාදීනට එරෙහි සටනේ දී පවා ඔවුනු වීරත්වය සේම මානව දයා ගුණ ද පිළිබිඹු කළේය. රට බේරාගැනීමේ මහා මෙහෙවරට දායක වෙමින් වුවද ඔවුන් නිරතුරුව සාමාන්‍ය ජනතාව ආරක්ෂා කිරීමට ද වගබලා ගත්තේ එබැවිණි. ද්‍රවිඩ ජනතාව අතර යුද හමුදාව පිළිබඳ පැවති ප්‍රතිරූපය බිඳ දැමීමට විවිධ බලවේග හිස ඔසවමින් තිබූ සමයක කෝප්‍රල් රත්නායක පෙන්වූ මහඟු ආදර්ශය ඔවුනට එල්ල කළ අතුල් පහරක් වැනිය. මීට පෙරද රණබිමේ දැක් වූ දස්කම් හේතුවෙන් ඇගයුමට පාත්‍රව සිටි රත්නායක ඉහත වික්‍රමය හරහා තව දුරටත් සිය මෙහෙවරට වටිනාකමක් ලබාදී ඇත්තේය. සිය ජීවිත අවදානම නොතකා මරණාභිමුඛව සිටින අන් අයගේ ජීවිත බේරාගැනීම වෙනුවෙන් පිරිනැමෙන්නා වූ "වීරෝදාර විභූෂණය" (WV), කෝප්‍රල් ප්‍රසන්න රත්නායක නමට පිදෙනුයේ ඔහුගේ එම උත්තම මෙහෙවර සදාතනිකව අගයනු රිසියෙනි.

සැබැවින්ම රණවිරුවන් යනු වීරත්වයත් මිනිස්කමත් සංකලනයෙන් බිහිවූ පිරිසකි. අවැසි කළ ඔබටත් සදාකල්හිම රටටත් ඔහුනගේ සෙවණ සැලසෙනු නියතය. "දිනාදී මව්බිම - තනා මඟ සුරකින" යුද්ධ හමුදාව තුළ අදට ද එවන් ලක්පුතුන් හිඟ නැත. විශේෂයෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මෙවර සිය 75 වන ඓතිහාසික අභිමානය සමරනුයේ අතීතය මතින් ලද පන්නරය ද අභිමානය ද සමඟ අනාගතය දෙස බලාපොරොත්තු සහගත බැල්මක් හෙළමිනි.

-නිමි-



කෝප්‍රල් ප්‍රසන්න රත්නායක සිය පවුලේ සාමාජිකයින් සමඟ




## වත්මන් ආයාචනයක්...



මේ දෙරණේ මේ මිහිකත රකින්නට
කළ කැපකිරීම් අපමණයි එදා විරුකැල
එවකට ඒ මතකයන් විටෙන් විට නැගෙයි හදවතට
ජ්‍යෙෂ්ඨත්වයට ගරුකරන
නියම ජාතිමාමකයකු ලෙසට
උපන් බිම රකින්නට ආවේ මා රණබිමට
ලබාගත් දැනුම අපමණයි
රණබිමේ විරුවා ළඟ
ඉතිං ඒ පන්නරය තාම ඇත
අපගේ මතකවල
එදා මෙදාතුර කළ කැපකිරීම්වල වටිනාකම
කාලයත් සමග වියැකිලාදෝ
හැඟෙයි විටක මට
එපා කිසිදිනෙක නිගරු කර ලන්න අභිමානයට
රැකදෙන්න නිරතුරුවම මවබිම
එයයි ආයාචනය වත්මනට
දිරි දෙන්න රණවිරුවනට
එවිට එයි ඔබට සිත් සවිය
ආවර්ජනය කර එදා විරු කැළගේ
අතීත මතකයන් සබඳ
ඒ තුළින් වැජඹෙන්න එයයි මාගේ ප්‍රාර්ථනය

සෙ/242018
බඹ 1 කේවම්වස්සේ කරුණාරත්න යූඑස්පී
1 කාඹුරෙ ශ්‍රීලංඉ

## උතුරේ සටන්බිමේදී මියගිය රණවිරු දියණියට පියාගෙන් මල් මිටක්



කඳුළැලි වලින් බර නෙත් පිස දමනු මිස
නැත අවසරය අපහට යලි දකින ලෙස
දියණිය ඉරේෂා නිල්මිණි නමැති යස
ඔබහට නැමෙයි සාමය දත් දැයක හිස

අම්මා තාත්තා සොහොයුරියන් දෙදෙනා
සහ රැකියාව අතහැර යුදබිම රැඳුන
රුමත් හෙළ දුවක් යාපනයෙහි විඳින
තම දිවි පුදා සිප ගත්තා ලක් දෙරණ

නත්තල්දාට පසුදා එකතුව නිවසේ
සැමදෙන සමඟ සතුටින් පසුව රිසිසේ
සමනල කන්ද වෙත යාමට පැතු විලසේ
නොලැබී පියාඹා ගියෙ උතුරට අහසේ

තිරුනල්වේලි හිඳී සැඟ කොටි දෙනක විසින්
ඇටවූ බෝම්බයකින් ගිය විසිර මසින්
මේ ලක් දෙරණ තෙත්විය එය වියරු බසින්
පවසයි සුළඟ තාමත් එන උතුරු දෙසින්

දේශමාන්‍ය/සාමවිනිසුරු එස්.ඩී.ටී.ඉසෙඩ්. එඩ්වඩ්
(1997.01.02 දින තිරුණෙල්වේලි හිදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දිවිපිදූ සෙ/58860 කෝප්‍රල් ඉරේෂා නිල්මිණී ඩීටීඑස් ගේ ආදරණීය පියාණන්)

## දියණිය දෙස බැලීමි...

කුස මත කන තබා සෙනෙහෙන් අම්මාගේ
නුඹගේ සද්ද ඇසුවා මා ඒ කාලේ
එවන නැති උනත් එදවස දැන් වාගේ
ගැසූ පා පහර මතකයි වඩමින් ආලේ

දෑතට ගෙන නුඹව පපුවේ දවටාන
දෙපසට වනා සුරතල් සිත සරසාන
සිනාසෙන අයුරැ වල ගසමින් මුණ
දිව දුන්නා සැමදා දුක සඟවාන

රෑ මුර හවස් මුර සමහර දිනය පුරා
අම්මා හැතිව සිටියා නුඹ දෑතෙ දරා
කොපමණ නැලෙව්වත් කිරි නැහැ දෙතන පුරා
එනමුත් දියණි කළ හැකි හැමදේම කරා

දින සති ගණන් ගෙවිලා ගිය අරුමයකි
නුඹෙ කරදඹුත් වැවිලා ඇති පුදුමයකි
දික්කළ දෙතොල් දැන් සිත්කළු චිත්‍රයෙකි
මටත් උසයි මගෙ පැටියා ලොකු දුවෙකි

නුඹ ගැන දුක අම්මාගෙන් මා දැක්කා
නුඹට දුකක් නොදැනෙන්නට ඈ රැක්කා
ඒ හැම තැනම උපරිමයෙන් තනි රැක්කා
සංසාරයම ඔය හැටි මම අත් දැක්කා

හිතෙන් හෝ දුකක් කිසිදා නොදැනෙන්න
මගෙ පැටියා මගෙ සව් ගෙන දිරිගන්න
තබනා පියවරක් ගානේ ජය ගන්න
රත්නත්තරේ පිහිටෙන් හැම සුභ වෙන්න

මේජර් මංජුල වීරසිංහ යූඑස්පී එල්එස්සී
ඉංජිනේරු සේවා බලකාය






# කැඩ්ඩන්ගේ කතා




ලුතිනන් කර්නල්
සුජිත්
චමින්ද
එදිරිසිංහ


ඕනෑම හමුදා නිලධාරියකුගේ කෙඩෙට් කාලය යනු බොහෝ මතක සටහන්වලින් පිරී පවතින්නකි. එවකට වැඩිම දුක්වේදනා විඳි කාලය ද පසුකාලීනව මතක්වෙන වාරයක් පාසා වැඩිපුරම ආශ්වාදයක් දැනෙන කාලයද එයමය. දියතලාව යුද හමුදා විද්‍යාපීඨය යනු එසේ පනගැහෙන ඉල ඇදෙන කතා උපද්දවන තෝතැන්නයි. එසේම, ඉවසීම දරාගැනීම පිළිබඳ හුරුකරවන තවත් එවන් කාලපරිච්ඡේදයක් නම් ජීවිතයටම උදා නොවනු ඇත. රාජකාරියේ නිරතව සිටියදීත් විශ්‍රාම ලැබ හෝ වෙනත් හේතු මත සේවයෙන් ඉවත්ව ගිය පසුවත් එකම පාඨමාලාවේ සගයන් එකිනෙකා මුණගැසුනු සෑම මොහොතකම එලෙස කෙඩෙට් කාලයේ කතා කරලියට එන්නේ දෝරෙ ගලන සතුටු සිනා අතරේය. පුහුණුවේ වූ එවැනි මතක හා අත්දැකීම් කොතරම් බලවත්දැයි කියතොත් ඇතැමුන් සිය සේවාකාලය හමුදාවෙන් ඉවත්ව ගොස් මියෙන තුරු මත් එලෙස කෙඩෙට් කාලයේ හැඳින්වූ අනුවර්ථ නම්වලින් (Nick Name) හඳුන්වන අවස්ථා කොතෙකුත් ඇත.

"කැඩ්ඩන්" යනු "වැඩ්ඩන්ය" ඔවුන්ට ද නොහැක්කක් නොමැත. මානසිකව හා කායිකව ඇරඹුමේදී ලබාදෙන රළු පුහුණුව හමුවේ මුලදී එක් අයෙක් දෙන්නෙක් පාඨමාලාව හැරගිය ද පසුව ඊට හුරුවෙන ආධුනික කෙඩෙට් නිලධාරීන් පසුකාලීනව එලවා දැමුවත් පාඨමාලාව හැර නොයාමට වගබලාගනිති. සිවිල් ජීවිතයේදී දෙමාපිය රැකවරණ යටතේ සුඛෝපභෝගී නොඑසේනම් අලස ජීවිත ගතකළ ඇතමුන් දෙමාපියන්ටද බලකර අධිකාරී ලත් නිලධාරියකු ලෙස කෙසේහෝ තරුවක් පැලඳීමේ ආශාවෙන් පාඨමාලාවට එක්වන අයද සිටිති. නමුත්, එවන් අයද ඇරඹුමේදීම එහි ඇති අති දුෂ්කර පුහුණුවේ තරම දැනෙද්දී එම දෙමාපියන්ටම බලකර පාඨමාලාවෙන් ඉවත්වීමට කටයුතු කරන අවස්ථා ද තිබේ. ඉන් කියවෙනුයේ අධිකාරී ලත් නිලධාරියකු ලෙස ආඩම්බර කාර වෘත්තියකට පිවිසීම හැමෝටම කළ නොහැකි බවය. ඒ සඳහා ඉවසීම දරාගැනීම කැපකිරීම හා වාසනාව තිබිය යුතු බවය. ඇතැම්විට ඔවුනට ලබාදෙන තරමේ දුෂ්කර පුහුණුවක් ආධුනික සෙබළුන්ට ලබාදෙන්නේ නම් වැඩිදෙනෙක් හමුදාව හැරයනු නියතය.

කෙඩෙට් කාලයේ බොහෝ මතක ඉතිරිකළ ඇතැම් කැපීපෙනෙන චරිත අධිකාරී ලැබ විසිර ගිය සැනින් සැමට කලින් හමුදාවෙන් ඉවත්වූ අවස්ථා තිබේ. එසේම, තමන් බ්‍රිගේඩියර්වරයකු, මේජර් ජෙනරාල්වරයකු නොඑසේනම් යුධ හමුදාපති වන බවට පාඨමාලාව තුළදී බලාපොරොත්තු සහගත ආඩම්බර වදන් කියූ සමහරුද ක්‍රියාන්විතයන්හිදී වේලාසනින්ම ජීවිතයෙන් සමුගත් අවස්ථා කොතෙකුත් ඇත. එසේම කෙඩෙට් පාඨමාලාවල මුල් පෙළේ සිටි අති දක්ෂයින් සේවයේ නිරතවෙද්දී විවිධ හේතූන් මත වෘත්තිය තුළ පසුපසට ගිය අවස්ථා ද, එම පාඨමාලාවල් වලම පසුපසින් සිටි ඇතැම් නිහඬ චරිත පසුකාලීනව වෘත්තිය තුළ බොහෝ පෙරට පැමිණි අවස්ථාද ඕනෑ තරමය.

ඕනෑම කෙඩෙට් පාඨමාලාවක විවිධ සණයේ නිලධාරීහු සිටිති. ඇතැමෙක් නිදන්නටම උපන් හපන්ය. බොහෝවිට දේශනවලදී ඇරඹුමේ සිට අවසානය තෙක් නිදගන්නා ඔවුන් ශාරීරික අභ්‍යාසවල නිරතවෙද්දී පවා නිදවැටෙන අවස්ථා තිබේ. එලෙස නිරන්තරව නිදගන්නා නිසාම ඔවුන් පාඨමාලා භාර නිලධාරීන්ගේ හා අනෙකුත් උපදේශක කොනොනිවරුන්ගේ උදහසට ලක්ව දැඩි දඬුවම් හිමිවන අවස්ථා එමටය. ඒ අවස්ථාවල අදල කෙඩෙට් නිලධාරීන් නිරතුරු ඔලුවෙන් සිටුවා තැබීම(*Nut Position*) සුලබව සිදුවන්නක් වන අතර, මෙහි ඇති හාස්කමනම් එලෙස ඔලුවෙන් සිටුවා සිටිද්දී පවා ඇතැම් කෙඩෙට් නිලධාරීන් නිදවැටීමය.

වයිට් ගේට් (*Wite gate*) යනු කෙඩෙට් නිලධාරීන්ට ආහාර තරම්ම සමීප වචනයකි. කෙඩෙට් පාඨමාලාවක දිනපතා හෝ දින කිහිපයකට වරක් එය ස්පර්ෂ නොකර වෙනත් වැඩක නියැලෙන්නට හිත නොදෙන තරමට වයිට් ගේට් ඇල්ලීම පුහුනුවේ ඇබ්බැහියකි. එය අතගෑවීමට උපදේශකවරුන්ගේ ඇති කැමැත්ත ද එය අතගෑමට කෙඩෙට් නිලධාරීන්ගේ ඇති අකමැත්තද ඔවුනොවුන්ගේ මුහුණු තුළින් කදිමට සනාථවේ. ඒ කෙසේවෙතත් වයිට් ගේට් ඇල්ලීම කොතරම් අපහසු වුවද උපදේශකවරුන්ට අනුව පළමු දසදෙනා අතරත් ප්‍රථමයා වීමට පොරකන කෙනෙක්ද කැඩ්ඩන් අතර අනිවාර්යයෙන් සිටියේය.

දියතලාවේ සීතල වැඩිකමට නෑමට හොර කෙඩෙට් නිලධාරීන් ද ඕනෑම පාඨමාලාවක සොයාගත හැකිය. ඔවුන් හොර රහසේ දින දෙකතුන නොනා ඉන්නටද කාටත් හොරෙන් නාන බව පෙන්වා සැමට පෙනෙන්නට ඇග පිහදගන්නට ද රුසියෝය. එසේම, නෑමට පස්සට ගියද කෑමට ඉස්සරහට යන අයද ඕනෑම පාඨමාලාවක සිටිති. පුහුණුවේ පොදු කටයුතුවලදී පස්සට යන එවන් අය කෙඩෙට් නිලධාරී නිවස්නයේදී කෑමට නම් පෙරමුන ගන්නේ කිසිදු පැකිලීමකින් තොරවය.

පාඨමාලාවට පැමිණිද සිට විසිර යන තෙක්ම ඇඳුම හා පෙනුම පරීක්ෂාකරණ උදෑසන පෙළපාලියේ මස්ටර් චෙක්වීමද ඇතැම් කෙඩෙට් නිලධාරීන්ගේ උරුමයක් බඳුය. එනිසාම එවන් අය පාඨමාලාව පුරාම තනි තනිව භුක්ති විඳින දඬුවම් වාරගණන ගැනිය නොහැකි තරම්ය. ඔවුන්ගේ ඇඳුම පිළිවෙලට ඇති කල්හි බූට් දෙක පොලිෂ් නැත. ඒවා හොඳින් ඇති විට නිසිපරිදි රැවුල කැපී නැත. රැවුල සහ අනෙකුත් සියල්ල නිසිපරිදි ඇතිවිට *Wrong Line up* ය. එසේත් නැතිනම් හිස්වැසුම ඇදය. ඉහත කී සියල්ලම නිසිපරිදි ඇතිවිට නූල්කැල්ලක් හෝ එල්ලේ. එවැනි අවාසනාවන්ත ඉරනම් උරුමවූ කෙඩෙට් නිලධාරීන් සෑම පාඨමාලාවකම සිටියහ. එම තත්වය ඔවුනට කොතරම් වදයක් හිරිහැරයක් වුවද සෙස්සන්ට නම් සිනා සාගරයකි. කොතරම් දඬුවම් ලැබුවද නාහෙට නාහන කෙඩෙට් නිලධාරීන්ද ඉඳහිට සිටියහ. එවන් අයගේ කරට පාඨමාලාව ආරම්භයේදීම පැක් එකක් වැටෙන්නේ කිලෝ ගණනක කලුගලක්ද සමගය. නොඑසේනම් තැනකින් තැනකට "ලොග් එකක්ද කරතබාගෙන යාමට සිදුවන අවස්ථා යෙදේ. කෙසේහෝ බොහෝවිට ඔවුනගේ එකී බර සැහැල්ලු වෙන්නේ පාඨමාලාව නිමවා අධිකාරි ලැබීමට ආසන්නවය.

කෙඩෙට් පාඨමාලාවල ඇතමුන් කඩේවැසීමද දුලබ තත්වයකි. විශේෂයෙන්ම සාමූහිකව සිදුකළ යුතු ක්‍රියාකාරකම් හා එලිමහනේ අභ්‍යාසවල පිරිසක් උපරිමයෙන් වැඩට කැප වෙද්දී ඒ කිසිවක් නොකර උපදේශකවරුන්ගේද දෑස් මගහැර එලෙස කඩේ වසා සිටින අයද සිටිති. ඇතමෙක් පාඨමාලාවෙන් වැඩි කාලසීමාවක් *MI ROOM* හෝ රෝහල්ගතව *(MRS)* සිටින අවස්ථාද කොතෙකුත් වෙති. අසනීප රපෝර්තු කිරීම ඔවුනට කජු කන්නාසේය. සෙසු සගයන් *Log PT* , *9 Mile* දුවද්දී පෙර කී අයවලුන් රෝහල් ඇඳ මතට වී අසනීපයේ පිහිටෙන් යහමින් නිදාගත් මතක එලෙස සිදුකළ පාඨමාලා සගයින්ගේ නම්ගම් සහිතව අදටද බොහෝ දෙනෙකුට මතක ඇතුවාට සැක නැත. රෝහල තුළ සේම චාර්ජ් බිලට් තුළද පාඨමාලාවේ වැඩි කාලයක් ගතකරන කෙඩෙට් නිලධාරීන්ද වෙති. එක් දඬුවමක් අවසන් වෙද්දී තවත් එවැනි දඬුවමකට ලක්වීම ඔවුනට සාමාන්‍ය දෙයකි. ඇතැමුන්ට තම නිවසට වඩා චාර්ජ් බිලට් එක හුරු පුරුදුය.

කෙඩෙට් ජීවිතයේ ඉහත රසබර කතා ගොන්නක් එම පාඨමාලා හැදෑරූ ඕනෑම අයකු තුළ ඇත. නිත්‍ය ස්වෙච්ඡා පිරිමි "කැඩ්ඩන් යනු "වැඩ්ඩන්ය. ඔවුන්ටද නොහැක්කක් නොමැත. මානසිකව හා කායිකව ඇරඹුමේදී ලබාදෙන රළු පුහුණුව හමුවේ මුලදී එක් අයෙක් දෙන්නෙක් පාඨමාලාව හැරගියද පසුව ඊට හුරුවෙන ආධුනික කෙඩෙට් නිලධාරීන් පසුකාලීනව එලවා දැමුවත් පාඨමාලාව හැර නොයාමට වගබලාගනිති. සිවිල් ජීවිතයේදී දෙමාපිය රැකවරණ යටතේ සුඛෝපභෝගී නොඑසේනම් අලස ජීවිත ගතකළ ඇතමුන් දෙමාපියන්ටද බලකර අධිකාරි ලත් නිලධාරියකු ලෙස කෙසේහෝ තරුවක් පැලඳීමේ ආශාවෙන් පාඨමාලාවට එක්වන අයද සිටිති. නමුත් එවන් අයද ඇරඹුමේදීම එහි ඇති අති දුෂ්කර පුහුණුවේ තරම දැනෙද්දී එම දෙමාපියන්ටම බලකර පාඨමාලාවෙන් ඉවත්වීමට කටයුතු කරන අවස්ථාද තිබේ. ඉන් කියවෙනුයේ අධිකාරි ලත් නිලධාරියකු ලෙස ආඩම්බර කාර වෘත්තියකට පිවිසීම හැමෝටම කළ නොහැකි බවය.

කාන්තා මේ සෑම අයකුගේම කෙඩෙට් පාඨමාලා කාලයේ ඉපැරණි සුන්දර මතක අවුස්සන "කැඩ්ඩන්ගෙ කතා" මෙවර කලාපයේ පටන් මේ පිටුවේ දිගහැරේ. ඔබේ කෙඩෙට් පාඨමාලාවේ ඔබ අත්විඳි නොඑසේනම් ඔබගේ දෑස් ඉදිරිපිට ආසන්නම සගයා අත්විඳි රසබර තොරතුරු අපවෙත ලියා එවන්න. මේ පිටුව ඒ වෙනුවෙනුයි.





එදවස සාමාන්‍ය සෙබළ සනී...

# "තල් සෙවනක ඉතිරි වූ සනී" ගැන මතක

සනී අයියා ගැන වචන පෙළ ගැස්මක් සිදුකළ යුතු යැයි පළමු සිතුවිල්ල හටගෙන් දැනට දශක එකහාමාරකට අධිකය. නමුත්, ඒ සඳහා පන්හිඳ අතට ගැනීමට සුදුසු වෙලාවක් සොයා ගැනීමට නොහැකි වූයේ මන්දැයි   සිතාගැනීම මා හටද අපහසුය. සනී අයියා යනු මෙහි කථා නායකයාය. ඔහුගේ නම සෙ/2එප්02280 සාමන්‍ය සෙබළ සනී එල්ය. මාගේ වසර 32 කට ආසන්න යුද්ධ හමුදා සේවා කාලය තුළ හමුදා සෙබළුන් තමන්ට වඩා වයසින් ජ්‍යේෂ්ඨ සෙබළකු හට ගෞරවාවිත්තව හෝ අයියා යනුවෙන් ඇමතීම සිදුකිරීම හමුදා සම්ප්‍රදාය අනුව කිසිසේත්ම සිදු නොවන්නකි. එසේ වුවද අප එවකට රාජකාරි කළ කන්කසන්තුරය නඩේශ්වර විද්‍යාලය 515 වන බලසේනා මූලස්ථාන කඳවුරේ සියළු දෙනාටම ඔහු අපගේ ආදරණීය සනී අයියාම විය.

පළමුව සනි අයියා දකින විට මා යුද හමුදා සේවා කාලය වසර 03 ක් හා වයස අවුරුදු 21 ක හදු යෞවනයේ කෙලිලොල් අයෙකි. නමුත්, ඔහු ඊට හාත්පසින්ම වෙනස් වයස අවුරුදු 53 ක් පමණ තලත්තැනි වයසට එළඹ තිබූ අයෙකි. සම්පූර්ණයෙන්ම සුදුව තිබූ කොණ්ඩයක් හිමි උපැස් යුවල් පලඳින පරිනත පෙනුමක් ඇති අයෙක් වුවද ඔහුගේ කය පැරණි සෙබළ කඩවසම් භාවය මනාව පිළිබිඹු කළ බව පමණක් මතකයට නැගේ.

එවකට යාපනය අර්ධද්වීපය තුළ තරමක් සුවපහසු යැයි පැවසිය හැකි පලාලි වාසවිලාන් ප්‍රදේශයේ අප විසින් රාජකාරි කරමින් සිටින ලදී. මාගේ සේවා ස්ථානය වූයේ 9 බලසේනා මූලස්ථානයයි. එය හැඳින්වූයේ පැරණි සෙබළුන් දන්නා පරිදි "අඹ සෙවන" කඳවුරයි. ඒ වන විට පැවති මෙහෙයුම් සමග යාපනය ප්‍රදේශයේ සියළු හමුදා අණුඛණ්ඩ ස්ථානගත වීම් වෙනස් වීම් රාශියක් සිදුවූ අතර මා එවකට ආධුනික ලිපිකරුවකු වශයෙන් පුහුණු වෙමින් සිටියේය.

නමුත් හදිසියේ සිදුවූ ස්ථානගත වෙනස් වීම් මත මා රාජකාරි කළ 9 බලසේනා මූලස්ථානය එවකට කන්කසන්තුරය ප්‍රදේශයේ ස්ථාපිත 26 වන බලසේනා මූලස්ථානය හා ඒකාබද්ධ කළ බැවින් 9 වන බලසේනාවේ රාජකාරි කළ වැඩි පිරිසක් නැවත තම ඒකක වෙත ගිය අතර මා ඇතුළු කණ්ඩායමකට කන්කසන්තුරය ප්‍රදේශයේ ස්ථානගත වන ලෙස උපදෙස් ලැබිණි. මා 26 වන බසේමු වෙත පැමිණ දින කීපයකට පසු ටිපින් කැරියර් එකක් (ආහාර රැගෙන යාම සඳහා භාවිතා කරන භාජන) අතින් එල්ලා ගත් කොණ්ඩය සම්පූර්ණයෙන් ශ්වේත වර්ණයෙන් හැරී ඇති උපැස් යුවලක් පැලැඳ සිවිල් කලිසමක් හා කමිසයකින් සැරසී බාටා සෙරප්පු පැලැඳ ප්‍රධාන මුළුතැන්ගෙය වෙත ගමන් කරනා අයෙක් දක්නට ලැබුනි. අප දෙදෙනා මඳ සිනාවකින් එකිනෙකාට සංග්‍රහ කර ගත්තද ආචාර සාමාචාර කිරිමක් සිදු නොවූ අතර ඔහු ඇඳ පැලැඳ සිටි ආකාරය අනුව සිවිල් සේවක මහතෙක්ද යන හැඟීමද මා සිතට නැගුනි.

මෙලෙස ඉතා කෙටි කලක් තුළ 26 බලසේනාව යලි 9 බලසේනාව වශයෙන් නාමයන් වෙනස්වීම අප කණ්ඩායමේ බලවත් ප්‍රීතියට හේතුවූහ.

කෙසේ නමුත් මේ වන විට සිදුවූ වෙනස්කම් සමග පුද්ගලිකව මාගේ රාජකාරි ජීවිතයේද යම් වෙනස්කම් සිදුවිය. මෙතෙක් කල් කනිෂ්ඨ සහයක ලිපිකරුවකු වශයෙන් රාජකාරි කරමින් සිටි මා විෂය භාර ලිපිකරුවකු වශයෙන් පළමු වරට පත්කළේය. ප්‍රධාන වශයෙන් ස්ථානමාරු

කිරීම හා ප්‍රවාහන/හටකාර්ය සම්පාදනයට අදාළ වැදගත් ලිපි ගොනු රාශියක් මා භාරයට පත් විය. දිනක් මා බලසේනාවේ නිත්‍ය කාර්ය මණ්ඩලයේ නාමලේඛණ පරීක්ෂා කරමින් සිටියදී සෙ/2එප්02280 සාසෙ සනි එල් යනුවෙන් නමක් කෙරහි අවධානය යොමු විය.

මොහු වැටුප් හා විශ්‍රාම වැටුප් පදනම මත නැවත හමුදාව වෙත බඳවා ගත් අයෙක් බවත් 1996.06.15 දින සිට 26 වන බසේමු වෙත ඇතුළත් කර ඇති බවත් ලිපිලේඛණවල සඳහන්ව තිබුණි. මේ වන විට මා විෂය ලිපිකරු වශයෙන් කඳවුරේ රාජකාරි නියුතු සියළු අයගේ නාමලේඛණ සකස් කර ඔවුන් නාමිකව හා යම් ප්‍රමාණයකට භෞතිකව දැන හඳුනාගෙන අවබෝධයක් ලබා ගෙන තිබුණද සාසෙ "සනී එල්" යනු කවුද යන්න පිළිබඳව මතකයක් නොමැති බැවින් කාර්‍යාලයේ මාගේ අසුනේ සිටම අනෙක් සගයන්ගෙන් කවුද මේ සනි කියන්නේ යනුවෙන් විමසීමක් කරන ලදී. එවිට ලැබුණ පිළිතුර වුයේ "උබ මේ කෑම්ප් එකට ඇවිල්ලා කොච්චර කල්ද තාම සනී අයියාව අඳුරන්නැද්ද" යනුවෙනි.

එවිට ලැබුන තොරතුරු සාරාංශයක් වශයෙන් පැවසුවහොත් සනි අයියා දකුණේ ගාල්ලේ පැරණි වංශවත් පවුලකින් පැවත එන සොහොයුරු/සොහොයුරියන් රාජ්‍ය සේවයේ උසස් තනතුරු දරා ඉන් විශ්‍රාමික වූ ඉතා හොඳ පවුල් පසුබිමක් හා වැදගත් ඥාති මිත්‍රාදීන් සිටින පවුලක අයෙක් බවය. ඔහු හොරණ ශ්‍රීපාලි විද්‍යාලයේ නේවාසිකව අධ්‍යාපනය ලබා ඇතත් එය උසස් ලෙස එය නිමා කිරීමට නොහැකිව තිබී ඇත්තේ තරුණ වියේ කෙලිලොල් ජීවිතයට හුරු වීම හා මධුපානයට තරමක් ඇල්ම වැඩි වීම බව කථා බහෙන් වැටහිණි. එසේම ඔහු 1965 වර්ෂයේ 2(සේව) ගැමුණු හේවා බලඇණියට බැඳී ඇත්තේ එවකට රාජ්‍ය ආයතනයක් වූ තුනිලෑලි සංස්ථාවේ සේවය කරමින් සිටියදී බවත්ය. එසේ එවකට පැවති තත්ත්වයන් මත වරින් වර සේවයට කැඳවූ අවස්ථාවේ පැමිණ සේවය කරන අතරම සිවිල් රැකියාවද කරමින් සිටියදී යුද හමුදාවෙන් ඉවත්ව ගොස් ඇති බවත් පසුකාලීනව තුනීලෑලි සංස්ථාවද වසා දැමූ බැවින් නැවත යුද හමුදාවට එක්වී රාජකාරි කරමින් සිටි බවයි. වැටුප් හා විශ්‍රාම වැටුප් පදනම මත බඳවා ගත්තද නියමිත සේවා කාලයට පෙර සේවයෙන් ඉවත් වීම නිසා ඔහුට ඇත්තෙන්ම විශ්‍රාම වැටුපක් නොලැබුන අතර දැනට කරන සේවය සඳහා වැටුප පමණක් ලැබුනි. එසේම ඔහුගේ වයස අවුරුදු 53 ක් පමණ ඉක්මවා ඇති බැවින් සැහල්ලු රාජකාරියක් වන සැරයන් නිවස්නයේ පරිපාලන කටයුතු වල යොදවා ඇති බවයි. එවිට මා හට සිහිපත් වූයේ දින ගණනාවට ඉහතදී මා හට හමුවී ළබැඳි සිනහවකින් සංග්‍රහ කළ ඔහු හා සනී යනු එක් අයෙක් බවයි.

එසේ වුවද ඔහු හා මා අතර ගැඹුරු මිතුදමක් ඇති වීමට තවත් කාලයක් ගතවූ බවද කිව යුතුය. එයට බලපෑ හේතුව තරමක් හාස්‍යජනකය. එවකට අප බලසේනාවේ ප්‍රධාන ලිපිකරු වශයෙන් රාජකාරි කලේ යුධෝපකරණ බළකායට අයත් බලලත් නිළධාරිවරයෙකි. ඔහු වෘත්තියෙන් ලෙජර් ලිපිකරුවෙක් බැවින් බලසේනාවක ප්‍රධාන ලිපිකරු තනතුරේ රාජකාරි සම්බන්ධයෙන් විශාල අවබෝධයක් නොතිබුණි. විශේෂයෙන් ඔහු යටතේ පැවති කඳවුරේ දෛනික රාජකාරි ලේඛණය නිසි පරිදි මෙහෙයවා රාත්‍රි රාජකාරි සඳහා සෙබළුන් නම් කිරිම නිසි අයුරින් සිදු නොකරන බව චෝදනා රාශියක් එල්ල වෙමින් පැවතිනි. ඔහුගේ මුහුණට පැවසීමට කිසිවෙක් එඩිතර නොවුනද මේ පිළිබඳව හටනිවාස වල හාස්‍ය දනවන මෙන් කෝපාන්විත චෝදනා නිතරම එල්ල වූ අතර මා ද එම කණ්ඩායමට අයත් විමි. එයට හේතුව ඇතැම් සෙබළුන් දින 4 - 5 ක් එකම මුරකුටියේ අඛණ්ඩව රාජකාරියේ යෙදවීමත් ඇතැම් සෙබළුන් ඒ හා සමාන දින ගණනක් රාජකාරියෙන් නිදහස්ව හටනිවාසයේ රැඳී සිටීමත්ය. මා බොහෝ විට සිටියේ ආසාධාරණයට ලක්වූ කණ්ඩායමේ බැවින් රාජකාරි නිදහස් වන කණ්ඩායමේ උසුළු විසුළුද දරා ගත නොහැකි විය.

මේ පිළිබඳව තවදුරටත් දරා ගත නොහැකි වූ අප කීප දෙනෙක් මේ පිළිබඳව බලලත් නිළධාරි හමුවී ආසාධාරණය පැවසීමට තරම් නිර්භීත විය. කෙසේ වෙතත් ඉතා කාරුණික හා අහිංසක පුද්ගලයකු වූ බලලත් නිළධාරි වහාම තමාගේ වරද පිළිගෙන රාජකාරි ලේඛණයේ වැරදි සහගත තත්ත්වය නිවැරැදි කිරීමට පොරොන්දු විය. දින කීපයක් ගතවෙද්දී සිදුවුයේ රාජකාරි පිළිබඳ ප්‍රශ්ණ ඉදිරිපත් කළ අප රාජකාරිවලින් දින ගණනක් නිදහස් වීමත් අනෙක් සෙබලුන් හට අපට පෙරදී සිදුවූ සන්තෑසියට මුහුණ පෑමයි. දැන් අපගේ වාරය වූ බැවින් අපද සුපුරුදු ලෙස ඔවුන් හාස්‍යට ලක්කර සිනාසීමට වුවද දින කීපයක් තුළ නැවතත් පැරණි තත්ත්වයට මුහුණ පෑමට අපට සිදුවිය. අවසානයේදී අප සැමට අවබෝධ වූයේ අප බළලත් නිළධාරි රාජකාර ලේඛනය නිසි පරිදි හසුරුවා ගැනීම සම්බන්ධයෙන් දැනුමක් නොමැති බවයි. අප සැම කතිකා කර ගත්තේ බළලත් නිළධාරි රාජකාරි ලේඛණය සකස් කරනවිට අප එම ස්ථානයට ගොස් ඔහුට සුදුසු පරිදි දැනුවත් කිරීම ඉතා සුදුසු බවයි. කෙසේ නමුත් දින කීපයක් විපරමින් සිටියද බලලත් නිළධාරි රාජකාරි ලේඛණය සකස් කරන වේලාවක් කාර්‍යාලය වේලාව තුළදී සොයා ගැනීම නොහැකි වීම අප සැමගේ බලවත් විමතියට හේතුවිය. පසුව මෙය තවත් එක් සිද්ධියක් ලෙස සලකා අමතක කර දැමීමට තීරණය කර සුපුරුදු දින චර්යාවේ නියුක්ත වීමට තීරණය කරන ලදී.

එක් දිනක් හදිසියේ ප්‍රධාන ලිපිකරු මා අමතා යම් රාජකාරියක් පැවරූ අතර සැරයන් නිවස්නයේ රාජකාරි නියුතුව සිටි සනි අයියා හමුවී අවැසි ලිපිගොනුවක් ලබා ගන්නා ලෙසද උපදෙස් ලැබුනි. ප්‍රධාන කාර්යාලයේ සිට සැලකිය යුතු දුරක් සැරයන් නිවස්නයට තිබුණද දිවා කාලයේ කාර්යාලයෙන් පිටතට පැන යාමේ ප්‍රබෝදය සමඟ මා මිටින් හල කුරුල්ලකු මෙන් සැරයන් නිවස්නය වෙත පියමැන්නේ උදාසන සිට නියුක්තව සිටි වෙහෙසකර කාර්යයන්ගෙන් මදක් මිදීමේ සැහැල්ලු හැඟිමත් සමඟය. ඒ අනුව මා සැරයන් නිවස්නයේ පිටුපස ගේට්ටුවෙන් ඊට ඇතුළු වී හාත්පස බැලුවද සනී අයියා හෝ වෙනත් කිසිවකු දකින්නට නොලැබුණි.

දිවා විවේක වේලාව ආරම්භ වී නොමැති බැවින් කිසිවකු නිවස්නයේ නොමැති වීම අරුමයක් නොවුනද හිස්ව තිබූ ගොඩනැගිලි අතරින් ගොස් විවෘත කර ඇති ජනේලයක් අතරින් එබී බැලුවේ කිසිවකු සිටීද යන්න පිළිබඳව සොයා බැලීමට වුවත් දුටුවේ බලාපොරොත්තු නොවූ දර්ශණයකි. එනම් සනි අයියා කාමරයේ ඇඳක් මත දිගාවී යම් කිසි පොතක් කෙරේ අවධානය යොමු කරමින් තවත් කොළයක යමක් සටහන් කරමින් සිටි බවයි. මා යම් කුතුහලයක්ද සමඟ තවමත් මාගේ පැමිණීම නොදත් ඔහු කරමින් සිටි කාර්යය කුමක්ද යන්න හඳුනා ගැනීමට උත්සාහ කළ අතර එහිදී මා එක්වරම දුටුවේ කඳවුරේ රාජකාරි නාමලේඛණ පොත ඔහු අතේ තිබූ බවත් කොළයක රාජකාරි සෙබලුන්ගේ නාමලේඛණය ලියන අයුරුය. තවදුරටත් නිහඬව සිටීම සුදුසු නැති බව හැඟී ගිය බැවින් මා අකල් කැස්සක් මඟින් මාගේ පැමිණීම සනිටුහන් කළේය.

වහා ක්‍රියාත්මක වූ ඔහු ඇඳෙන් නැගී සිටියේ රාජකාරි



සනී අයියා යුද සමයේ (වම්පස) සහ වර්තමානයේ (දකුණු පස) දැක්වෙන අයුරු

පොත හා ලේඛණ සඟවා ගැනීමට අසීරු උත්සාහයක නියැලෙමිනි. ඔහු උපැස් යුවලද සකස් කර කමිසයක් ඇඟට දමා ඉදිරියට පැමිණ මාගේ අවශ්‍යතාවය විමසන ලදි. මා විසින් බලලත් නිළධාරි විසින් ලබා දුන් පණිවිඩය දැනුම්දුන් අතර ඒ අනුව ලබා දුන් ලිපිගොනුවද රැගෙන පිටත්ව යාමට පෙර මා පැමිණෙන විට ඔහු කුමන කාර්යයක නියැලී සිටියේද යන්න සුහදව විමසන ලදි. එහිදී ඔහු පැවසුවේ නිවසට ලිපියක් ලියමින් සිටි බවයි. එවිට මා පැවසුවේ ඔහු නියුක්තව සිටි කාර්‍යය මා හොඳින් දුටු බවයි. එවිට ඔහු මහත් කලබලයට පත් වී වචන පැටලෙන තත්ත්වයට පත් වූ විට තවත් දුෂ්කරතාවයකට ලක් කිරීමට අකැමති වූ මා ඔහුගෙන් විමසුවේ බලලත් නිළධාරි විසින් සිදුකළ යුතු රාජකාරි නම් කිරීම් ලේඛණය ඔහු විසින් සිදුකරනුයේ ඇයිද යන්නයි. ඔහු මහත් බැගෑපත්ව මාගෙන් ඉල්ලා සිටියේ මේ සැබැවිව කිසිවෙකුට නොකියන ලෙසත් බලලත් නිළධාරි හට මේ පිළිබඳව අවබෝධයක් නොමැති බැවින් රාජකාරි ලේඛණය සකස් කිරීම සඳහා ඔහුගේ උපකාර ඉල්ලා සිටි බවත් මේ ගැන කිසිවකුට නොපවසන ලෙසත්ය. මා ඔහුට පොරොන්දු වූ අතර නමුත් රාජකාරි නම් කිරීම සාධාරණ අයුරින් සිදු කරන ලෙස ඉල්ලීමක් කරනු ලැබීය. ඒ සැබැවිව මා විසින් යම් උපදෙස් කීපයක්ද ඔහු වෙත දැනුවත් කරන ලදි. ඉන් පසු රාජකාරි ලේඛණය සකස් කිරීම යම් සාධාරණත්වයක් දුටු අතර මා ද එය රහසක් වශයෙන් ආරක්ෂා කරනු ලැබුවේ ඇත්ත වශයෙන් එය අනෙක් අයවළුන් දැන ගැනීම විවිධ ප්‍රශ්න වලට හේතුවක් විය හැකි බැවිනි. අප අතර සුහද සබඳතාවයක් ආරම්භ වීමට මූලික වූ සිද්ධිය මෙයයි.

කෙසේ වෙතත් සනී අයියා නිළ ඇඳුමින් රාජකාරි කිරීම අප එතෙක් දැන නොමැති සිදුවීමක් විය. ඔහුගේ වයස අනුව කිසිවෙකු ඔහු හට එවැනි විශේෂිත රාජකාරි නොපැවරූ අතර සැමගේ කරුණාව ඔහුට හිමි විය. එසේ නොමැති ඉතා සුළු පිරිසක්ද විය. ඉහත සිදුවීමත් සමඟ ඔහු හා මා අතර දැඩි මිතුරුදමක් ඇතිවූ අතර ඔහු ද මා ප්‍රිය කරන බව පෙනේනට තිබිණි. කාලය ගතවීමත් සමගම සනී අයියා හට රාජකාරි වශයෙන් යම් ගැටලු සහගත තත්ත්වයන් ඇතිවිය. කඳවුරේ ඉතා අතලොස්සක් මේ අසරණ මනුෂ්‍යයා දෙස වපරැසින් බලා ඔහුගේ රාජකාරි ඵලදායිතාවය ප්‍රශ්න කිරීමේ පහත් අඩියට වැටුණි. මෙය උසස් නිලධාරීන් අතරටද ගිය අතර ඇතැමුන් පැවසුවේ ඔහුට වැටුප් දෙකක් ලැබෙන බැවින් මීට වඩා සේවයක් සිදුකළ යුතු බවයි. ඔහු නිල ඇඳුම් පැලැඳ කීප වතාවක්ම නිලධාරීන් හමුවීමට කාර්යාලයට පැමිණි අයුරු මා දුටුවේය. ඔහු ගැන හොඳින් දන්නා මා හට මෙය ඉතා සංවේදී කරුණක් වූ නමුත් කළ හැකි දෙයක් නොවීය. මේ අසරණ මිනිසා සොවින් බර මුහුණින් කඳවුරේ ගමන් කරන අයුරු මා කීප දිනක්ම දුටුවද ඔහුට මානසිකව හිරිහැර කිරීම නැවතීමක් නොවිණි. අවසානයේදී ඔහුගේ රාජකාරි ස්ථානය මාරු කර සෙබළුන්ට ආහාර සකස් කර භෝජනාගාරයේ අරක්කැමියන්ට සහය වීම සඳහා යෙදවීමේ තීරණයක් ලැබුණි.

ඔහුගේ මුහුණේ ශෝකයක් තිබුණද පසුව ඔහු තුළින් යම් තෘප්තිමත් භාවයක් දුටුවේ ඔහුට ලැබී තිබුණ රාජකාරිය ඉතා උසස් අයුරින් ඉටු කරනු දැකීමෙනි. මා ආහාර ලබා ගැනීමට යන සෑම අවස්ථාවේම ඔහු හා කථා කර හිත සැනසෙන වචන කීපයක් කථා කිරීම පුරුද්දක් කර ගෙන තිබිණ.

ඇත්ත වශයෙන් බොහෝ දෙනෙක් සනී අයියා ගැන වැරදි චිත්‍රයක් මවා ගෙන සිටියේ ඔහු විශ්‍රාම වැටුප හා වැටුප වශයෙන් වැටුප් 02 ක් ලබා ගනිමින් ඉතා අඩු සේවයක් ඉටු කරන බවයි. මා මේ ගැන ඔහුට පහදා දුන් විට ඔහු ඉතා සංවේදීව පැවසුවේ ඔහුට දැන් තබා වයස අවුරුදු 55 වන තෙක් සේවය කළද ඇතැම් විට විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසු පරිදි වසර 22 ක සේවා කාලයක් සම්පූර්ණ නොවන බවයි. එවිට මා ද සිතින් ඔහු බැඳුන දිනය සේවයෙන් ඉවත් වූ දිනය නැවත බැඳී වසර 55 සම්පූර්ණවන දිනය ගණනය කර එය සත්‍යක් බව වැටහී ඔහු දෙස බලන විට දුටුවේ ඔහුගේ දෑස් අග නලියන කඳුළු කැටය. විවාහය අබිමුව සිටින තරුණ දියණියන් දෙදෙනෙක් පාසැල් අධ්‍යාපනය ලබන පිරිමි දරුවෙක් හා ඉතා ළාබාල වියේ සිටින නිවුන් දැරියන් දෙදෙනකුගේ අනාගතය ඔහු ඉදිරියේ විය. ඔහු මා හට පැවසුවේ මේ පිළිබඳව සොයා බලා පිළිතුරක් ලබා දෙන ලෙසයි. ඒ අනුව මා ඒ වගකීම භාරගත් අතර මේ ගැන සොයා බලන බවට සැනසිලිදායක පිළිතුරක් ද දුන්නේය.

පසුව මා දන්නා සෑම උත්සාහයක්ම ගෙන සෑම අයුරින්ම ඔහු හට විශ්‍රාම වැටුපක් සකස් කිරීම ගැන විමසා බැලුවද ලැබුණ සියලු පිළිතුරු සුබවාදී නොවීය. ඔහුට විශ්‍රාම වැටුපක් කිසිසේත්ම හිමි නොවන බව මා එක් දිනක් බලවත් අකමැත්තෙන් වුවද ඔහුට පැවසීමට සිදුවිය. එවිට ඔහු මාගෙන් අසා සිටියේ "ධම්මික මට කවදාවත් විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට විදියක් නැද්ද" යන්නයි. හදවත සොවින් බර වුවද කටුක යථාර්ථය පහදා දීම මාගේ යුතුකමක් විය. නැවත දෙනෙතින් වැටුන කඳුළු පිස දමමින් ඔහු මාගෙන් විමසා සිටිය ප්‍රශ්නය වුයේ "සෙබළෙක් ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය ගියහොත් ඔහුගේ පවුලේ අයට වැටුප් හා දීමනා ලැබෙනවා නේද?" යන්නයි. මා පැවසුවේ එය සාමාන්‍ය ක්‍රමවේදය බවත් සෙබළෙකු මිය ගියහොත් බිරිඳ ජීවත්ව සිටින තාක් හා වයස අඩු දරුවන්ට වැටුප හා දීමනා දිගටම ලැබෙන බවත්ය. සනී අයියාගේ ඊළඟ වචනය වූයේ ධම්මික මාගේ එකම බලාපොරොත්තුව ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය යාම බවත් ඉන් පසු පවුලට ලැබෙන වැටුපෙන් ඔවුන් හට ජීවත් විය හැකි බැවින් සැනසීමෙන් දෑස් පියා ගත හැකි බවයි. මාගේ හෘද ස්පන්දනය පවා මොහොතකට නැවතුන අතර උගුරේ යමක් හිරවුවා සේ දැනුනි. මේ ලෝකයේ සෑම පියෙක්ම මෙසේ නොවේද, තමාගේ පවුල රකින්නට දිවා රෑ වෙහෙසී මුළු දිවියම පවුල රැකීමට දියකර අවසානයේ තමාගේ මරණයෙන් පවා දරු පවුල සුරකින්න වෙර දරන සනී අයියලා වැනි දේවත්වයෙන් පිදිය යුතු තාත්තලා මේ ලෝකයේ කොතරම් ඇද්ද, ඔහුගේ එම වචනයම මුළු මනුෂ්‍ය ජීවිතයේ එක්තරා පැති කඩක් විද්‍යාමාන වනවා නොවේද. කෙසේ නමුත් ඒ අවස්ථාවේ මා පැවසුවේ මුදල් වලට වඩා ඔහුගේ ජීවිතය පවුලේ අයට බොහෝ වටිනවා බව වුවද ඔහු පැවසුවේ දැනටද ලැබෙන වැටුප ඉතා අමාරුවෙන් සකසුරුවම් කර ගන්නා විට විශ්‍රාම වැටුපක් නොමැති වූ විට බිරිඳ දරුවන්


විදිනා ගැහැට දකිනවාට වඩා මිය ගොස් හෝ ඔවුන් හොඳින් ජීවත් වීම එකම ප්‍රාර්ථනාව බවයි.

ත්‍රස්තවාදී ප්‍රහාර ඉතා සුලභ හා ගුවන් අනතුරු නිතර සිදුවූ එම වකවානුවේ අප සැමගේ ජීවිත තිබුනේ බලාපොරොත්තු විරහිත තත්ත්වයකය. ඔහු කළ මෙම උතුම් ප්‍රාර්ථනාව මේ දක්වා ඔහුගේ බිරිඳ හා දරුවන් නොදන්නා අතර දන්නා එකම කෙනා මා පමණි. මා එය ඔහු  ජීවත් වන තුරු ඔවුන්ට නොපැවසීමට අදහස් කර සිටිනා අතර මට පෙර ඔහු මිය ගියහොත් පමණක් ඔවුන්ගේ පියා ඔවුන් ජීවිත වෙනුවෙන් කරන ලද උත්තුංග ප්‍රාර්ථනය පිළිබඳව දැනුවත් කිරීමට අදහස් කරමි.

සනී අයියාගේ ප්‍රිය බිරිඳ ඔහුගේ අදහස් අනුවම ක්‍රියාකළ ඉතා සකසුරුවමින් පවුල ගොඩනැගීමට වෙහෙස වූ කාන්තාවක් විය. එම දිනවල පලාලි දක්වා ගුවන් ගමන් පහසුකම් බලාපොරොත්තුවෙන් රත්මලාන අතරමැදි කඳවුර වෙත පැමිණෙන අප හට ගුවන් ගමන් ප්‍රමාද වූ විට වෙනත් කළ යුතු දෙයක් නොමැතිකමින් ආසන්නයේ පිහිටි මිතුරන්ගේ නිවාස වෙත ගොස් ආගන්තුක සත්කාර විඳ ගැනීම පුරුද්දක්ව තිබිණ. එක් දිනක් සනි අයියා සහ මම ද රත්මලාන කඳවුරේදී මුණ ගැසී ගාල්ලේ පිහිටි ඔහුගේ නිවස වෙත ගියෙමි. පැරණි ලන්දේසි ගෘහ නිර්මාණ ක්‍රමයට සකස් කළ විශාල නිවසක් වූ සනී අයියාගේ කුටුම්භය සැබැවින්ම සතුටු සිනා පිරි එකක් විය. ගෘහපතිනිය විසින් දකුණු ලක සම්ප්‍රදායට සකස් කළ අලුත් මාළු ඇඹුල් තියල් සමඟ රසවත් ආහාර වේලක් භුක්ති විඳ කඳවුරට නැවත පැමිණීමද අතීත සැමරුම් ගොන්නේ තැන්පත්ව ඇත. ටික කාලයක් අප සමගම එක්ව රාජකාරි කර පසු වයස 55 සීමාවට පැමිණ සනි අයියා හට යුද හමුදාවෙන් ඉවත්වයාමට සිදුවූ අතර අපගෙන් සමුගෙන ගියේ ඇත්තෙන්ම අප හදවත් බිඳ දමමින.

වසර ගණනාවකට පසු ඔවුන්ගේ ජීවිතවල මහා වෙනස්කම් රැසක් සමගින් සනි අයියා සමඟ පවුල මහරගම ප්‍රදේශයට සංක්‍රමණය වනුයේ මූලික වශයෙන් දරුවන් කොළඹ රැකියා තෝරා ගැනීමත් සමඟය. ගාල්ලේ නිවස විකිණීම සිත් රිදීමක් වුවද, එමගින් මහරගම ප්‍රදේශයේ නිවසක් මිලදී ගෙන ජීවිතයේ සැඳෑසමය පුතු සෙවනේ ජීවත්වීම සනි අයියාට උරුම වී ඇත. එදා සටන්බිමේ සතුරා සමඟ එක්ව සටන්වැදි සහෝදර බැම්වල ශක්තිමත්භාවය විදහා දක්වමින් එකම කඳවුරේ රාජකාරි කළ අප කීප දෙනකු ඔහුගේ දුක සැප බැලීමට වසර 25 කට පමණ පසුව ඔහුගේ මහරගම නිවසට ගොඩවැදීම ඔහුගේ ජීවිතයේ වඩාත්ම සතුටුදායක දිනය බව පැවසුවේ දෙනෙතින් රූරා වැටෙන කඳුළු මධ්‍යයේය.

සනි අයියා ඇතුළු අප සැම සාමාන්‍ය තරමට මධුවිතකින් සප්පායම් වී වසර 25 අතීත කථා සැමරුවේ සිනාවෙන් හා හැඟුම්බරවය. සනි අයියා පැවසුවේ අප සැම හමුවන මෙම දිනය එළඹෙන තෙක් ඔහු බොහෝ කාලයක් බලා සිටි බවත් දැන් ඔහුට සුවසේ දෑස් පියාගත හැකි බවයි. ඔහුගේ කාමරයේ ඇඳ අසල කුඩා මේසයක ඡායාරූප ඇල්බම් කීපයකි. එය අප සමඟ කන්කසන්තුරය කඳවුරේ ගතකළ සොඳුරු සමයේ සිහිවටනයන්ය. ඒවා ඔහු නිතර බලන බව පෙනෙන්ට තිබිණි. එමගින් අපගේ ස්වර්ණමය යුගය වෙත පියමන් කර දැන් සිටින කයෝර්යුගය වෙත පැමිණෙනු ඇත. බොහෝ සොඳුරු මිනිසුන් නොකියාම තම ජීවිත පුද කර තම යුතුකම ඉටු කර නිහඬ විය . සනි අයියා අප ඇතුළු කීප දෙනෙක් තවමත් නොතිත් ජීවන අරගලයේ යෙදෙමින් අතීතයේ ස්වර්ණමය මතකයන් හා සොඳුරු මිනිසුන්ගේ ආවර්ජනා අතර මැදි වී සිටිමි. එදා සැන්දෑ යාමයේ මලහිරු බැස යන මොහොතේ අප සනි අයියාගෙන් සමුගෙන පැමිණෙන විට ඔහුගේ දෙනෙතේ තිබූ කඳුළු බිඳු මට අද ද සිහියට නැගේ. ඒ අප මුණ ගැසුන අවසන් අවස්ථාව විය හැක. ජීවිතය එසේය. ගඟක් කිසි විට ඉහලට ගලන්නේ නැත. අප ජීවිතද එසේමය සැම විට පහළට ගලා යනු ඇත.




මේජර් ධම්මික කාංචන
නිලධාරී අණදෙන
බී කණ්ඩායම
3(සෙෂම) විපාරෙ


# 2025

# “රණවිරුවා”ට


## ඔබේ ලිපි නිර්මාණ ඕනෑ



සමස්ත යුද්ධ හමුදාවම නියෝජනය කරන එකම සඟරාව වන "රණවිරුවා" වසර ගණනාවක පටන් අඛණ්ඩවම ඔබ අතට පත්කෙරේ. යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන විශේෂිත සිදුවීම් මෙන්ම ක්‍රීඩා, සාහිත්‍යය, අධ්‍යාපනික, විදෙස් හා ඉතිහාස තොරතුරු වඩා විචිත්‍රවත් ලෙස හා හරවත්ව එළිදක්වන රණවිරුවා ඔබගේ දැනුම හා රසාස්වාදය පිණිස මාහැඟි පිටිවහලක් වී ඇති බැව් අප වෙත නිරතුරුව ලැබෙන ලිපි හා ඇමතුම් මගින් සනාථ වේ.

එහෙත් විවිධ අංශ අපව වෙත ලිපි සහ නිර්මාණ යොමුකළද යුද්ධ හමුදාවේ ඇතැම් ආයතන වෙතින් තොරතුරු ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. එනිසාම යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන බොහෝ ක්‍රියාකාරකම් පිළිබඳව සෙසු අය දැනුවත් නොවන තත්ත්වයක් පවතී එබැවින් ඔබගේ ඒකකයේ, රෙජිමේන්තුවේ, බලසේනාවේ, පුහුණු පාසලේ හෝ කුමන ස්ථානයක වුවද සිදුවන විශේෂ වැදගත්කමින් යුත් තොරතුරු ඇත්නම් අපවෙත යොමු කරන්න. අප ඒවා අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. එසේම, රණවිරුවා යුද්ධ හමුදාවට පමණක් සීමා නොවන්නකි. බාහිර පාඨකයන්ගේ ලිපි, නිර්මාණ, ඡායාරූප හා කාලීන තොරතුරු වෙනුවෙන්ද එහි නිරතුරු ඉඩකඩ වෙන්කොට ඇති බව සතුටින් දැනුම් දෙන්නෙමු. මාසිකව නොමිලේ ඔබ අතට පත්වෙන රණවිරුවා සඟරාව මගින් පාඨක ඔබගේ නිර්මාණශීලී හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් දැනුම හා තොරතුරු බෙදාහදා ගැනීමට එකතුවන්න.

- සංස්කාරක



*සපුගිය කලාපය හා සම්බන්ධයි..*

# "දෛනික ජීවිතයේ ප්‍රීතිය හා තෘප්තිය හඹා යෑමේ ජපන් සංස්කෘතික මූලධර්ම"




▪ දිල්මි ශානුකී
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
කොළඹ 07


## 01 සරල සතුටක් අත්විඳීම (Savor a Simple Pleasure)

අනේකවිධ හැල හැප්පීම් මධ්‍යයේ ජීවන අරගලයට මැදිව සිටින අපට "සතුට, තෘප්තිය හා ප්‍රබෝධය" වැනි යෙදුම් හුදෙක් වචන පමණක්ම වන අවස්ථාවන් සුලභය. එවන් වටපිටාවක තමා පත්ව සිටින අර්බුධයෙන් ගොඩ ඒම සඳහා සිය උපරිම ශක්තිය යෙදවීමේ දී ජීවිතයේ සතුට සැනසීම පළා යන්නේ ක්ෂණයකිනි. ජීවිතයේ එක් එක් කාලපරිච්ඡේද පසු කිරීමේ දී "සොබාදහම" නමැති අපූර්ව පර්යේෂණාගාරය විසින් අපව නිරන්තරයෙන් විවිධ ක්‍රමවේදයන් හරහා පරීක්ෂාවන්ට ලක් කරනු ලබයි. එනම්, එකිනෙකා පරීක්ෂා කිරීම වෙනුවෙන් සුවිශේෂී වූ ක්‍රමවේදයන් ඇත. බලාපොරොත්තු නොමැති අවස්ථාවක දී ජීවිත උඩු යටිකුරු කරවීමට සමත් මෙකී සිදුවීම් අභියෝගාත්මක ස්වරූපයෙන් පැන නඟිනුයේ අදාළ අවස්ථාව සම්බන්ධයෙන් පූර්ව ඉඟියක් හෝ ලබා නොදෙමිනි. එසේ වන්නේ ඇයි දැයි කියා සොයා බලන්නට කාලයක් මෙන්ම අවකාශයක් හෝ නොමැතිව අප්‍රමාදීව ඊළඟ පියවර වෙත ගමන් කරන්නට සිත දිරිමත් කරගත යුතුය. අදාළ අභියෝගය හමුවේ කඩා වැටෙන්නට හෝ හඬා වැටෙන්නට යාමෙන් හීන වන්නේ එම අවස්ථාවට දිරිමත්ව මුහුණදීම වෙනුවෙන් අප තුළ නිදන්ගතව ඇති ශක්තිය බව මනා සිහියෙන් අවබෝධ කරගත යුතුය. අභියෝගාත්මක සිදුවීමට මුහුණදිය යුත්තේ කෙසේද යන්න විමසීම සඳහා මොහොතකට විරාමයක් ලබාගෙන නැවත නැඟී සිටිය යුතු අතරම, අදාළ පරීක්ෂාවන්ගෙන් සමත් විය යුතුය. මේ සඳහා අවශ්‍ය ශක්තිය අප තුළ වර්ධනය කරගැනීමට පොදුවේ අනුගමනය කළ හැකි ඉතාමත් පහසු ක්‍රියාකාරකමක් ලෙස "සරල සතුටක් අත්විඳීම" වැදගත් කරුණක් වන බැවින් එය ප්‍රගුණ කිරීමට Erin Niimi විසින් "A Little Book of Japanese Contentments" ග්‍රන්ථය හරහා අපව දිරිමත් කරයි.

ඉතාමත් සරල දේවල් මූලික කොටගෙන එයට වැඩි වටිනාකමක් එකතු කර ඉහළ ආශ්වාදයක් ලබාගැනීම වෙනුවෙන් ජපන් සංස්කෘතිය තුළ වැඩි ඉඩකඩක් ලබාදෙයි. සතුට යනු ලබා ගැනීමට අපහසු, ළඟා විය නොහැකි මිල අධික දෙයක් නොවන බවත්, එය හඹා යන්නවුන් හට ඉතාමත්ම කුඩා සරල භෞතික වස්තුවක්, යම් පුද්ගලයෙක්, සිදුවීමක් හෝ අවස්ථාවක් සම්බන්ධයෙන් ඇති මතකයක් හෝ සිතිවිල්ලක් වුවද ප්‍රමාණවත් බව ජපන් ජාතිකයින්ගේ විශ්වාසයයි. වැස්සට සවන් දීම, හිරු බැස යන ආකාරය නැරඹීම, මුහුදු වෙරළෙහි සුන්දරත්වය අත්විඳීම මෙන්ම තමන් වඩාත්ම ප්‍රිය කරන ස්ථානවල සංචාරය කිරීම මඟින් එදිනෙදා අප ගෙවන කලබලකාරී ජීවිතයේ වේගය අඩුකර සතුට වගා කරගත හැකි බවට ජපන් ජාතිකයින් සාක්ෂි ලබා දී ඇත. එමෙන්ම ස්වභාව සෞන්දර්යාත්මක ඡායාරූපකරණය, තමන් කැමති ගීතයකට නැතිනම් සංගීතයකට සවන් දීම, උණුසුම් තේ කෝප්පයක් රස විඳීම, කැමති ආහාරයක් පිළියෙළ කිරීම, තමන් වඩාත් ඇලුම් කරන ලේඛකයාගේ පොත්පත් මෙන්ම පුවත්පත්, සඟරා ආදිය කියවා රසවිඳීම පමණක් නොව වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය හා චිත්‍රපට නැරඹීම මඟින් ලබා ගන්නා

වූ ආශ්වාදය තුළින් ද සතුට වපුරන්නට හැකි බව ඔවුන් පසක් කර දෙයි. එමෙන්ම තම සිතැගියාවන් ලේඛන කලාව සමග සම්බන්ධ කරවීම තුළින් ද මනස නිරවුල් කර ගැනීමට මහගු පිටුවහලක් සපයනු ලැබේ. තම ජීවන අත්දැකීම් කවියකට, ගීතයකට හෝ නිසදැසකට පෙරළා නිර්මාණය කර රසවිඳීම තුළින් ලබන මානසික තෘප්තිය මෙතෙකැයි කියා නිම කළ නොහැක.

ජීවන අරගලය සමග පොර බදිමින් ජීවිතය ඉදිරියට ගලාගෙන යැමේදී අපගේ අවධානය නිරන්තරයෙන් විවිධ දිශානතීන් කරා යොමු කරවයි. එහිදී මේ ලෝකය තුළ සැබෑම තෘප්තිය ලැබෙන්නේ එදිනෙදා අත්විඳින සරල අත්දැකීම්වල සුන්දරත්වය සොයා ගැනීම තුළින් පමණක්ම වන බව උක්ත ග්‍රන්ථය පරිශීලනයෙන් අවබෝධ කර ගත හැකිය. එකී සරල කාරණාවන් තුළින් ප්‍රීතිය හා තෘප්තිය හඹා යාමට දක්ෂ පුද්ගලයින් අභියෝග හමුවේ නොබියව සටන් කරති.

## 02 සිහිය පුරුදු කිරීම (Practice Mindfulness)

තමා ජීවත්වන අවට ලෝකයේ සිදුවන සංසිද්ධීන් පිළිබඳව මනා අවධානයෙන් පසු වීම ජීවන අරමුණු ජය ගැනීමට අවැසි ශක්තිය ලබා දෙයි. එදිනෙදා අපගේ ක්‍රියාකාරකම් සමග මනා සිහිය පවත්වා ගැනීමෙන් අදාල කාර්යය ඉතා නිවැරදිව සහ සාර්ථකව අවසන් කළ හැක. නිසි අවධානයක් ලබා දීමෙන් යම්කිසි කාර්යයක් සිදුකිරීමේදී අදාල කාර්යයේ නිමවුම නිසිලෙස ඉටු වන්නේ දැයි අපට නිශ්චය කළ හැකිය. එවිට අදාල කාර්යය නිමවුම් රාමුවෙන් පිටතට පැමිණි අවස්ථාවක දී අප්‍රමාදීව එය නිසි රාමුව වෙත නැවත ගෙන ආ හැකි අතරම සිදුවන අපහසුතාවයන් ද අවම කර ගැනීමට හැකියාව ඇත.

ගෙවීගිය අතීතය සහ තවමත් එළඹී නොමැති අනාගතය පිළිබඳව වද වෙමින් කටයුතු කිරීම තුළින් අපට මේ අවස්ථාවේ පවතින මොහොත අහිමි කරවයි. එලෙස වර්තමානය අහිමි කර ගැනීමෙන් සුන්දර අතීතයක් උරුම කර ගත නොහැක. මේ ගෙවන මොහොත ක්ෂණයකින් අතීතය බවට පත් වන හෙයින් අතීතය සුන්දරව රසවිඳීමට නම් මේ ගෙවන මොහොත මනා සිහියෙන් තෘප්තිමත්ව ගත කළ යුතුයි. එතුළින් අතීතය, වර්තමානය පමණක් නොව අනාගතය ද සාර්ථක කර ගැනීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය වේ. ඒ අනුව, මේ මොහොතේ සිදුවෙමින් පවතින දේ කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සහ අප අවට ලෝකය සමග මනා ලෙස සම්බන්ධ වීමෙන් අපට මනසේ සන්සුන්භාවය සහ තෘප්තිය වර්ධනය කරගත හැකිය.

## 03 අවමවාදයේ ප්‍රීතිය (The Joy of Minimalism)

අවශ්‍යතාවය තේරුම් ගනිමින් ඊට සරිලන ලෙස ජීවත්වීම අවමවාදී ජීවන රටාවයි. එහිදී අවශ්‍යතාවය නිවැරදිව තේරුම්ගෙන ජීවත්වීමට අවශ්‍යම දේවල් පමණක් තමා අවට තබා ගනිමින් පිළිවෙළට, පිරිසිදුවට ජීවත්වීම ප්‍රීතිමත් දිවියකට මග පාදයි. ජීවත්වීමේදී භෞතිකව හා ආධ්‍යාත්මිකව සරල වන තරමටම මානසික සුවය අපට ලුහුබඳී.

අප ජීවත්වන නිවස තුළ අනවශ්‍ය ලෙස බඩු බාහිරාදිය අපිළිවෙළට ගොඩගසා ඇති විටෙක දැනෙන මානසික පීඩනය කෙබඳු දැයි මොහොතක් සිතන්න. එවැනි පසුබිමක හදිසි අවස්ථාවකදී අවශ්‍යවන දෙයක් සොයා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවේ.

අතිරික්තය අත්හැර දැමීම, අනවශ්‍ය ලෙස භාණ්ඩ අසුරා නොගැනීම තුළින් නිවසේ අවුල් සහගත බව හා අනවශ්‍ය ලෙස කරනු ලබන කැපකිරීම් අවම කර ගත හැක. එතුළින් ආතතිය අවම කරගත හැකි අතරම සැබැවින්ම ඔබට වැදගත් දේ සඳහා පමණක් ප්‍රමුඛ අවධානයක් ලබා දේ. තමා ජීවත්වන පරිසරයේ අනවශ්‍ය ලෙස අසුරාගෙන සිටින භාණ්ඩ ප්‍රමාණයට වඩා එහි ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් අප අසුරා ගන්නා දේවල් සම්බන්ධයෙන් වැඩි තෘප්තියක් ලබා ගත හැකි අතර, කාර්යක්ෂමතාවය ද වර්ධනය කරගත හැක.

එසේම අනවශ්‍ය පැහැදිලි කිරීම්, තේරුම් ගැනීම්වලට දවස් ගණන් නාස්ති නොකර සෑම මොහොතකම ස්වයං තෘප්තිය, ස්වයං අභිමානය තමා තුළ රඳවා ගැනීමෙන් ආධ්‍යාත්මික අවමවාදී ජීවන රටාව ප්‍රගුණ කළ හැක.

## 04 Wabi – Sabi වැළඳ ගැනීම (Embrace Wabi – Sabi)

අපූර්ව ජපන් වචනයක් වන "Wabi - Sabi" යනු පුද්ගලයින් තුළ තිබෙන අසම්පූර්ණකම හා එකිනෙකා අතර තිබෙන වෙනස්කම් තුළ අලංකාරය සොයාගෙන එය හදවතින් වැළඳ ගැනීමයි. ලෝකය විවිධාකාර වන අතර, එහි වෙසෙන සත්ත්වයෝ ද විවිධාකාරය. විවිධත්වය තුළින් අලංකාරය හා සුන්දරත්වය සොයා ගැනීමට සමත් පුද්ගලයින්ගේ මනස ව්‍යාකූලත්වයෙන් තොරය. ඔවුන් නිදහස් මනසකින් ලෝකයට විවෘත වේ.

ඕනෑම භෞතික හෝ ආධ්‍යාත්මික වස්තුවක පරිපූර්ණත්වය සෙවීමට වෙහෙස වනවා වෙනුවට පවතින ස්වභාවයෙන් අප අවට ලෝකය සමග සම්බන්ධ වීමෙන් සිතේ සාමය වැඩිදියුණු කරගැනීමට ඉඩ සලසයි. අප අවට ලෝකය අපට අවශ්‍ය ආකාරයෙන් පවතින්නේ නැති බව අවබෝධ කරගෙන ජීවත්වීම ඉතා පහසුවකි.

පුද්ගල ආකල්ප, අධ්‍යාපනික පසුබිම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස් භේදය, පවුල් පසුබිම මෙන්ම සමාජමය තත්ත්වයන් අනුව පුද්ගලයින් විවිධ කාණ්ඩවලට වෙන් කළ හැක. එකී පුද්ගල කණ්ඩායම් සමග එදිනෙදා කාර්යයන්හි නිරත වීමේදී විවිධත්වය තුළින් තමා අපේක්ෂා කරන අයුරින්ම අදාල කාර්යයන් නිම කිරීමට අවස්ථාවක් ලැබෙන්නේ නැත. ඒ අනුව, පවතින තත්ත්වයන් තුළ අසම්පූර්ණත්වය පිළිබඳව මැසිවිලි නැඟීම පසෙකට තබා ඉදිරිපත් වන අදහස් හා යෝජනා පිළිබඳ වැඩි අවධානයක් යොමු කර නිර්මාණශීලීව අදාල කාර්යයන් නිම කිරීමට උත්සාහ කළ යුතුය.

එලෙස පවතින තත්ත්වයන්ගේ ස්වභාවය නිසි පරිදි අවබෝධ කොටගෙන කටයුතු කිරීමට සිත දියුණු කර ගැනීමෙන් ස්වයං අභිවෘද්ධිය නිතැතින්ම ළඟා කරගත හැක.

## 05 කෘතඥතාව වගා කිරීම
(Cultivate Gratitude)

කෘතඥතාව ජපන් සංස්කෘතියේ මූලික සංකල්පයකි. උදෑසන අවදි වූ මොහොතේ සිට දවස තුළ සිදු වූ සිදුවීම් දුකට සතුටට හේතු වුවද, එතුළින් ලබන අත්දැකීම් කෙරෙහි තම කෘතඥතාව පළ කිරීමෙන් සිත සැහැල්ලු කරගත හැක. රාත්‍රියේ නිදියහන වෙත පිය නගන බොහෝ දෙනකුට පසුදින අවදි වීමට අවස්ථාවක් ලබා නොදීමට පුළුවන. එසේ හෙයින් උදෑසන අවදි වී තමා ගන්නා පළමු හුස්ම පොද වෙනුවෙන් තම ප්‍රථම කෘතඥතාව පළ කිරීම තුළින් දවස ආරම්භ කරන්න. එතැන් සිට ස්වභාව ධර්මය විසින් ලබාදෙන සෑම අවස්ථාවක් වෙනුවෙන්ම තම හදවතින් ස්තුතිය පුද කිරීමෙන් මානසික තෘප්තිය ඉහළ නංවා ගත හැක.

ජීවිතයේ විවිධ කාලපරිච්ඡේදවලදී හමුවන අභියෝග සඳහා සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය ප්‍රමාණවත් ශක්තියක් තමා සතු නොවුණද, ජීවත් වීමට හුස්ම වැටෙන්නේ නම් අනෙක් කාරණා පසෙකලා ප්‍රථමයෙන්ම එයට ස්තුතිවන්ත වෙන්න. එතුළින් ලබන ආශිර්වාදයෙන් තමාට අවශ්‍ය ශක්තිය ලබා දෙයි. තම ජීවන අරමුණු ඉටුකර ගැනීමට ලබාදෙන ඉතාම කුඩා උපකාරයක් වෙනුවෙන් වුවද තම ස්තුතිය පුද කිරීම තුළින් මෙන්ම අපගේ ජීවිතයේ ඇති කුඩා ආශිර්වාද හඳුනා ගැනීමෙන් ගැඹුරු තෘප්තියක් ළඟා කරගත හැක.

## 06 සොබාදහමේ සුන්දරත්වය සෙවීම
(Find Beauty in Nature)

ස්වයං අභිවෘද්ධිය ළඟා කර ගැනීම උදෙසා සොබාදහම සමඟ කාලය ගත කිරීම තරම් ප්‍රබල මූලධර්මයක් ජපන් සංස්කෘතිය තුළ නොමැති තරම්ය. ජපන් ජාතිකයින්ගේ ජීවිතය එතරම්ම සොබාදහම සමඟ බැඳී පවතී. ස්වභාව ධර්මය හා ආධ්‍යාත්මික පිළිවෙත් ඔවුන්ගේ දෛනික ජීවිතයට ගැඹුරින් සම්බන්ධ වී ඇත.

කඳු නැගීම, ගෙවතු වගාව, සුන්දර ප්‍රදේශවල සංචාරය කිරීම, උද්‍යානයක නිශ්චල මොහොතක් භුක්ති විඳීම පමණක් නොව උපතේ සිට මිය යන තුරුම තම ජීවිතය සොබාදහම සමඟ බද්ධ වී ඇත. මිනිසා යනු සොබාදහමේ අපූර්ව නිර්මාණයක් වන බවත්, ජීවන අරමුණු සමඟ සටන් කිරීමේදී වැයවන ශක්තිය නැවත වර්ධනය කර ගැනීමට ප්‍රබල ඖෂධය වන්නේ සොබාදහම පමණක් වන බවත් ජපන් ජාතිකයින්ගේ විශ්වාසයයි.

## 07 වැඩ සහ විවේකය අතර සමබරතාවය
(Balance of Work and Rest)

ඉලක්ක පසුපස හඹා යාමේ දී වැයවන ශක්තිය නැවත වර්ධනය කරගැනීමට විවේකය අත්‍යවශ්‍ය වේ. ප්‍රමාණය ඉක්මවා වැඩ කිරීම තුළින් කායිකව මෙන්ම මානසිකව බිඳ වැටීමකට ලක් වේ. විවේක ගැනීම, විවේකය දනවන ක්‍රියාකාරකම්වල නියැලීම තුළින් ගිලිහී යන ශක්තිය නැවත පෝෂණය කරනු ලබයි.

වැඩ කරන අතරතුර කෙටි විවේකයක් ගෙන පොතක එක් පිටුවක් හෝ දෙකක් කියවීම, ගීතයක් රස විඳීම, කෙටි සංවාදයක නිරත වීම වැනි ක්‍රියාකාරකම් තුළින් ආතතිය මග හරවා ගත හැකි අතර, නව ජවයකින් අදාල කාර්යයන්හි නිරත විය හැක.

## 08 චේතාන්විතව ජීවත් වීම
(Live with Intentionality)

තම අරමුණු ඉටුකර ගැනීමට උත්සාහ කිරීමේදී සෑම විටෙකම අනෙක් පුද්ගලයින් අනුගමනය කරනවා වෙනුවට තමාගේ වටිනාකම්, කැමැත්ත සහ ආශාවන් පිළිබිඹු කරන තේරීම් වෙනුවෙන් සිත යොමු කිරීමෙන් මනස නිරවුල්ව පවත්වාගෙන යාමට නිදහස් වටපිටාවක් නිර්මාණය වේ. තමාගේ කාලය, සබඳතා සහ ක්‍රියාවන් සමඟ චේතාන්විතව කටයුතු කිරීමෙන් නිවැරදි අරමුණු සහිත තෘප්තිමත් ජීවිතයකට මඟ පාදනු ලැබේ. සෑම තීරණයක්ම කොතරම් කුඩා වුවත් ඔබේ සමස්ත තෘප්තියට එය දායක වන බැවින් නිවැරදි වේලාවට නිවැරදි තීරණය ගැනීමට පසුබට නොවිය යුතුය. අප හිතන රටාවට වඩා සමහරවිට සොබාදහමට වඩාත් හොඳ සැලසුම් තිබිය හැක. එනිසා කලබල නොවී සෑම දිනකම විශ්වාසයෙන් යුක්තව තම අරමුණු සමඟ ජීවත් වීමෙන් වෙනස් රටා මතින් සුන්දර මාවතක් නිර්මාණය වනු ඇත.

## 09 සැසඳීමට ඉඩ නොදීම
(Let Go of Comparison)

මිනිසා උපතින්ම සමාජීය සත්ත්වයෙකි. ඒ අනුව සාමූහිකව කටයුතු කිරීමේදී එකිනෙකාව සංසන්දනය කිරීම සාමාන්‍ය කරුණකි. එමෙන්ම එලෙස සංසන්දනය කිරීමට දිරි ගන්වන ලෝකයක අප අන් අය සමඟ සංසන්දනය කිරීම නතර කළ විට ස්වයං තෘප්තිය වර්ධනය වේ. තමන් හා තරග කර තමන්ගේ අරමුණු කරා ගමන් කිරීමට උත්සාහ දරන පුද්ගලයින් නිහඬවම තමන්ව වැඩි දියුණු කර ගැනීමට කැමැත්තක් දක්වයි.

තමාගේ ආශ්‍රයට සුදුසු පුද්ගලයින් සමඟ සම්බන්ධ වීමට නිතරම උත්සාහ කරන්න. "ආශ්‍රයට සුදුසු පුද්ගයින්" යනුවෙන් අදහස් කරනුයේ, පොතපත සමඟ කාලය ගත කරන්නෙක්, අරමුණු වෙනුවෙන් තමාව දිරිගන්වන්නෙක්, ධෛර්යවන්ත පුද්ගලයෙක්, සමාජීය වශයෙන් යාවත්කාලීන පුද්ගලයෙක් මෙන්ම ඵලදායී තොරතුරු හුවමාරු කළ හැකි විවෘත පුද්ගලයෙක් ආශ්‍රයට සුදුසු වේ. මෙවැනි යහපත් පුද්ගල ආශ්‍රයන් පුද්ගලයින් සංසන්දනය කරනවා වෙනුවට ධනාත්මක ආකල්ප වර්ධනය කරනු ලබයි. වඩාත්ම වැදගත් වන්නේ තමා වටා සිටින පුද්ගලයින්ගේ ප්‍රමාණාත්මක භාවයට වඩා තම සමීප කවය තුළ සිටින පුද්ගලයින්ගේ ගුණාත්මකභාවයයි.

## 10 තමා වෙනුවෙන් කාලය වෙන් කිරීම (Let Go of (Enjoy with "Me Time")

ජීවිතයට සතුට, සැනසීම ගෙන එන්නේ අන් කිසිවකු නොව තමාගේම තෝරාගැනීම් පමණකි. සතුට පවතින්නේ තමා තුළමයි. පුද්ගලයෙක් සතුටින් සිටින විට එයට අදාළ සතුටු හෝර්මෝන සිරුර තුළ ශ්‍රාවය වීම සිදුවේ. සතුටින් කල් ගෙවන්නන් නිරෝගීව දීර්ඝ ආයුෂ භුක්ති විඳින බව සමීක්ෂණ වාර්තාවලින් තහවුරු වී ඇත. එබැවින් කිසිදිනෙක ඔබ ඔබව අවතක්සේරු කර නොගෙන තමාගේ වටිනාකම් ඔප්නංවා ගැනීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා දෛනිකව තමා වෙනුවෙන් ඉඩකඩක් වෙන් කළ යුතුමය.

සාමාන්‍යයෙන් උදෑසන අවදි වන වේලාවට පෙර විනාඩි 15ක් වේලාසනින් අවදිවීම තුළින් ජවසම්පන්න දවසක ආරම්භයක් සනිටුහන් කරනු ලබයි. එනම් ආගමික වතාවත්වල නියැලීම, හුස්ම ඉහළ පහළ ගැනීම වැනි ශ්වසන අභ්‍යාසයක්, සිරුර ලිහිල් කරවන උදෑසන ජවය ගෙනෙන ව්‍යායාමයක්,(ඇඟ නැවීම, ඇකිලීම වැනි ව්‍යායාම) උදෑසන ස්නානය කිරීම හෝ ඇඟ සෝදා පිරිසිදු වීම, උණුසුම් වතුර වීදුරුවක් සෙමෙන් සිහියෙන් පානය කිරීම, විනාඩි කිහිපයක් ගෙවත්තේ ඇවිදීම, උදෑසන කුරුළු නාද රටාවන්ට සවන් දීම වැනි ප්‍රබෝධමත් ක්‍රියාකාරකම් ඒ සඳහා යොදා ගත හැක. එතුළින් ඔබට නිහඬවම ඔබව සොයා ගැනීමට අවශ්‍ය ශක්තිය ලබාදෙයි. මේ ගෙවන සෑම මොහොතක්ම ඔයාගේ ජීවිතයයි. එනිසා ගෙවන සෑම තත්පරයක්ම ජීවිතයේ කොටසක් කර ගනිමින් සෑම ජීවිත අංගුවක්ම ලස්සනට ප්‍රයෝජනයට ගන්න. ලෝබ නැතිව සතුටු වෙන්න. ඔබට සතුට ගේන්න පුළුවන් ඔබට විතරමයි. එය විශ්වාස කරමින් කටයුතු කරන්න.

නව කොටසක් ලබන කලාපයේ...

# රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් දේශන මාලාවක්

යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් ගේ උපදෙස් හා මගපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් ඉකුත් ජනවාරි මස 20, 23 සහ 24 වන දින නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. ඒ යටතේ පනාගොඩ ශාරීරික අභ්‍යාස පුහුණු පාසල, යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය, 52 වන පාබල සේනාංකය සහ වේයන්ගොඩ රෙදිපිළි ගබඩාව යන ස්ථානවලදී එම දේශන පැවැත්විණ.



එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත් යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් පිණිස "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" පිළිබඳ දේශනය ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් සිදුකරන ලදී. තවද, හමුදා සාමාජිකයින්ගේ සමාජ මාධ්‍ය භාවිතය, ආර්ථික කළමනාකරණය, නීතිවිරෝධී ක්‍රියාවලට සම්බන්ධවීම ආදී කරුණු අලලා "අභිමානවත් සොල්දාදුවා" යන මැයෙන් වූ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් එම්එච්එම්එස් බණ්ඩාර එල්එස්සී විසින් සිදුකරන ලදී.






# හමුදා ආචාරය



**හමුදා ආචාරය ලොව පුරා සන්නද්ධ හමුදාවන්හි වඩාත්ම පිළිගත් හා ගෞරවනීය අභිනයකි. එය හුදෙක් භෞතික ක්‍රියාවක් නොව හමුදාවේ මූලික වටිනාකම් පිළිබිඹු කරන විනය, ගෞරවය සහ මිත්‍රත්වයේ සංකේතයකි.**

## ඓතිහාසික සම්භවය

හමුදා ආචාරයේ මූලාරම්භය පුරාණ කාලය දක්වා දිව යයි. එක් ජනප්‍රිය න්‍යායකින් පෙනී යන්නේ එය රෝම අධිරාජ්‍යයේ ආරම්භ වූ බවත්, එහිදී සොල්දාදුවන් උසස් නිලධාරීන් වෙත ළඟා වන විට නිරායුධ බව පෙන්වීමට තම දෑත් එසවූ බවත්ය. මධ්‍යතන යුගයේදී, නයිට්වරු ගෞරවයේ සහ විශ්වාසයේ ලකුණක් ලෙස ඔවුන්ගේ දකුණු අත්වලින් ඔවුන්ගේ වයිසරය ඔසවනු ඇත. කාලයත් සමඟ මෙය නූතන ආචාරය බවට පරිණාමය විය.




▪ කපිතාන්
එච්පීජේ හවන්ති
1 ශ්‍රීලයුකාබ




## වැදගත්කම සහ අර්ථය

ආචාරය යනු හමුදාව තුළ ගෞරවයේ විශ්වීය ලකුණකි. එය ඔවුනොවුන් අතර තරාතිරම, අධිකාරිය සහ සේවයට ගෞරව කිරීමේ ක්‍රමයකි. නිලධාරීන් හමුවේ එය ඔවුන්ගේ නායකත්ව භූමිකාව පිළිබිඹු කරන අතර, යටත් නිලධාරීන් අතර එය ඔවුන්ගේ විනය, එකමුතුකම සහ කැපවීම පෙන්නුම් කරයි.

තවද, එය හමුදාවන්හි සේවය කරන අය අතර අන්‍යෝන්‍ය විශ්වාසය සහ පක්ෂපාතිත්වය සිහිගන්වයි. සොල්දාදුවෙකු තවත් නිලධාරියෙකුට ආචාර කරන විට, එය තරාතිරම සහ භූමිකාවන් ඉක්මවා යන ගෞරවයේ බැඳීමක් අදහස් කරයි.

## ලොව පුරා සිරිත් විරිත් ආචාර කිරීම

මෙම අභිනය විශ්වීය වුවද, ආචාර කිරීමේ විලාසය සහ සිරිත් විරිත් ජාතීන් අතර වෙනස් වේ:

එක්සත් ජනපදය: අත්ල පහළට මුහුණලා තියුණු චලනයක්.

එක්සත් රාජධානිය: අත්ල පිටතට මුහුණලා, අවංකභාවයේ සලකුණක් ලෙස පිරිසිදු දෑත් පෙන්වීමට නාවික පිළිවෙත් වලින් පැන නගින සම්ප්‍රදායකි.

ඉන්දියාව: ආචාර කිරීම සිදු කරනු ලබන්නේ දකුණු අත, අත්ල ආචාර කරනු ලබන පුද්ගලයාට මුහුණලා, ඇඟිලි එකට සමීපව තබාගෙනය.

ප්‍රංශය: එක්සත් ජනපද ආචාරයට සමාන නමුත් වඩාත් කැපී පෙනෙන ඉහළ කෝණයක් නඩත්තු කරයි.

සෑම විචලනයක්ම සංස්කෘතික වැදගත්කමක් දරන අතර ඒ ඒ අදාළ සන්නද්ධ හමුදාවන්ගේ සම්ප්‍රදායන් පිළිබිඹු කරයි.

## උත්සවවල සංකේතවාදය

ආචාර කිරීම පෙළපාළි, අනුස්මරණ සේවා සහ ධජ එසවීම් ඇතුළු හමුදා උත්සවවල අනිවාර්ය අංගයකි. ඒවා ජාතියට, එහි නායකයින්ට සහ මියගිය සහෝදරවරුන්ට ගරු කිරීම සංකේතවත් කරයි. නූතන කාලයේ පවා, ජාතික ගීය වාදනය කිරීමේදී හෝ ස්මාරකයක් පසුකර යන අතරතුර ආචාර කිරීමේ ක්‍රියාව නිල ඇඳුමින් සැරසුණු අය විසින් කරන ලද කැපකිරීම් පිළිබඳ තියුණු මතක් කිරීමකි.


> “ආචාරය යනු හමුදාව තුළ ගෞරවයේ විශ්වීය ලකුණකි. එය ඔවුනොවුන් අතර තරාතිරම, අධිකාරිය සහ සේවයට ගෞරව කිරීමේ ක්‍රමයකි. නිලධාරීන් හමුවේ එය ඔවුන්ගේ නායකත්ව භූමිකාව පිළිබිඹු කරන අතර, යටත් නිලධාරීන් අතර එය ඔවුන්ගේ විනය, එකමුතුකම සහ කැපවීම පෙන්නුම් කරයි.

## හමුදාවෙන් ඔබ්බට

සිත්ගන්නා කරුණ නම්, හමුදා ආචාරය එහි සාම්ප්‍රදායික මූලයන් ඉක්මවා ගොස් ඇත. එය දැන් ජනප්‍රිය සංස්කෘතියේ, පොලිස් බලකායන් විසින් සහ සිවිල් සන්දර්භයන් තුළ පවා ගෞරවයේ අභිනය ලෙස බහුලව භාවිතා වේ. කෙසේ වෙතත්, එහි සැබෑ ස්වරූපයෙන්, එය හමුදා උරුමයේ පූජනීය සංකේතයක් ලෙස පවතී.

## නිගමනය

හමුදා ආචාරය හුදෙක් අභිනයකට වඩා බොහෝ සෙයින් අර්ථවත්ය. එය ගෞරවය, එකමුතුකම සහ සම්ප්‍රදායේ ගැඹුරුභාව ප්‍රකාශනයකි. එය සන්නද්ධ හමුදාවන්ගේ කොඳු නාරටිය වන ගෞරවය, විනය සහ පක්ෂපාතිත්වයේ වටිනාකම් මූර්තිමත් කරන්නකි. විධිමත් උත්සවයකදී දුටුවත්, සිවිල් සමාජයේ දී වුවත් ආචාරය යනු හමුදා සේවය නිර්වචනය කරන ගෞරවය පිළිබඳ කාලානුරූපී මතක් කිරීමක් ලෙස දැක්විය හැකිය.






# සේපැක්ට්‍රැක්රෝ ක්‍රීඩාව සහ යුද්ධ හමුදාව




■ මේජර්
**ජේපීඑම් ගමගේ ශ්‍රීලයුපොදුසේබ**

කළමනාකරු
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
සේපැක්ට්‍රැක්රෝ කණ්ඩායම


සේපැක්ට්‍රැක්රෝ ක්‍රීඩාව කික් වොලිබෝල් (*kick volleyball*) හෝ ෆුට් වොලිබෝල් (*Foot volleyball*) යන නම්වලින් ලොව පුරා රටවල් 60 කට අධික සංඛ්‍යාවක ජනප්‍රිය වී ඇති අතර, ඔවුන් ජාතික මට්ටමේ තරග පවත්වයි. පාද, පපුව හා හිස භාවිතා කරමින් *Rattan* (වේවැල්) හෝ *Synthetic* (කෘත්‍රිම ප්ලාස්ටික්) පන්දුවකින් ක්‍රීඩා කිරීම මෙහිදී සිදුවේ. පාපන්දු, වොලිබෝල් සහ කරනම් ක්‍රම (*Acrobatic Skills*) මෙම ක්‍රීඩාව සඳහා මූලික වේ. මෙහි ඇතැම් නීතිරීති වොලිබෝල් ක්‍රීඩාවේ නීතිරීතිවලට සමාන වේ.

මෙහි ආරම්භය පිළිබඳව සැලකීමේදී මීට වසර 500 කට පමණ පෙර මලයාසියාවේදී ආරම්භ වී ඇති බව පැවසේ. 15 වන ශතවර්ෂයේදී රාජකීයයන් අතර මෙය ජනප්‍රිය ක්‍රීඩාවක් බවට පත්ව තිබුණි. 1940 දී පමණ නීති පද්ධතියක් මෙම ක්‍රීඩාවට නිර්මාණය වී ඇත. ප්‍රථම තරගාවලිය 1945 මැයි 16 මැලේසියාවේ පිනැන් හිදී පවත්වා ඇත. 1950 පමණ වන විට මෙය අග්නිදිග ආසියාවේ ජනප්‍රිය ක්‍රීඩාවක් බවට පත්විය. 1960 දී මැලේසියානු *"Sepak Raga"* සංගමය බිහිවී ඇති අතර, 1960 දී ක්‍රීඩාවේ නූතන ප්‍රවේශය (*modern version*) ආරම්භ වී ඇත.

1965 දී ආසියානු සේපැක්ට්‍රැක්රෝ සංගමය බිහිවී ඇති අතර, 1965දී අග්නිදිග ආසියානු ක්‍රීඩා උළෙල (*South East Asia Peninsular Games*) සඳහා මෙය ක්‍රීඩාවක් ලෙස ඇතුළත් කර ඇත. වර්තමානයේදී මෙම ක්‍රීඩා උළෙල *SEA GAMES* (*South East Asia Games*) ලෙස හඳුන්වනු ලබයි. ලෝකය පුරා ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින් 1982 වර්ෂයේදී ලෝක සේපැක්ට්‍රැක්රෝ සංගමය බිහි වී ඇත. 1990 වර්ෂයේ සිට නොකඩවා ආසියානු ක්‍රීඩා උළෙලට මෙම ක්‍රීඩාව ඇතුළත් වී ඇත. තවද, 2008 වර්ෂයේ සිට ආසියානු වෙරළ ක්‍රීඩා උළෙලටත් 2005 වර්ෂයේ සිට ආසියානු ගෘහස්ථ ක්‍රීඩා උළෙලටත් ඇතුළත් කර ඇත. ආසියාව, යුරෝපය හා ඇමෙරිකානු මහද්වීපවල ජාත්‍යන්තර තරග පවත්වනු ලබන අතර, ලොව පුරා මිලියන සංඛ්‍යාත පිරිසක් මෙම ක්‍රීඩාවේ නිරතවන බව වාර්තාවන්හි සඳහන් වේ.

2011 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මෙම ක්‍රීඩාව හඳුන්වා දී ඇති අතර, එතැන් සිට මේ දක්වා යුද්ධ හමුදාවට හා ශ්‍රී ලංකාවට විශාල කීර්තියක් අත්කරදීමට යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වී ඇත. ලෝක ශූරතා තරගාවලි 11ක්, ආසියානු ශූරතා තරගාවලියක් හා දකුණු ආසියා ශූරතා තරගාවලි 5 ක් නියෝජනය කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වී ඇත. ඉතිහාසයේ නව පිටුවක් පෙරළමින් 2024 ලෝක ශූරතා සේපැක්ට්‍රැක්රෝ තරගාවලියේදී ලෝකඩ පදක්කම් 5 ක් දිනාගැනීමට ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වූ අතර, ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කරමින් යුද්ධ හමුදා ක්‍රීඩකයෝ 4 දෙනෙක් ද ක්‍රීඩිකාවෝ 4 නෙක් සහ කණ්ඩායම් කළමනාකරු තරගාවලියට සහභාගී වූහ.


තවද, 2023 ජාතික සේපැක්ට්‍රැක්රෝ ශූරතාවලියේදී පිරිනැමූ ශූරතා 4 න් 3 ක්ම දිනාගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් විය. තවද, 2023 ජාතික වෙරළ සේපැක්ට්‍රැක්රෝ ශූරතාවලිය පිරිමි හා කාන්තා දෙඅංශයේම ශූරතාවය ජයග්‍රහණය කිරීමට යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වී ඇත. 2022 ජාතික සේපැක්ට්‍රැක්රෝ ශූරතාවලියේදී පිරිනැමූ ශූරතා 6 න් 4 ක්ම යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් ජයග්‍රහණය කර ඇත.

පසුගිය වසර 13 පුරා ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ නායකත්වය දැරීමට සාසෙ ග්‍රිමාල් කේකේඅයි සහ සැරයන් සොයිසා ඩබ්ලිව්ඩී වරින්වර සමත්විය. එසේම, ලා/කෝ ගමපතිරණ එස් සහ කෝප්‍රල් කරුණාරත්න කේඩීඑච්සී පසුගිය වසර තුන පුරා ශ්‍රී ලංකා කාන්තා කණ්ඩායමේ නායකත්වය දැරීමට සමත් වී ඇත.

තවද, 2024 වර්ෂයේදී යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 9 දෙනෙකු ශ්‍රී ලංකා ජාතික සේපැක්ට්‍රැක්රෝ කණ්ඩායම නියෝජනය කිරීමට සමත් විය.

2025 වර්ෂයේ සිට අන්තර් රෙජිමේන්තු තරග සඳහා ඇතුළත් කොට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ තව තවත් ප්‍රචලිත කරමින් ශ්‍රී ලංකා මාතාවට සහ යුද්ධ හමුදාවට තව තවත් ජයග්‍රහණ හිමිකරදීම යුද්ධ හමුදා පාපන්දු හා සේපැක්ට්‍රැක්රෝ කමිටුවේ අභිලාෂය වේ.










# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ගොල්ෆ් ශූරතාවලිය-2025

දින දෙකක් පුරා පැවති යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ගොල්ෆ් ශූරතාවලියේ සමාප්ති උත්සවය ඉකුත් ජනවාරි මස 15 වන දින නුවරඑළිය ගොල්ෆ් සමාජ පරිශ්‍රයේදී පැවැත්විණි. මේ සඳහා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 12 ක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 100 දෙනකුට අධික පිරිසක් සහභාගී වී සිය දක්ෂතා එළිදැක්වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන සේනාවිධායක, බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගොල්ෆ් ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී මෙම අවස්ථාව සඳහා ප්‍රධාන අරාධිතයා ලෙස සහභාගී විය.




එහිදී, තරගාවලියේ තියුණු තරගයකින් අනතුරුව, පිරිමි විවෘත කාණ්ඩයේ ශූරතාව දිනාගැනීමට ගැමුණු හේවා බලකා කණ්ඩායම සමත් වූ අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා කණ්ඩායම විසින් අනු ශූරතාව දිනාගන්නා ලදී. එහි කාන්තා කාණ්ඩයේ ශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායමට ද අනුශූරතාව ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා කණ්ඩායමට ද හිමිවූහ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගොල්ෆ් ක්‍රීඩා කමිටුවේ උප සභාපති බ්‍රිගේඩියර් ටීඩීපී සිරිවර්ධන පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයෝ පිරිසක් ද සහභාගී වූහ.



## 2024/2025 ආරක්ෂක සේවා බර ඉසිලීමේ ශූරතාවලිය

13 වරට පැවති ආරක්ෂක සේවා බර ඉසිලීමේ ශූරතාවලියෙහි සමාප්ති උත්සවය ඉකුත් ජනවාරි මස 09 වන දින ටොරිංටන් පෙදෙස කොළඹ 07 ජාතික බර ඉසිලීමේ මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස කොමදෝරු ආර් දිසානායක සහභාගී විය. තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි සහ කාන්තා කණ්ඩායම් සහභාගී වූ අතර, එහිදී පිරිමි සමස්ථ ශූරතාවය දිනාගැනීමට යුද්ධ හමුදාව සමත්විය. ශූරතාවලියේ දක්ෂතම බර ඔසවන්නාට හිමි කුසලානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ සාමාන්‍ය සෙබළ ජයවර්ධන කේසීජීඑස්ඩී විසින් දිනාගන්නා ලදී.

# 2024 ජාතික වෙරළ සේපැක්ට්‍රැක්රෝ ශූරතාවය යුද්ධ හමුදාවට

ශ්‍රී ලංකා ජාතික සේපැක්ට්‍රැක්රෝ සංගමය මගින් පැවැත්වූ "2024 ජාතික වෙරළ සේපැක්ට්‍රැක්රෝ ශූරතාවලිය" පසුගිය ජනවාරි මස 19 වන දින ගල්කිස්ස මුහුදු වෙරළ තීරයේදී අති උත්කර්ශවත් අයුරින් නිමාවට පත්විය. එහිදී, පිරිමි සහ කාන්තා අංශයේ තරඟ ඉසව් දෙකෙහිම ශූරතාව දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි/කාන්තා සේපැක්ට්‍රැක්රෝ කණ්ඩායම් සමත්වූහ. යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ වත්මන් සභාපති මේජර් ජෙනරාල් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ සෘජු මගපෙන්වීම මත එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අඛණ්ඩ පුහුණුව හා කැපවීම මෙම ජයග්‍රහණය පිටුපස වූ ශක්තියයි.






## 52 වන පාබල සේනාංකයෙන් පාපන්දු තරඟාවලියක්



52 වන පාබල සේනාංකය සහ 521 වන පාබල බලසේනාව එක්ව සිවිල් වැසියන් සහ හමුදා සාමාජිකයින් අතර පවතින සංහිඳියාව, ක්‍රීඩාශීලීත්වය වැඩිදියුණු කරමින් පාපන්දු තරඟාවලියක් පැවැත්විය. එහි මූලික තරඟ ඉකුත් ජනවාරි මස 11 වන දින සිට 521 වන පාබල බලසේනා ක්‍රීඩාංගණයේ දී ද එහි අවසන් මහා තරඟය ඉකුත් ජනවාරි මස 16 වන දින 52 වන පාබල සේනාංක බලප්‍රදේශයේ පිහිටි නෙල්ලිඅඩි, කොලින්ස් පිටියේදී ද පැවැත්විණ. එම අවසන් මහා තරඟයේදී 523 වන පාබල බලසේනාව නියෝජනය කරන කොඩිකාමම් පාපන්දු සමාජය, 521 වන පාබල බලසේනාව නියෝජනය කරන වඩමාරච්චි පාපන්දු සමාජයට එරෙහිව ගෝල 3-0 ක් ලෙස ජයග්‍රහණය හිමිකරගනු ලැබීය.

අවසන් මහා තරඟයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 522 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්කේඑස්පීඑම්ආර්ජ්බී දොඩම්වෙල සහභාගි වූ අතර, ප්‍රාදේශීය නිලධාරීන් සහ ප්‍රජා නායකයින් රැසක් ද මෙම අවස්ථාවට එක්වූහ. සෙල්ලමුත්තු ටෙක්ස්ටයිල්ස්, වයිට් ටවර් හෝටලය, ටී 20 ස්පෝර්ට්ස්, කුපුතු හෝටලය සහ කලම්බු ටෙක්ස් ඇතුළු දේශීය අනුග්‍රාහක ආයතන රැසක් මෙම තරඟාවලිය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්විය.

## අන්තර් බළඇණි ක්‍රීඩා හා වෙඩි තැබීමේ ශූරතාවලිය

යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ අන්තර් බළඇණි ක්‍රීඩා හා වෙඩි තැබීමේ ශූරතාවලිය ඉකුත් දෙසැම්බර් මස 29 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී සහභාගී විය.

එහිදී, පැවති වෙඩි තැබීම, ඔරු පැදීම සහ වොලිබෝල් ඇතුළු තරඟ ඉසව් රැසක් අතරින් 1 යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව හොඳම වොලිබෝල් කණ්ඩායම ලෙසත්, 3 යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව හොඳම ඔරු පැදීමේ කණ්ඩායම ලෙසත්, 4 යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව හොඳම වෙඩි තැබීමේ කණ්ඩායම ලෙසත් ශූරතාවය දිනාගත්හ. එසේම, ඔරු පැදීම සහ බොක්සින් ක්‍රීඩාව තුළින් ජාතික මට්ටමේ දක්‍ෂතා දැක්වූ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ සාමාජිකයන් වෙත මූල්‍ය දිරිගැන්වීම් පිරිනැමීමද එහිදී සිදුවිය.



# ආරක්ෂක සේවා එල්ලේ ජයග්‍රහණය යුද්ධ හමුදාවට




ආරක්ෂක සේවා එල්ලේ තරඟාවලිය - 2025 හි ජයග්‍රහණය අඛණ්ඩව සිව්වන වරටත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හිමිවිය. ශ්‍රී ලංකා නාවික හමුදා එල්ලේ කමිටුව විසින් සංවිධානය කරන ලද මෙම තරඟාවලිය ජනවාරි මස 21 දින සිට 23 දින දක්වා වැලිසර, නවලෝක ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ කණ්ඩායම් මෙම තරඟාවලිය සඳහා තරඟ වැදුණු අතර, අවසන් මහා තරඟයේදී යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම නාවික හමුදා එල්ලේ කණ්ඩායම පරාජය කරමින් ශූරතාවය හිමිකර ගත්තේය. යුද්ධ හමුදාවේ මෙම ජයග්‍රහණයට අමතරව, හොඳම පිතිකරු සහ තරඟාවලියේ හොඳම ක්‍රීඩකයා ලෙස සුවිශේෂී දස්කම් දැක්වූ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ලාන්ස් කෝප්‍රල් ලක්මාල් කේඅයි ට ගෞරවනීය සම්මාන දෙකක් හිමිවිය. ආරක්ෂක සේවා එල්ලේ තරඟාවලිය මෙරට ත්‍රිවිධ හමුදාවේ මලල ක්‍රීඩා දක්ෂතා සහ සුහදත්වය සංකේතවත් කරමින් අඛණ්ඩව පවත්වනු ලබන්නකි.

# 2024 ජාතික ශූරතා මුෂ්ඨි ප්‍රහාර තරඟාවලියේ යුධ හමුදාවෙන් වැඩි දස්කම්

ශ්‍රී ලංකා මුෂ්ඨි ප්‍රහාර සංගමය මගින් සංවිධානය කරනු ලබන ජාතික ශූරතා මුෂ්ඨි ප්‍රහාර තරඟාවලිය 2025 ජනවාරි මස 23, 24,25 සහ 26 යන දිනයන්හිදී කොළඹ ගාලු මුවදොරදී පැවැත්විණ. මේ සඳහා සඳහා ක්‍රීඩා සමාජ 25ක් නියෝජනය කරමින් ක්‍රීඩකයෝ 92ක් සහ ක්‍රීඩිකාවෝ 42ක් සහභාගි වූහ. එහිදී යුධ හමුදා පිරිමි කණ්ඩායම බර පංති 13ක් අතරින් බර පංති 07ක් සඳහා රන් පදක්කම්ද, බර පංති 04ක් සඳහා රිදී පදක්කම්ද හිමි කර ගනිමින් සමස්ථ තරඟාවලියේ කැපී පෙනෙන දස්කම් දක්වා සහභාගි වූ ක්‍රීඩා සමාජ අභිබවා සාජන් සෙල්වදොරෙයි අනුස්මරණ කුසලාණය සහ වසරේ සාර්ථකම මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායමට හිමි මුත්තයියා සේවියර් රෝස් අනුස්මරණ කුසලාණය දිනා ගැනීමට සමත්විය. තවද, යුද්ධ හමුදා රතු (ARMY RED) කණ්ඩායම බර පංති 02ක් සඳහා රන් පදක්කම් ද, බර පංති 01ක් සඳහා රිදී පදක්කම් ද, ලෝකඩ පදක්කම් 03ක් ද හිමිකර ගනිමින් සමස්ත තරඟාවලියේ පදක්කම් සටහනේ දෙවන ස්ථානය හිමිකර ගැනීමට ද සමත්විය. තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය කි.ග්‍රෑ 54ට අඩු බර පංතියෙන් තරඟ වැදුනු 7 ශ්‍රීලංඉ ඒකකයට අයත් සෙ/247081 ලා/කෝ ධර්මසේන ආර්එම්පී විසින් ද, කරගාවලියේ දක්ෂතම පරාජිත ක්‍රීඩකයාට හිමි කුසලානය කි.ග්‍රෑ 48ට අඩු බර පංතියෙන් තරඟ වැදුනු 15 ශ්‍රීලකාභ සෙ/163779 බොම් ජයවර්ධන එම්එම්එල්පී විසින් ද දිනාගනු ලැබූහ.





තවද, යුද්ධ හමුදා කාන්තා කණ්ඩායමේ ක්‍රීඩිකාවන් රන් පදක්කම් 03ද, රිදී පදක්කම් 05ක් සහ ලෝකඩ පදක්කම් 03ක්ද හිමිකර ගනිමින් තරඟාවලියේ කැපී පෙනෙන දස්කම් දන්වා සමස්ථ පදක්කම් සටහනේ දෙවන ස්ථානය හිමිකර ගනිමින් යුද්ධ හමුදාවට මහත් කීර්තියක් අත්කර දීමට සමත්විය. කි.ග්‍රෑ 52ට අඩු බර පංතියෙන් තරඟ වැදුනු 3 (සෙව්) ශ්‍රීලයුකාබ ඒකකයට අයත් සෙ/ආර්102939 සැරයන් ප්‍රියදර්ශනී එස්එච් දක්ෂතම ක්‍රීඩිකාව සඳහා හිමි සම්මානය දිනා ගනු ලැබුවාය. යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කමිටුවෙහි සභාපති මේජර් ජෙනරාල් ඒකේ රාජපක්ෂ ආර්එස්පි කටයුතු කරනු ලබන අතර, ඔහුගේ පූර්ණ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර සංචිතය ක්‍රියාත්මක වේ.

SOCIALLY • ENVIRONMENTALLY • ETHICALLY

# වැඩසටහනට රණවිරු සහාය

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" තේමා කොට රජය විසින් ක්‍රියාවට නංවනු ලබන "CLEAN SRI LANKA" වැඩසටහනට සමගාමීව අභිමංසල 2 සුවතා නිකේතනයේ රාජකාරි නියුතු කාර්ය මණ්ඩලය හා නේවාසික පුනරුත්ථාපනලාභීහු 2025 ජනවාරි මස 21 වන දින ශ්‍රමදානයක් පවත්වනු ලැබූහ. එහිදී, අභිමංසල පිවිසුම් මාර්ගය වන විල්පිට වත්ත මාර්ගයේ පවිත්‍රතා වැඩසටහනක් පවත්වන ලද අතර, එම වැඩසටහන් සඳහා එම නිකේතනයේ සේනාවිධායක ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්, සෙසුනිලයින්, නේවාසික පුනරුත්ථාපනලාභීන් සහ සිවිල් සේවක මහතුන් රැසක් සහභාගි වූහ.





# රණවිරුවා





**අධීක්ෂණය**

මේජර් ජෙනරාල් ඒඑම්ජේආර්එස් මැදගොඩ
ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එම්අයිඑස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහාය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ හවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# සැඟවුණු වෙඩික්කරු පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්





දියතලාව, ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේදී පැවති සැඟවුණු වෙඩික්කරු පුහුණු පාඨමාලා - අංක 22 හි නිල ලාංඡන පැළඳවීමේ සහ විසිරයෑමේ පෙළපාලිය 2025 ජනවාරි මස 25 වන දින මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති  මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

එහිදී, මෙරට නිලධාරීන් 5 දෙනෙක් හා සෙසුනිලයන් 11 දෙනෙක්, ඉන්දියානු යුද්ධ හමුදාව සහ මාලදිවයින් ජාතික ආරක්ෂක බලකාය නියෝජනය කරන සෙසුනිලයන් 6 දෙනෙක් මෙම පාඨමාලාව සඳහා සහභාගි වී සැඟවුණු වෙඩික්කරුවන් ලෙස සුදුසුකම් ලැබූහ. ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්පී මුනිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් 2025 ජනවාරි මස 26 වන දින මෙම පාඨමාලාවේ සමාප්ති දේශනය පවත්වන ලදී.








# රණබිම මැද
# දින ගැන ගැන සෙවූ නිදහස...

යුද්දෙ කාලෙ උතුරේ සටන් ඇවිලෙද්දී දකුණේ මුළු රටම දෑස් දල්වාගෙන බලාගෙන හිටියෙ කවදා මේ ත්‍රස්තවාදී පිළිලය රටෙන් තුරන් වේවිද කියලයි. දවසෙ වැඩි හරියක් රූපවාහිනිය, ගුවන් විදුලිය වටා ජනතාව රොක් උනේ ඒ දවස එනකල් හීන මවමින්. ත්‍රස්තවාදීන් සතුව පැවති භූමිය ටිකෙන් ටික කුඩා වෙද්දී අවසන් විජයග්‍රහණයට ඔවුන් දින ගැන්නා.

දකුණේ සිවිල් සමාජය තුළ වගේම යුද බිමේ රණවිරුවා අතරත් මේ සටනෙ නිමාවක් දකින්න තිබුනෙ පුදුම නොඉවසිල්ලක්. විශේෂයෙන්ම අවසන් මානුෂීය මෙහෙයුමේ අවසානයට ළංවෙද්දී සටනෙහි නිරත හැම කෙනෙකුටම අලුත් බලාපොරොත්තුවක් මෝදු වෙමින් තිබුනා. ඒ මේ රට නිදහස් වෙන දවස වැඩි ඈතක නොවන බව. රණවිරුවො කොයි පැත්තෙන් සටනට බැස්සත් ළඟදීම දවසක ඔවුන් එකිනෙකා නිසැකවම මුනගැහෙන බව දැනගෙන හිටියා. දවසින් දවස අඩියෙන් අඩිය මව්භූමිය මුදාගනිද්දී එක කොඩියක සෙවණ මුළු රටටම වැටෙන බවත් ඔවුන් දැන හිටියා. අවසන් මෙහෙයුමේ ඉදිරි සටන් පෙරමුණේ සිටි මේ සෙබළාගෙන් අරුත් ගැන්වෙනුයේ දින ගැන ගැන රට වෙනුවෙන් සෙවූ ඒ නිදහස නොවන්නේ ද?